ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

වාර්ෂික වාර්තාව
සහ
ගිණුම් ප්‍රකාශය
2022

2022 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දක්වා

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
පානඵව. පාදුක්ක.

ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
කොළඹ.

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2022 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ලේඛන ඇතුළත් සංස්ථාවේ වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

1. 2022 ජනවාරි මස 01 වන දින සිට 2022 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ඉටුකළ කාර්යයන් පිළිබඳ පාලන වාර්තාව.
2. 2022 ජනවාරි මස 01 දින සිට 2022 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ ගිණුම් සම්බන්ධ වාර්තාව
3. 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අවසන් ගිණුම් සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව
4. 2022 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාව ඉදිරිපත් කළ පරිකථනය

මෙයට,
විශ්වාසී,

සභාපති,
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව,
කොළඹ 07.

පටුන

		පිටු අංකය
1.	පාලන වාර්තාව	01
2.	වාර්ෂික ගිණුම් ප්‍රකාශණය	17
3.	මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව	47
4.	2022 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය	73

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

දැක්ම

ප්‍රමුඛ ශ්‍රී ලාංකික ගුවන්විදුලි සන්නිවේදකයා වීම.

මෙහෙවර

ශ්‍රී ලාංකීය ජනකොට්ඨාශයන්හි අවශ්‍යතා පෝෂණය කිරීම, ශක්තිමත් කිරීම හා ජාතිකත්වය ගොඩනැංවීම උදෙසා ඉටුකරනු ලැබූ විශිෂ්ට කාර්යභාරය අනාගතයේදී ද ඉටුකරමින් සෑම ජන කොට්ඨාශයකගේම ආර්ථික, සමාජීය, දේශපාලනික, අධ්‍යාපනික, සංස්කෘතික හා සදාචාරාත්මක තත්ත්වයන් උසස් මට්ටමකින් පවත්වාගනිමින් රටෙත්, පොදු මහජනතාවගෙත් සෞභාග්‍ය වෙනුවෙන් වූ රජයේ කාර්යභාරය ඉටුකිරීමට සියලු ජන කොටස්වල සන්නිවේදන අවශ්‍යතාවය හා ජීවන තත්ත්වය උසස් කරනු පිණිස දැනුම, ආකල්ප, කුසලතා පෝෂණය කරන සන්නිවේදන මෙහෙවර ක්‍රියාත්මක කිරීම.

අරමුණු

කෙටි කාලීන අරමුණු

- නිරවද්‍ය තොරතුරු වගකීමෙන් හා වගවීමෙන් යුතුව කඩිනමින් ලබාදීම හා තත්කාලීන තොරතුරුවලින් ග්‍රාහක ප්‍රජාව යාවත්කාලීන කිරීම.
- සංස්කෘතික අනන්‍යතාවයන් සුරක්ෂිත කරමින්, ජාතික අභිවෘද්ධිය උදෙසා නව නිර්මාණාත්මක පැතිකඩ සොයා යමින්, උසස් රසවින්දනයක් ග්‍රාහක ප්‍රජාවට සන්නිවේදනය කිරීම සඳහා සුභාවිත ගීතය, කාලීන වැඩසටහන්, ශාස්ත්‍රීය සාකච්ඡා, සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම.
- සන්නිවේදනයෙහි තාක්ෂණික අවකාශය පුළුල්වීමත් සමඟ මූල්‍ය ප්‍රතිලාභ පෙරදැරි වූ ව්‍යාපාරයක් බවට සන්නිවේදන කර්මාන්තය පත්වීම හේතුවෙන් සුරක්ෂිත වියයුතු මාධ්‍ය ආචාර ධර්ම පද්ධතියකට අනුකූලව කටයුතු කිරීම මෙන්ම, මාධ්‍ය සම්ප්‍රදාය හා ආචාර ධර්ම ආරක්ෂා කරන පුරෝගාමී සන්නිවේදන ආයතනය ලෙස කටයුතු කිරීම.
- සන්නිවේදන කුසලතාවයන්ගේ පිරිපුන් ආයතනයක් ලෙස යහපත් මූල්‍ය හා මානව සම්පත් කළමනාකරණ ක්‍රියාවලියක් පවත්වාගෙන යාම.
- ශ්‍රී ලාංකීය ජන ප්‍රජාවන්ගේ අනන්‍යතාවයන්ට අයත් වාර්ගික, ආගමික, සංස්කෘතික යන අනන්‍යතාවයන් නිවැරදිව සහ පැහැදිලිව හඳුනාගනිමින්, එකී අනන්‍යතාවයන් සඳහා සමානාත්මතාවයෙන් ආමන්ත්‍රණය කරන ගුවන්විදුලි නාලිකා ජාලයක් පවත්වාගෙන යන ආයතනයක් ලෙස කටයුතු කිරීම.

දිගුකාලීන අරමුණු

- මහජන සන්නිවේදන කාර්යය ඉටුකිරීම සඳහා ව්‍යවස්ථාපිත කරන ලද සන්නිවේදන ආයතනය ලෙස රාජ්‍ය ප්‍රතිපත්ති, සංවර්ධන වැඩසටහන්, රජයේ අරමුණු, ඉලක්ක හා සැලසුම් පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා වන නිර්මාණාත්මක සන්නිවේදන දායකත්වයක් සැපයීම.
- සේවක අභිප්‍රේරණය ප්‍රමුඛ කොට ගනිමින් දැනුම, ආකල්ප සහ කුසලතාවයන්ගෙන් පිරිපුන් කාර්ය මණ්ඩලයක් පවත්වා ගනිමින්, මතු පරපුර උදෙසා සමබර පෞර්ෂයකින් හෙබි සන්නිවේදන පරපුරක් බිහිකිරීම උදෙසා අති නවීන සන්නිවේදන පහසුකම්වලින් හා ප්‍රායෝගික පුහුණු ක්‍රියාකාරකම්වලින් පෝෂණය වූ අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතනයක් ලෙස කටයුතු කිරීම.
- ව්‍යවස්ථාපිත හා ආයතනික අරමුණුවලට අනුකූලව ජාතික සන්නිවේදන අභිලාශයන් තහවුරු කරමින්, තරඟකාරී වාණිජ සන්නිවේදන වෙළඳපොල උපායමාර්ගිකව ජයගැනීමට කටයුතු කිරීම.
- විකාශන පද්ධතිය අතිනවීන තාක්ෂණය නිසි පරිදි උපයෝගී කරගෙන සමකාලීන සමාජ තත්ත්වයන් සැලකිල්ලට ගනිමින්, යාවත්කාලීන කරමින්, දේශීය මෙන්ම විදේශීය ශ්‍රාවක ප්‍රජාවට පැහැදිලි හා නිරවුල් ශ්‍රවණ තත්ත්වයක් ලබාදීමට කටයුතු කිරීම.
- මූලික අවශ්‍යතාවයන්ගෙන් ස්වයංපෝෂිත වූ සෞභාග්‍යවත් ජනතාවක් ජීවත්වන රටක් ලෙස, ශ්‍රී ලාංකීය අභිමානය ඉහළට ඔසවා තැබීමේ ක්‍රියාවලියේ ප්‍රමුඛතම සන්නිවේදකයා වීම.

පාලන වාර්තාව 2022

පාලන වාර්තාව - 2022

හැඳින්වීම

විද්‍යුත් මාධ්‍ය ක්ෂේත්‍රයේ පුරෝගාමී මාධ්‍ය ආයතනය වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව, දෙපාර්තමේන්තුවක් ලෙස 1925 දෙසැම්බර් මස 16 දින ආරම්භ කර අනතුරුව 1966 අංක 37 දරන පාර්ලිමේන්තු පනත යටතේ 1967 ජනවාරි මස 05 වන දින සංස්ථාවක් ලෙස ස්ථාපිත කර ඇත.

2022 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා වූ මාස 12 ක කාල පරිච්ඡේදය මෙම වාර්තාවෙන් ආවරණය වේ.

සමාලෝචනයට ලක්වන කාල පරිච්ඡේදය තුළ ආයතනයේ කළමනාකාරීත්වය

නම	තනතුර	පත්කළ දිනය
හඬිසන් සමරසිංහ මහතා	සභාපති	2021.06.25 දින සිට 2022.12.31 දින දක්වා
විශ්‍රාමික ජ්‍යෙෂ්ඨ මහාචාර්ය සුනන්ද මද්දුම බණ්ඩාර මහතා	සාමාජික	2022.01.07 දින සිට 2022.06.13 දින දක්වා
ආචාර්ය කේ.ඒ.සී. සිල්වා මහතා	සාමාජික	2022.02.07 දින සිට 2022.06.13 දින දක්වා
එම්.ඒ.සී. සිසිර කුමාර මහතා	සාමාජික	2020.01.29 දින සිට 2022.12.31 දින දක්වා
ඩබ්.පී. සෙව්වන්දි මිය	අමාත්‍යාංශ නියෝජිත	2021.01.22 දින සිට 2022.06.28 දින දක්වා
ඩී.සී.ඩබ්. හපුගොඩ මිය	භාණ්ඩාගාර නියෝජිත	2022.11.22 දින සිට 2022.12.31 දින දක්වා
ගීතා විමලවීර මෙනවිය	භාණ්ඩාගාර නියෝජිත	2022.03.12 දින සිට 2022.11.22 දින දක්වා
ජ්‍යෙෂ්ඨ මහචාර්ය පූජ්‍ය මාගම්මන පඤ්ඤානන්ද ස්වාමීන් වහන්සේ	සාමාජික	2022.06.13 දින සිට 2022.12.31 දින දක්වා
ජේ. යෝගරාජ් මහතා	සාමාජික	2022.06.13 දින සිට 2022.12.31 දින දක්වා
ප්‍රියන්ත කේ. රත්නායක මහතා	සාමාජික	2022.06.13 දින සිට 2022.12.31 දින දක්වා
දුනිල් හෙයියන්තුඩුව මහතා	අමාත්‍යාංශ නියෝජිත	2022.06.28 දින සිට 2022.12.31 දින දක්වා

- 2022 - 06 -30 දින සිට සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් වශයෙන් එන්.අයි.ඒ. නලින් කුමාර නිශ්ශංක මහතා කටයුතු කරනු ලබයි.
- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව සඳහා 2019. 06. 17 දිනැති සේවක සංයුතිය අනුව නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 06 ක්, අධ්‍යක්ෂ තනතුරු 09 ක් සහ අධ්‍යක්ෂ (කොන්ත්‍රාත්) තනතුරු 01 ක් අනුමත වී ඇත.

➢ ගුවන්විදුලි සංස්ථා ධුරාවලිය අනුව දැනට රාජකාරියේ නියුතු නිලධාරීන්

- නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (වැඩසටහන්) - මයුරි අබේසිංහ මිය
- අධ්‍යක්ෂ (දෙමළ සේවා) - ආර්. කනපතිපිල්ලේ මහතා
- අධ්‍යක්ෂ (සිංහල සේවා) - එම්. අයි. අශෝක ජයරත්න මහතා
- අධ්‍යක්ෂ (මුදල්) - එම්. එච්. එල්. ආර්. හෙට්ටිගේ මහතා
- අධ්‍යක්ෂ (පාලන හා මානව සම්පත්) - එම්. එච්. ඒ. එම්. පත්මසිරි මහතා
- අධ්‍යක්ෂ (පුහුණු. වි.සම්. හා ශ්‍රවණ පර්යේෂණ) - ඩබ්. එම්. එන්. එල්. වික්‍රමරාජ මිය
- අධ්‍යක්ෂ (අලෙවි) - කේ. එල්. සී. හරේන්ද්‍ර මහතා
- අධ්‍යක්ෂ (ඉංජිනේරු) - එම්. ජී. ඩබ්. ප්‍රියදර්ශන මහතා

- ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව -

ශ්‍රී ලාංකික මාධ්‍ය ක්ෂේත්‍රයේ වසර 97 ක කාලයක් ඉටුකළ මාධ්‍ය මෙහෙවර තුලින් අප සමාජයේ ජන මනස පෝෂණය කර එය යහපත් ලෙස ගොඩනැගීම සඳහා ශ්‍රී ලාංකීය ගුවන්විදුලිය අමිල මෙහෙවරක් එදා මෙදා තුර ඉටුකර ඇත. එය 1924 වර්ෂයේ ආරම්භ කර, 1925 දෙසැම්බර් 16 නිල වශයෙන් ගුවන්විදුලි ආයතනයක් ලෙස ස්ථාපනය කරන ලදී. මහා බ්‍රිතාන්‍යයේ BBC ගුවන්විදුලිය ආරම්භයෙන් වසර 03 ක් වැනි කෙටි කාලයක් ඇතුළත පෙරදිග ආරම්භ කළ ප්‍රථම ගුවන්විදුලිය වන්නේ ජාතික ගුවන්විදුලියයි.

1948.-10.-05 වන දින රාජ්‍ය දෙපාර්තමේන්තුවක් ලෙසද 1950-.09.-30 දින සිංහල වෙළඳ සේවය හා ඉංග්‍රීසි වෙළඳ සේවය ද 1951.04.01 දින දෙමළ වෙළඳ සේවය ද 1951-03-30 දින සමස්ථ ආසියා හින්දි සේවයද 1959.08.15 දින මුස්ලිම් සේවයද 1963.04.04 දින සන්ධ්‍යා සේවයද ආරම්භ කරමින් ආසියාවේ රිදී සීනුව ලෙස කටයුතු කරන ලදී. 1966 අංක 37 දරන පාර්ලිමේන්තු පනත මගින් 1967.01.05 දින සිට රාජ්‍ය සංස්ථාවක් වශයෙන් ක්‍රියාත්මක වූ අතර, 1972.05.22 දින සිට ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ලෙස හැඳින්වීම ආරම්භ කරන ලදී.

රටක ප්‍රාදේශීය අනන්‍යතාවයක් හඳුනාගනිමින් එයට ගෞරවයක් ලබාදෙමින් ප්‍රාදේශීය ගුවන්විදුලි සේවා සංකල්පය අනුව කටයුතු කරමින් මුල්ම ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකාව ලෙස 1979.04.12 වන දින රජරට සේවය ද, දෙවන ප්‍රාදේශීය ගුවන්විදුලි නාලිකාව ලෙස 1980.02.03 වන දින රුහුණු සේවය ද, 1983.04.13 වන දින තෙවන ප්‍රාදේශීය සේවාව ලෙස මහනුවර සේවයද ආරම්භ කර වර්තමානය වන විට ප්‍රාදේශීය සේවා 07 ක් සහ ජාතික මට්ටමේ සේවා 06 ක් සහිත පළල් සන්නිවේදන ජාලයක් ලෙස සිය අභිප්‍රායන් විශිෂ්ට ලෙස සාධනය කර ඇත.

කෙටි හා මධ්‍යම තරංග තාක්ෂණයෙන් ඔබ්බට යමින් එවකට ලොව පුරා ක්‍රියාත්මක වූ රේඩියෝ තාක්ෂණයේ නව ප්‍රවණතාවයක් වූ එෆ්.එම්. තාක්ෂණය ඔස්සේ ශ්‍රී ලාංකීය මුල්ම ගුවන්විදුලි නාලිකාව ලෙස සිටි.එෆ්.එම්. සේවය 1989.12.12 වන දින ආරම්භ කෙරිණි.

2020 වර්ෂය ලෝක ජන සමාජය තුළ ඇති වූ කොරෝනා උවදුර අති බිහිසුණුකාරී තත්ත්වය ශ්‍රී ලංකාවට ද ඒ අයුරින්ම බලපෑ අතර, 2022 වර්ෂය වන විට එම තත්ත්වය යම් දුරකට පහව ගොස් රට යථා තත්ත්වයට පත්වෙමින් පැවති අතර, ගුවන්විදුලිය කෙසේ හෝ යලි ජන සමාජය යාවත්කාලීන කරමින්, සිය සන්නිවේදන අවශ්‍යතා සපුරාලමින් පුළුල් මහජන සේවයක් ඉටුකරමින්, අති දුෂ්කර කාලයක් පසුකරමින් එකඳු නාලිකාවක්වත් අතරමඟ නතර නොකරමින් සිය සේවාව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

සිංහල ස්වදේශීය සේවය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ආරම්භක සිංහල ගුවන්විදුලි නාලිකා අතුරින් සිංහල ස්වදේශීය සේවය ජාතික වගකීමෙන් යුතුය විශ්වසනීය හා ගුණාත්මක තොරතුරු ශ්‍රාවකයා වෙත ලබාදෙමින්, යහපත් සමාජයකට අවශ්‍ය තොරතුරු, දැනුම, පරිකල්පනය හා උසස් රසවින්දනයක් ලබාදෙමින් 2022 වර්ෂය තුළද සිය සුපුරුදු වගකීම මැනෙවින් ඉටුකර ඇත.

2022 මාර්තු මස 08 වෙනි දිනට යෙදී තිබූ ජාත්‍යන්තර කාන්තා දිනය තේමා කොට රට පුරා විසිරී සිටින කාන්තා ක්‍රියාකාරීනියන් අතරින් 200 ක පමණ පිරිසකගේ සහභාගීත්වයෙන් කාන්තා දින උත්සවය ආනන්ද සමරකෝන් මැදිරියේදී පැවැත්වුනි. මේ සඳහා සේවාදායක අනුග්‍රාහකත්වයක් ද ලබා ගැනීමට හැකි විය.

සිංහල හා දෙමළ අලුත් අවුරුද්ද වෙනුවෙන් රටවටා අවුරුදු විචිත්‍රාංගය මෙවරද පවත්වන ලදී. රට තුළ උද්ගතව තිබෙන ආර්ථික අර්බුදය, අරගලකාරී වාතාවරණය ආදී හේතු මත වෙනදාමෙන් සියලුම ප්‍රාදේශීය සේවා ඒකාබද්ධව රට වටා අවුරුදු විචිත්‍රාංගය ඉදිරිපත් කිරීමට නොහැකි වූවත් දශක 04 කට වැඩි කාලයක් ජාතික ගුවන්විදුලිය ඉදිරිපත් කළ රටවටා අවුරුදු විචිත්‍රාංගය නැකැත් චාරිත්‍රය සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් ප්‍රචාරය කිරීම විශේෂත්වයකි.

ඔක්තෝබර් 01 වෙනිදාට යෙදෙන ලෝක ළමා දින සැමරුමද ජාතික ගුවන්විදුලියේ ස්වදේශීය සේවයේ විදුල ළමා ගුවන්විදුලියේ සහභාගීත්වයෙන් සංවිධානය කරන ලදී. එහිදී අඩු ආදායම්ලාභී පවුල්වල දරුවන්ට පාසල් උපකරණ, අභ්‍යාස පොත් ලබාදීම සහ අඩු ආදයම්ලාභී පවුල්වල වැඩිහිටි ප්‍රජාව වෙනුවෙන් සමාජ සත්කාර වැඩසටහනක් ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන් නුවරඑළිය, සීතාඑළිය, ශ්‍රී බෝධිරුක්ඛාරම විහාරස්ථානය කේන්ද්‍රගත කරමින් ක්‍රියාත්මක වූයේ ය.

ජාතික ගුවන්විදුලයේ සිංහල ස්වදේශීය සේවයේ ළමා පිටිය ඇතුළු ළමා වැඩසටහන් සඳහා සහභාගීවන ළමා ශිල්පීන් අවසන්වරට තෝරාගෙන ඇත්තේ 2018 වසරේදී ය. 2023 වර්ෂයට ළමා ශිල්පීන් අලුතින් බඳවා ගැනීම සඳහා කටයුතු සම්පාදනය කරන ලදී. මෙම වසරේ ජනවාරි මාසයේ ඊට අයදුම්පත් කැඳවන ලද අතර, මාර්තු මාසයේ සිට හඬ පරීක්ෂණය පැවැත්විය. වයස අවුරුදු 9ට වැඩි සහ වයස අවුරුදු 18 ට අඩු දරුවන්ගෙන් අයදුම්පත් කැඳවන ලද අතර, අයදුම්පත් 5000කට ආසන්න ප්‍රමාණයක් ලැබී තිබුණි. මින් අවුරුදු 16 ත්, 18 ත් වයස් ඛාණ්ඩයට අයත් දරුවන් සඳහා පළමුවෙන් හඬ පරීක්ෂණ පැවැත්වූ අතර, මෙම වයස් කාණ්ඩයට අදාළ ළමා ශිල්පීන් 50 දෙනෙක් ළමා ශීල්පීන් ලෙස තෝරාගන්නා ලදී.

රටවටා නත්තල් විචිත්‍රාංගයද විචිත්‍රවත් ලෙස ඉදිරිපත් කරන ලදී. ඒ සඳහා කතෝලික සහ ක්‍රිස්තියානි දේවස්ථාන සම්බන්ධ කරගන්නා ලද අතර, මෙම වසරේ රටවටා නත්තල් ඇතුළු නත්තල වෙනුවෙන් ඉදිරිපත් කරන ලද සියලුම වැඩසටහන් ‘‘නත්තල අරුත් ගන්වමු - සැවොම එක්ව නැගිටිමු’’ යන තේමාව යටතේ ඉදිරිපත් කරන ලදී. ඊට සේවා දායක අනුග්‍රාහකත්වයක්ද ලබාගැනීමට කටයුතු කෙරිනි.

රට තුළ උද්ගත වූ නොසන්සුන්කාරී වාතාවරණය, ඉන්ධන අර්බුදය, ආර්ථික අභියෝග ආදී වශයෙන් වූ සියලු සෘණාත්මක ප්‍රවණතා හමුවේ වුවද, ජාතික නාලිකාව සිංහල ස්වදේශීය සේවය සේවය කිසිඳු බාධාවකින් සහ බිඳවැටීමකින් තොරව අඛණ්ඩවම ශ්‍රාහක අභිලාෂයන්ට උපරිම සාධාරණ ඉෂ්ඨ කිරීමට කටයුතු කළේය. අභියෝගාත්මක 2022 වර්ෂය, සිංහල ස්වදේශීය සේවය මහජන සේවා සන්නිවේදන අවශ්‍යතාවයට වඩාත් හොඳින් තහවුරු කරන ලද වර්ෂයක් ලෙස සළකා සිය ක්‍රියාකාරකම් ඉටුකිරීමට කටයුතු කර ඇත.

අධ්‍යාපන සේවයේ වැඩසටහන්ද ස්වදේශීය සේවය ඔස්සේ ප්‍රචාරය කර ඇත.

සිංහල වෙළඳ සේවය

වාණිජ සන්නිවේදනයේ ප්‍රමුඛයා ලෙස ගුවන්විදුලි සංස්ථාවේ සිංහල වෙළඳ සේවය 1950.09.30 දින සිට වෙළඳපොළ අරමුණු ජය ගනිමින් වැඩසටහන් ඉදිරිපත් කිරීමෙන් ද ශ්‍රාවක උත්තම රස ජනනය සඳහා වන නිර්මාණාත්මක වැඩසටහන් හා ජනප්‍රිය සුභාවිත ගීත ප්‍රචාරය කරමින් පොදු ශ්‍රාවක විශ්වාසයක්, ගෞරවයක්, ආදරයක් අඛණ්ඩව දිනාගනිමින් ක්‍රියාත්මක නාලිකාවයි.

මහජනතාවට වඩාත් සමීපතම නාලිකාවක් වන වෙළඳ සේවය එදිනෙදා සමාජයේ කාලීන හා ප්‍රවෘත්තියම වටිනාකමකින් යුතු සිදුවීම් පිළිබඳ දැනුවත් කෙරෙමින් ඉදිරිපත් කරන වැඩසටහන් මහජන සන්නිවේදන ක්‍රියාවලිය මැනවින් ඉටුකිරීමට සමත්ව ඇත.

ශ්‍රී ලාංකීය ජන සමාජය තුළ සිංහල පාඨක සමාජය මැද මාවතේ ආකර්ශනයට ලක්කරමින් පවත්වාගෙන යනු ලබන ප්‍රශස්ත ගුවන්විදුලි නාලිකාවක් ලෙස සිංහල වෙළඳ සේවය ජනාදරයට පත්ව ඇත.

දෙමළ ස්වදේශීය සේවය/තෙන්ඩ්‍රල් සේවය

2022 වර්ෂයේ දෙමළ අංශය මගින් විවිධ වැඩසටහන් රාශියක් නිෂ්පාදනය කර ප්‍රචාරය කර ඇත. ඒවා අතර තෛපොන්ගල් දිනය නිමිති කරගත් වැඩසටහන් 2022.01.14 දින ප්‍රචාරය කළ අතර, කාන්තා දිනය නිමිත්තෙන් 2022.03.08 දින විශේෂ වැඩසටහනක් ප්‍රචාරය කර ඇත.

හින්දු සංස්කෘතික අමාත්‍යාංශය මූලිකත්වයෙන් ලංකාව පුරා ඇති කෝවිල් මගින් වැඩසටහන් නිෂ්පාදනය කර ප්‍රචාරය කර ඇත. සිංහල හා දෙමළ අලුත් අවුරුදු නිමිති කරගෙන රටවටා අවුරුදු විචිත්‍රාංගය ප්‍රචාරය කර ඇත.

වෙසක් පොහොය නිමිතිකර ගෙන බෞද්ධ ගීත, වෙසක් වැඩසටහන් නිෂ්පාදනය කර ඇති අතර, 2022 වර්ෂය තුළ නවක නිවේදක නිවේදිකාවන් 15 දෙනෙකු (සහන) බඳවා ගැනීමට කටයුතු කර ඇති මයුර ගීතාංගල් වැඩසටහන තුලින් මාධ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් දෙදෙනෙකුට හා අසන්නන් 05 දෙනෙකුට සම්මාන ප්‍රදානයක් කර ඇත.

ඊට අමතරව නත්තල් වැඩසටහනක් නිෂ්පාදනය කර ප්‍රචාරය කර ඇති අතර, අභියෝගතා රැසක් මධ්‍යයේ වුවද දෙමළ නාලිකාව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

ඉංග්‍රීසි සේවය

ශ්‍රී ලංකාව තුළ ගුවන්විදුලිය ආරම්භවීමත් සමඟම විකාශන කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් ආරම්භ වූ අතර, ජාතික නාලිකා ආරම්භ කිරීම සඳහා සැලසුම් සකස් කිරීම හා එහි පළමු පියවර ලෙස 1950 සැප්තැම්බර් මස 30 වන දින සිට ඉංග්‍රීසි වෙළඳ සේවය ආරම්භ විය. අනතුරුව ඉතා කෙටි කලක් තුළ සිංහල හා අනෙකුත් භාෂාවලින් ද ජාතික නාලිකා ආරම්භ විය. 2009 වසරේ සිට රේඩියෝ ශ්‍රී ලංකා නමින් ඉංග්‍රීසි සේවය ක්‍රියාත්මක වේ.

සංගීත නාලිකා යන සංකල්පයෙන් වගකීමෙන් ගොස් රේඩියෝ නාලිකාවක් ලෙස වර්තමානයේද කටයුතු කරන රේඩියෝ ශ්‍රී ලංකා නාලිකාව 2022 වර්ෂය තුළ ද, ආගමික, සංස්කෘතික, සමාජයීය, ආර්ථික, රසවින්දනාත්මක හා කාලීන වැදගත්කමින් යුත් වැඩසටහන් රාශියක් නිර්මාණය කර විකාශනය කරනු ලබයි. Good Morning Sri Lanka, Views on Health වැඩසටහන් කාලීන තොරතුරු හා සෞඛ්‍ය ගැටළු පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා උපයෝගී කරගෙන ඇති අතර, Altima Music, Concert Hall, Country Songs, වැනි වැඩසටහන්, ශ්‍රාවකයාගේ රසවින්දනය වැඩිදියුණු කිරීම වෙනුවෙන් වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

රේඩියෝ ශ්‍රී ලංකා නාලිකාව ඔස්සේ ප්‍රචාරය වූ කාලීන වැදගත්කමක් සහිත සියලුම වැඩසටහන් සංරක්ෂණය කර ඇති අතර එම වැඩසටහන් රේඩියෝ ශ්‍රී ලංකා යූ ටියුබ් නාලිකාව ඔස්සේ ශ්‍රවණය කිරීමට ද අවස්ථාව සලසා දී ඇත.

FM 97.4 / 97.6 සංඛ්‍යාත ඔස්සේ විසුරුවා හැරෙන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ඉංග්‍රීසි සේවය, දිනපතා අළුයම 05.00 ට ආරම්භ වී රාත්‍රී 10.00 පමණ විකාශය අවසන් කරයි.

සිටි.එෆ්.එම්. සේවය

දැනුම තොරතුරු හා ඉහළ රසවින්දනයක් ශ්‍රාවක ප්‍රේක්ෂක ප්‍රජාව වෙත තිලිණ කරමින් තරඟකාරී ගුවන්විදුලි නාලිකා අතර, ගුණාත්මක බවින් යුක්තව ඉහළ අලෙවි ඉලක්කයක් කරා යමින් මුදල් උපයමින් ජනප්‍රිය ගුවන්විදුලි නාලිකාවක් බවට පත්වීමේ අරමුණින් 2022 වර්ෂයේ සිටි.එෆ්.එම්. වැඩසටහන් ප්‍රචාරය කරන ලදී.

ඒ අනුව, 2022 වර්ෂයට යෙදුනු ගුවන්විදුලි සංස්ථා 96 වැනි සංවත්සරය නිමිත්තෙන් 2022 ජනවාරි 01,02,03,04 සහ 05 දිනවලදී ගුවන්විදුලි ගී නිර්මාණ පැයෙන් පැයට ප්‍රචාරය කරන ලදී.

74 වෙනි ජාතික නිදහස් උළෙල දින සන්ධ්‍යාවේ සිටි.එෆ්.එම්. සේවය මගින් ආකේඩ් පරිශ්‍රයේදී වෙළඳ අනුග්‍රහය සහිතව ‘‘ශ්‍රී ජය ශ්‍රී ලංකා නිදහස් ගී මියැසිය’’ ඉදිරිපත් කරන ලදී. මෙම ප්‍රසංගයට ත්‍රිවිධ හමුදා, පොලිස් සහ ගුවන්විදුලි ගායක කණ්ඩායම් ජනප්‍රිය නිදහස් ගී සජීවීව ගායනා කළ අතර, ජනප්‍රිය ගායික ගායිකාවන්ද ගීත ගායනා කරන ලදී. මෙම ප්‍රසංගය නැරඹීමට අති විශාල ප්‍රේක්ෂක පිරිසක් පැමිණීම විශේෂත්වයක් විය.

මාර්තු මස 10 වෙනි දින ආනන්ද සමරකෝන් මැදිරියේදී සිටි.එෆ්.එම්. ‘‘සඳ සිළුමිණ’’ වැඩසටහන පවත්වන ලදී. ගී රස විඳින වැඩසටහනක් වන මෙය පූජ්‍ය ඉඳුරාගාරේ ධම්මරතන ස්වාමීන් වහන්සේ විසින් ඉදිරිපත් කරනු ලැබුණි.

2022 වර්ෂයේ අලුත් අවුරුද්ද නිමිත්තෙන් සිටි.එෆ්.එම්. රේඩියෝ බක්මහ උළෙල නිවේදක නිවේදිකා සහ නිෂ්පාදකවරුන් විසින් ඉදිරිපත් කළ අතර, රාජපුර ආයුර්වේද ආයතනය අනුග්‍රහයෙන් ‘‘මොණරාගල රාජපුර අවුරුදු සිරි’’ විශේෂාංගය අප්‍රේල් 14 වන දින ප්‍රචාරය කරන

ලදී. හිසතෙල් ගෑමේ රාජ්‍ය උත්සවයේ තත්ව විස්තර හිසතෙල් ගෑමේ දිනය යෙදුණු අප්‍රේල් 17 දින සිටි.එෆ්.එම්. සේවය වෙතින් ඉදිරිපත් කරන ලදී.

2022.07.13 දින මහනුවර ශ්‍රී දළදා මාලිගාව හා නාථ දේවාල පරිශ්‍රයේ පැවති සිරි දළදා වංශය ඇසුරින් සර්ව රාත්‍රික බුදු ගුණ දේශනාව වෙළඳ අනුග්‍රහය සහිතව - ප.ව. 05.00 සිට පසු දින අළුයම 07.00 දක්වා සජීවීව පැවැත්වුණි.

ජනප්‍රිය ගායන ශිල්පී එච්. ආර්. ජෝතිපාල මහතාට උපහාර පිදීම සඳහා සිටි.එෆ්.එම්. සේවය ඉදිරිපත් කළ "ජෝති ගී සැදෑව" සිහින අහසේ ප්‍රසංගය දිවයින පුරා විසිරී සිට එච්. ආර්. ජෝතිපාලයන්ගේ ගී ගැයීමට දක්ෂතා දැක්වූ නවක ගායක ගායිකාවන්ගේ සහභාගීත්වයෙන් 2022 අගෝස්තු මස 30 වන දින සංස්ථාවේ ආනන්ද සමරකෝන් මැදිරියේදී පැවැත්වුණි.

එමෙන්ම සංගීත් නිපුන් සනත් නන්දසිරි මහතා වෙනුවෙන් සංවිධානය කළ ආදර සැමරුම් සංගීත ප්‍රසංගයේ 2022 අගෝස්තු 17 වන දින ජනප්‍රිය ගායික ගායිකාවන්ගේ සහභාගීත්වයෙන් සංස්ථා කුමාරතුංග මැදිරියේදී පවත්වන ලදී. සංගීත අංශය හා සිටි.එෆ්.එම්. සේවය එක්ව සංවිධානය කළ ප්‍රවීණ වාද්‍ය ශිල්පී මධුසංක රත්නායකගේ ගී අනුවාදන ඇතුළත් "වැයුම් ගීතාව" ප්‍රසංගය 2022 සැප්තැම්බර් 20 දින සහ බටනලා වාදන ශිල්පී ඉන්දික රජින්තගේ ගී අනුවාදන ඇතුළත් දෙවනි ප්‍රසංගය නොවැම්බර් 01 වන දින ආනන්ද සමරකෝන් මැදැරියේදී පවත්වන ලදී.

සිටි.එෆ්.එම්. සේවයේ 23 වෙනි සංවත්සරය නිමිත්තෙන් දසත විසිරී සිටින සරසවි සිසුන්ගේ ගායන කුසලතා එළිදක්වමින් "සරසවි හඳසර" පළමු ප්‍රාසාංගික ප්‍රසංගය පේරාදෙණිය විශ්ව විද්‍යාලයීය ගෘහස්ථ ක්‍රීඩාගාර ශාලාවේදී පොවැම්බර් 03 වන දින සවස 06.30 ට වෙළඳ අනුග්‍රහය ඇතිව පැවැත්විණි.

මෙම වසරේදී ද කොවිඩ් අවදානම් තත්ත්වය පැවති නිසා එම රෝගය පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් වරින්වර සිටි.එෆ්.එම්. සේවයෙන් ප්‍රචාරය කරන ලදී.

සෑම පොහොය දිනකම දවස පුරා සජීවීව සිටි.එෆ්.එම්. පෝදා සඳහම් සැරිසර සහ සඳ සිළුමිණ, සඳහම් සක්මන, ජාතක කථා, සිත්පින් මළුව ආදී වැඩසටහන් ඉදිරිපත් කරන ලදී.

සිටි.එෆ්.එම්. සේවය ඉදිරිපත් කරන "ඔබ ආයෙමත් ඇවිදින්" සංගීත ප්‍රසංගය සෑම මාසයකදීම වෙළඳ අනුග්‍රහය ඇතිව ගුවන්විදුලි සංස්ථා ආනන්ද සමරකෝන් මැදිරියේදී ඉතා විශාල ශ්‍රාවක ප්‍රේක්ෂක සහභාගීත්වයෙන් ප්‍රචාරය කරන ලදී. එම ප්‍රසංග සඳහා ප්‍රවීණ ගායන ශිල්පී ශිල්පිනියන් වන ෂර්ලි වෛජයන්ත, පුන්සිරි සොයිසා, බණ්ඩාර අතාවුද, බන්ධුල විජේවීර, රෝහණ බැද්දගේ, චන්ද්‍රකුමාර කඳනාරච්චි, මරියසෙල් ගුණතිලක, කලාසූරී ලතා වල්පොල, අනිල් භාරතී සහභාගී වූහ.

බරණැස ඉසිපතන පූජා භූමියේ සිට 2022 නොවැම්බර් 02 වන දින රාත්‍රියේදී බුදුගුණ වන්දනා ධර්ම දේශනාව සිටි.එෆ්.එම්. ඔස්සේ ප. ව. 05.00 සිට පසු දින උදෑසන 07.00 දක්වා ප්‍රචාරය කරන ලදී.

ජනප්‍රිය වේදිකා නාට්‍ය ගී ඇතුළත් ප්‍රසංගය "රැඟුම් ගී" 2022 නොවැම්බර් 30 බදාදා ගුවන්විදුලි සංස්ථා ආනන්ද සමරකෝන් මැදිරියේදී ප්‍රවේශපත්‍ර අලෙවි කර පැවැත්වූ ප්‍රසංගයක් ලෙස ඉදිරිපත් කෙරුණි. මෙම ප්‍රසංගය සඳහා ජනප්‍රිය දක්ෂ නාට්‍ය ශිල්පී ශිල්පිනියන් වන නිශ්ශංක දිද්දෙණිය, රොඩ්නි වර්ණකුල, ප්‍රසන්නජිත් අබේසූරිය, රත්නා ලාලනී ජයකොඩි සහ ෆර්නි රෝෂිණි සහභාගී වූහ.

ඒ අනුව, 2022 වර්ෂය පූරා සිටි.එෆ්.එම්. සේවයෙන් ආගමික, ප්‍රාසාංගික, කාලීන, සංස්කෘතික ආදී සියලුම අංශ ආවරණය වන වැඩසටහන් සහ තාරුණ්‍යය ඉලක්ක කරගත් සංගීත වැඩසටහන්, රාජ්‍ය උත්සව සහ රජයේ සංවර්ධන වැඩසටහන් ප්‍රචාරය කරන ලදී.

ඒ අතර, දෛනිකව විකාශය වන වැඩසටහන් මගින් ද, සමාජ මාධය හරහා ද සිටි එෆ්.එම්. සේවය ඉහළ ශ්‍රාවක ප්‍රතිචාර දිනා ගනිමින් අලෙවි ආදායම් ද වර්ධනය කර ගනිමින් අනාගතය කරා ගමන් කරමින් සිටී.

මුස්ලිම් සේවය

වසර 65 ක කාලයක් මුලුල්ලේ පවත්වාගෙන යනු ලබන මුස්ලිම් සේවය ශ්‍රී ලංකාව පමණක් නොව දකුණු ඉන්දියාව තුළද ප්‍රසිද්ධ නාලිකාවකි. දෙමළ ස්වදේශීය සේවය 102.1 හා 102.3 සංඛ්‍යාතය ඔස්සේ උදෑසන 05.45 සිට රාත්‍රී 10.30 දක්වා හා රාත්‍රී 08.00 සිට 09.00 දක්වා වැඩසටහන් නිෂ්පාදනය කර ප්‍රචාරය කිරීමට කටයුතු කර ඇත. මෙහි ඇති සුවිශේෂී බව වන්නේ මුස්ලිම් සේවය තුළ ප්‍රචාරය වන වැඩසටහන්වලින් 80% ක්ම අනුග්‍රාහක දායකත්වයන් සහිතව ප්‍රචාරය වීමයි. ආගමික, සංස්කෘතික, සංගීත, ව්‍යාපාරික අරමුණු ඉලක්ක කරගත් වැඩසටහන් තරුණ වැඩිමහල් ආදී සියලුම වයස් කාණ්ඩ ආවරණය වන පරිදි,නිෂ්පාදනය කර ප්‍රචාරය කෙරේ.

මුස්ලිම් සේවයේ ප්‍රචාරය කරන ලද වැඩසටහන් අතර, ප්‍රවෘත්ති, ප්‍රවෘත්ති සඟරාමය වැඩසටහන් සාකච්ඡාව, ආගම කියවීම - කුරානය ආදී වැඩසටහන් රාශියක් ප්‍රචාරය කෙරේ. එසේම ඉල්මුල් ඉස්ලාම්, මුස්ලිම් කාන්තා, මුස්ලිම් දවසේ සිතුවිලි සිංහල ස්වදේශීය සේවය ඔස්සේ ප්‍රචාරය කිරීමට කටයුතු කර ඇත.

විශේෂයෙන් සංස්ථා දින, නිදහස් දින, කාන්තා දින පැවරුම් වැඩසටහන්, රාමසාන්, මැයි දින සැමරුම, හජ්ජි උත්සවය ආදී විවිධ දින සැමරුම් වැඩසටහන් නිෂ්පාදනය කර ප්‍රචාරයට කටයුතු යොදා ඇත.

ලෝක ළමා දින සැමරුම, ගුරු දිනය, ලෝක සෞඛ්‍ය දිනය, ලෝක ඒඩ්ස් දිනය 2022 වර්ෂයේ රු. මි. 32 ක ආදායමක් ඉපයීමට මුස්ලිම් සේවයට හැකි වී ඇත.

ප්‍රාදේශීය සේවා

රජරට සේවය

107.3 FM තරංගමාලා ඔස්සේ රජරට සේවය මූලික කරගනිමින් දිස්ත්‍රික්ක 13 පුරා කරගහතැන්න විකාශනාගාරය ඔස්සේ විසුරවා හැරෙන රජරට සේවය 1979.04.12 සිට මේ දක්වා සිය අරමුණු සාර්ථක කර ගැනීමට කටයුතු කර ඇත. 2022 වර්ෂය තුළ රජරට සේවය සිය ප්‍රාදේශීය සහ ජාතික වශයෙන් තමන්වෙත පැවරී ඇති වගකීම මැනවින් හඳුනාගෙන වැඩසටහන් නිෂ්පාදනය කොට ප්‍රචාරයට යොදා ඇත.

පොහෝ දිනයන් මූලික කර ගනිමින් ආගමික වැඩසටහන්, සිංහල හින්දු අලුත් අවුරුදු වැඩසටහන්, නිදහස් දින වැඩසටහන්, වෙසක් පොසොන් වැඩසටහන්, නත්තල් වැඩසටහන් 2022 වර්ෂයේදී ද ඉදිරිපත් කර ඇති අතර, කම්කරු දිනය, මත්ද්‍රව්‍ය නිවාරණ දිනය, කාන්තා දිනය, ලෝක ළමා දිනය ආදී විශේෂ දිනයන් සඳහා ද වැඩසටහන් ඉදිරිපත් කර ඇත.

කඳුරට සේවය

1983.04.13 ආරම්භ කර ඇති ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ කඳුරට සේවය මගින් 2022 වර්ෂය සඳහා ද ආගමික, සංස්කෘතික, ආර්ථික හා සමාජීය වශයෙන් වැඩසටහන් රාශියක් නිර්මාණය කර ඇත. ආදායම් උත්පාදන වැඩසටහන් මාලාවක් නිෂ්පාදනය කර ඇති අතර, අවුරුදු සුභපැතුම්, සඳහම් ප්‍රදීපනී, දායකත්ව දර්ම දේශනා, සැරිසර පුරවර, ඇසළ විසිතුරු, රාමසාන් වැඩසටහන් හා කාලීන වැඩසටහන් ප්‍රචාරය කර ඇත. කොරෝනා වසංගත තත්ත්වය හමුවේ වුවද 2022 වර්ෂයේ දී සියලුම වැඩසටහන් ගුණාත්මක හා අඛන්ඩව පවත්වාගෙන යාමට කඳුරට සේවය සමත්ව තිබේ. ආසිරි රෝහල හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ සේවා දායක අනුග්‍රාහක වැඩසටහන් කිහිපයක් ප්‍රචාරය කර ඇති අතර, දෙමළ භාෂාවෙන් පැය කිහිපයක් වැඩසටහන් ප්‍රචාරය කර ඇත.

මුස්ලිම් වැඩසටහන් සඳහාද කඳුරට සේවා ගුවන්කාලය වෙන් කිරීම 2022 වසරේදී ද සිදුකර තිබේ. කඳුරට සේවයේ මැදිහත් වීමෙන් කොත්මලේ මාධ්‍ය අධ්‍යයන ආයතනය මගින් පුහුණු පාඨමාලා 02 ක් ක්‍රියාත්මක කිරීම 2022 වර්ෂයේදී සිදුකර ඇති විශේෂ ව්‍යාපෘතියක් වේ.

වයඹ රේඩියෝ

වයඹ සේවය 2022 වර්ෂයේ, පෙර වර්ෂවලදී මෙන්ම වසරපුරා විවිධ වැදගත් අවස්ථා ආවරණය වන පරිදි වැඩසටහන් නිර්මාණය කිරීමට කටයුතු කර ඇත.

ආගමික වැඩසටහන් ලෙස සදහම් අසපුව (දිනපතා) සහ සදහම් චාරිකාව (සෑම පොහෝ දිනයකම)

රසවින්දන වැඩසටහන් ලෙස හිතනැවතුන තැන, සළ රූ ගී, සොඳුරු සිතුවිලි, නමක් නැති සවසක්, සම්භාෂණ, කවි මංතලාව දැක්විය හැක.

අරෝග්‍යා, සුව අරණ, කොවිඩ් බූස්ටර් මාත්‍රාව පිළිබඳ දැනුවත් කිරීම් සෞඛය වැඩසටහන් ලෙස දැක්විය හැකි අතර, වයඹ ගෙවත්ත (කාබනික වගාව, ගෙවතු වගාව නව තාක්ෂණික ක්‍රමවේද පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් (සතිපතා) කෘෂිකාර්මික වැඩසටහන් ලෙස විකාශනය වේ.

අධ්‍යාපන වැඩසටහන් ලෙස වයඹ සිප්මංසල -වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සම්පත් දායකත්වයෙන් (දිනපතා) වයඹ දරුවන් 80 දෙනෙකු ළමා ශිල්පීන් ලෙස තෝරා ගනිමින් ගුවන්විදුලි මාධ්‍ය පිළිබඳ ප්‍රායෝගික දැනුම ලබාදීම.

කාලීන සහ සංවර්ධන වැඩසටහන් ලෙස දිනපතා වයඹ ප්‍රවෘත්ති විකාශනය වන අතර, දස දෙසින් හත වැඩසටහන සඳහා දිනපතා වයඹ පළාතේ විවිධ ස්ථානවල සිට සම්බන්ධ වෙමින් විශේෂ අවස්ථා පිළිබඳ දැනපතා වාර්තා සැපයීම

<u>විශේෂ දිනයන් ද මුල්කර ගනිමින්,</u>

නිදහස් සැමරුම - ප්‍රධාන නාලිකා සමඟ ජාතික උත්සවය

කාන්තා දිනය - කුරුණෑගල මහ නගර සභාව සහ මහගම සංස්කෘතික මධ්‍යස්ථානය

අවුරුදු - ප්‍රධාන නාලිකා සමඟ රටවටා අවුරුදු

වෙසක් - සදහම් චාරිකාව

මත් නිවාරණය - මත්ද්‍රව්‍ය භාවිතය හා නීති විරෝධී ප්‍රවාහන වැළැක්වීම පිළිබඳ විශේෂ වැඩසහන

ළමා දිනය - පුත්තලම කරුවලගස්වැව දුටුගැමුණු විද්‍යාලයේ සිට විශේෂ වැඩසටහන

ළමා වැඩසටහන් ලෙස දිනපතා පැයක සජීවී ගුවන්කාලය වයඹ පළාතේ ළමා ශිල්පීන් විසින් ඉදිරිපත් කරන වැඩසටහන, ක්‍රීඩා වැඩසටහන් ලෙස දිනපතා පිට්ටනිය, වෙනත් වැඩසටහන් ලෙස වයඹ ඇකඩමි භාවිතා කරමින් ගුවන්විදුලි සන්නිවේදන සහතික පත්‍ර පාඨමාලාව ක්‍රියාත්මක කිරීම මගින්,

වයඹ පළාතෙන් තෝරා ගැනුන දක්ෂ තරුණ තරුණියන් ස්වේච්ඡා සන්නිවේදක සන්නිවේදිකාවන් ලෙස මෙම සේවාව ඔස්සේ මාධ්‍ය ක්ෂේත්‍රයට එක් කිරීමට දායකව සිටී.

පිරෙයි එෆ්.එම්. සේවය අක්කරෙයිපත්තුව

උදෑසන 10.00 සිට ප.ව. 06.00 දක්වා කාලය තුළ විකාශනය පවත්වාගෙන යනු ලබන පිරෙයි එෆ්.එම්. නාලිකාව, ශ්‍රී ලංකාව තුළ මුස්ලිම් ජනකොට්ඨාශය සඳහා වෙන්වූ එකම නාලිකාව වේ. කොරෝනා වසංගතය අවසන්වීමත් සමඟම උදාවූ 2022 වර්ෂය තුළ අලෙවි ඉලක්ක සපුරා ගැනීම අතිශය දුෂ්කර කාර්යයක් වුවද පිරෙයි එෆ්.එම්. කාර්ය මණ්ඩලය 2022 වර්ෂය තුළ රු. 7,099,022/- ක මුදලක් ඉපයීමට සමත් විය.

විශේෂයෙන් ආගමික, සංස්කෘතික මෙන්ම ව්‍යාපාරික අරමුණු ඉලක්ක කර ගනිමින් වැඩසටහන් නිෂ්පාදනය කිරීමට මෙම වර්ෂය තුළ පිරෙයි එෆ්.එම්. නාලිකාව කටයුතු කර ඇත.

ඉංජිනේරු අංශය

කොරෝනා වසංගත තත්ත්වය මෙන්ම රටේ පැවති ආර්ථික අර්බුද හමුවේ 2022 වර්ෂයේ ඉංජිනේරු කාර්යයන් සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට රාජ්‍ය භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලැබී නොමැත. එබැවින් 2022 වර්ෂය තුළ විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොමැති අතර, දෛනිකව මැදිරි, කුළුණු ඇතුලු ඉංජිනේරු අංශය සතු නඩත්තු කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබාදෙමින් කටයුතු කර ඇත.

අලෙවි අංශය

ආර්ථික, දේශපාලන සහ සමාජීය කරුණු හේතුවෙන් අලෙවිකරණ ක්‍රියාවලියට විශාල වශයෙන් බාධා එල්ල වූ වර්ෂයක් ලෙස 2022 වර්ෂය සඳහන් කළ හැක. කොරෝනා වසංගත තත්ත්වයේ තෙවන වර්ධනය, ලාංකීය දේශපාලනයේ අස්ථාවරත්වය සහ විදුලි අර්බුදය ඊට ප්‍රධානතම හේතූන් විය. කෙසේ වෙතත් ගත වූ වසර තුළ දේශීය ගුවන්කාල වටිනාකම රු. මිලියන 325 ක් ලෙස පවත්වා ගැනීමට අලෙවි අංශය සමත් විය.

කොරෝනා වසංගත තත්ත්වය යම්තාක්දුරට පාලනය වීමෙන් පසුව ලෝක දියවැඩියා දිනය සහ ලෝක ඒඩ්ස් දිනය පාදක කරමින් ප්‍රවර්ධන වැඩසටහන් 2 ක් සංවිධානය කිරීමට අලෙවි අංශය කටයුතු කරන ලදී.

2020 වර්ෂයේ වෙළඳ සේවය මගින් ආරම්භ කළ ගුරු තරුව වැඩසටහනේ අවසාන වැඩසටහන 2022 වර්ෂයේ ඔක්තෝබර් මාසයේදී සංවිධානය කළ අතර, ඊට අවශ්‍ය දායකත්වය අංශය විසින් ලබාදෙන ලදී.

සිටි.එෆ්.එම්. සේවයෙන් පේරාදෙණිය සරසවිය තුළ සංවිධානය කළ හන්තානය ගී රාවය වැඩසටහන සඳහා අංශයේ කාර්ය මණ්ඩලය ක්‍රියාකාරීව දායකත්වය හා අනුග්‍රහක දායකත්වය ලබාදීමට කටයුතු කළ අතර, සංස්ථාවේ ප්‍රගමනය සටහන් කළ වැයුම් ගීතාව, සුභාවිත ගීතය, නොමියෙන මිනිසුන්, ඔබ ආයමත් ඇවිදින්, රැඟුම් ගී සහ His Master Voice යන සංගීත වැඩසටහන් සඳහා අවශ්‍ය අනුග්‍රාහක දායකත්වයන් ලබාදීමට මෙම වසරේ කටයුතු කර ඇත.

ප්‍රකාශන අංශය

<u>2022 වර්ෂයේ ගී ප්‍රසන්ටේෂන් අලෙවිසලේ සහ ප්‍රකාශන අංශයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා වාර්ෂික අදායම හා ක්‍රියාකාරකම් පිළිබඳ තොරතුරු වාර්තාව.</u>

2022 වර්ෂයේ ප්‍රකාශන අංශයේ සහ ගී ප්‍රසන්ටේෂන් අලෙවිසලේ ජනවාරි මාසයේ සිට දෙසැම්බර් 31 දක්වා වාර්ෂික ආදායම් හා ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර දැක්වීමේදී මුලු ආදායම ලෙස 11,21,220/- ක මුදලක් උපයා ඇත.

එහිදී, **BMICH** පොත් ප්‍රදර්ශනය - රු. 6,22,175.00

ගී ප්‍රසන්ටේෂන් අලෙවිසල මාර්ගයෙන් - රු. 3,71,355.00

මුදල් ඇණවුම් මගින් ලැබූ ආදායම - රු. 66,360.00

අලෙවි නියෝජිතයන් මගින්, - රු. 28,400.00 හා විශේෂ අලෙවියන් මගින් ලැබූ ආදායම ලෙස රු. 32,930.00

ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශය

ශ්‍රී ලංකාවේ තොරතුරු සන්නිවේදන ක්‍රියාවලියේ ප්‍රමුඛතම ආයතනයක් වන්නේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවයි. ප්‍රවෘත්ති සන්නිවේදනයේ නිල ප්‍රකාශක ලෙස ජාතික ගුවන්විදුලියට හිමි වන්නේ සුවිශේෂී වැදගත්කමකි. රාජ්‍ය තොරතුරු ක්‍රියාවලියේ නිල සන්නිවේදක භූමිකාව ගුවන්විදුලි සංස්ථාවට හිමිව ඇත. සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂාත්‍රයෙන්ම ගුවන්විදුලියේ ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබයි.

එක් භාෂාවකින් දිනකට ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශ 4ක් ඉදිරිපත් කරනු ලබන අතර, ඒ අනුව, දිනකට සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භෂාත්‍රයෙන් ප්‍රධාන ප්‍රවෘත්ති ප්‍රකාශ 12 ක් ජාතික ගුවන්විදුලිය

ප්‍රචාරය කරනු ලබයි. මෙම ප්‍රවෘත්ති සන්නිවේදන ක්‍රියාවලිය සිදුකරන්නේ ප්‍රවෘත්ති අංශය විසිනි. ගුවන්විදුලි ප්‍රවෘත්ති ප්‍රකාශ එක් එක් භාෂාවන්ට අදාළව පහත සඳහන් වේලාවන්හිදී ප්‍රචාරය කරනු ලැබේ.

සිංහල ප්‍රවෘත්ති ප්‍රකාශ වේලාව - උදේ 06.00/දහවල් 12.45/සවස 06.00/රාත්‍රී 09.00, දෙමළ ප්‍රවෘත්ති ප්‍රකාශ වේලාව - උදේ 06.00/දහවල් 12.45/සවස 06.00/රාත්‍රී 09.00, ඉංග්‍රීසි ප්‍රවෘත්ති ප්‍රකාශ වේලාව - උදේ 06.45/දහවල් 01.15/සවස 06.15/රාත්‍රී 08.45 මීට අමතරව පැයේ ප්‍රවෘත්ති ප්‍රකාශද ජාතික ගුවන්විදුලිය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි නාලිකාවන්හි ඉදිරිපත් කරනු ලබයි. ප්‍රවෘත්තියක ඇති ප්‍රවෘත්තිමය වටිනාකම වඩාත් තහවුරු කරනු පිණිස ප්‍රවෘත්ති ප්‍රකාශය අතරතුර හඬ කොටස් ප්‍රචාරය කිරීමටද කටයුතු කරනු ලැබේ.

ඕනෑම අවස්ථාවකදී ක්‍රියාත්මකවීම සඳහා පුහුණුවලත් කාර්ය මණ්ඩලයකින් ප්‍රවෘත්ති අංශය සමන්විතව ඇත. සේවක සංයුතියේ ප්‍රමාණයට කාර්ය මණ්ඩලය ප්‍රවෘත්ති අංශයට නොමැතිවීම වැඩකටයුතු පවත්වාගෙන යාමට අභියෝගකාරී තත්ත්වයකි. නමුත් පුරප්පාඩු සහිතව වුවද රාජකාරි වගකීම් නොපිරිහෙලා ඉටු කිරීමට ප්‍රවෘත්ති අංශයේ කාර්ය මණ්ඩලය කටයුතු කිරීම පැසසුම් කළ යුතුය.

ජාතික වැදගත්කමක් ගන්නා වූ සහ ප්‍රවෘත්තිමය වටිනාකමක් සහිත අවස්ථාවන් ආවරණය කිරීමට ප්‍රවෘත්ති අංශය සෑම විටම කටයුතු කර ඇත. ජාතික නිදහස් දින උත්සවය, පාර්ලිමේන්තු රැස්වීම, රාජ්‍ය ත්‍රාන්ත්‍රුකයින්ගේ සංචාර, දේශපාලන වටිනාකම් සහිත සංසිද්ධීන් ඇතුළු ප්‍රවෘත්ති වටිනාකම් සහිත අවස්ථා සඳහා ප්‍රවෘත්ති ආවරණ රාජකාරිය ප්‍රවෘත්ති අංශය නොපිරිහෙළා ඉටුකර තිබේ.

2022 වර්ෂයේ ඇතිවූ සමාජ, ආර්ථික, දේශපාලන කටයුතුවල කැළඹිලිකාර ස්වරූපයක් නිරූපනය කළේය. රට තුළ උද්ගත වූ නොසන්සුන්කාරී වාතාවරණය, ඉන්ධන අර්බුදය ආර්ථික අභියෝගය ආදී වශයෙන් වූ සියලු සෘණාත්මක වාතාවරණයක් හමුවේ ශ්‍රාවක ප්‍රජාවට නිරවද්‍ය ප්‍රවෘත්ති සන්නිවේදනය කිරීමට ප්‍රවෘත්ති අංශය කටයුතු කළේය. රටතුළ ක්‍රියාත්මක වෙනත් නාලිකා මහජන කැළඹීම්වලට තුඩු දෙන ප්‍රවෘත්ති මේ සමයේ ප්‍රචාරය කළද, නිසි වගකීමක්, නිසි වගවීමක් සහිත සන්නිවේදන ආයතනයක් ලෙස ජාතික ගුවන්විදුලිය සිය ශ්‍රාවක ප්‍රජාවට නිරවද්‍යවූත්, සමබරවූත් ප්‍රවෘත්ති සන්නිවේදන මෙහෙවර මෙම වර්ෂයේදී මනාව ඉටුකරන ලදී.

සංවර්ධන ඒකකය

ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහ ගරු අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමන් 2022.01.01 දින සිට 2022.12.31 දින දක්වා සහභාගී වූ විවිධ උත්සව සඳහා මාධ්‍ය ආවරණය ලබාදීමේ කටයුතු සංවර්ධන ඒකකය විසින් ඉටුකර ඇත. එම උත්සව අවස්ථාවන් අමතා ගරු ජනාධිපතිතුමන් සහ ගරු අග්‍රාමාත්‍යතුමන් කරනු ලැබූ කතා සංස්කරණය කොට ප්‍රචාරය කර ඇති අතර, ඒ සියල්ල සංස්කරණය කිරීමටද කටයුතු යොදා තිබේ. මෙම උත්සවය සඳහා පූර්ව නිවේදන සකස්කොට ප්‍රචාරය ට යෙදීමෙන් පූර්ව ප්‍රචාරක කටයුතු සිදුකිරීම සහ එම උත්සව අවස්ථාව සජීවීව ප්‍රචාරය කිරීමට ද කටයුතු කර ඇත.

එහිදී,

ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා කළ කතා

2022.07.18 - වැඩ බලන ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ විශේෂ ප්‍රකාශය
2022.07.20 - පාර්ලිමේන්තු කතාව
2022.07.31 - ප්‍රාදේශීය සභා නගර සභා මන්ත්‍රීවරු හමුව - මහනුවර
2022.09.04 - 156 වන පොලිස් දින සැමරුම් - පොලිස් ක්ෂේත්‍ර බලකා මූලස්ථානය
2022.09.06 - එක්සත් ජාතික පක්ෂ 76 වන සංවත්සර උත්සවය සුගතදාස ක්‍රීඩාංගනය
2022.10.19 - බදු සංශෝධනය පිළිබඳ කතාව
2022.08.16 - විද්වත් වෘත්තිකයන්ගේ සංගම් සම්මේලනය - සිනමන් ලේක්සයිඩ් හෝටලය
2022.08.21 - මිහින්තලය ගෝල්ඩන් මැන්ගෝ හෝටලය - දිස්ත්‍රික් සංවර්ධන කටයුතු පිළිබඳ සාකච්ඡාව

2022.09.14 - ජාතික අන්ධ විද්‍යාලයේ උපාධි ප්‍රධානෝත්සවය - බම්බලපිටිය
2022.10.15 - ආහාර සුරක්ෂිතතාව සඳහා යාන්ත්‍රන වැඩසටහන - අම්පාර
2022.10.20 - Mireko Tower විවෘත කිරීම - හැව්ලොක් ටවුන්
2022.11.11 - කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ 32 වන උපාධි ප්‍රදානෝත්සවය - බම්බලපිටිය
2022.11.23 - ලලිත් ඇතුලත්මුදලි ජන්මානුස්මරණ සැමරුම් උත්සවය - BMICH
2022.12.11 - ලියෝ සාමාජිකයන් ස්ථාපනය කිරීමේ උත්සවය
2022.12.14 - ටොයෝ ලංකා සැපයුම්/සේවා මධ්‍යස්ථානය විවෘත කිරීම - කඩවත

අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමා කළ කතා

2022.01.06 - කුරුණෑගල මලියදේව බාලිකා විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ල විවෘත කිරීම.
2022.01.10 - කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ තාක්ෂණ පීඨය විවෘත කිරීමේ උත්සවය
2022.01.09 - කොළඹ වරාය නගරයේ පදික මංතීරුව විවෘත කිරීමේ උත්සවය
2022.01.11 - කොළඹ විශ්වවිද්‍යාලයේ කුලපති පදවියෙන් පිදුම් ලැබූ නාරාහේන්පිට ශ්‍රී අභයාරාම පුරාණ විහාරාධිපති බස්නාහිර පළාත් ප්‍රධාන සංඝනායක පූජ්‍ය මුරුත්තෙට්ටුවේ ආනන්ද නායක ස්වාමීන් වහන්සේ පිළිගැනීමේ උත්සවය "යතිවර හරසර" නෙළුම් පොකණ රඟහල
2022.01.12 - කොළඹ වරාය නැගෙනහිර පර්යන්තය ඉදිකිරීම් ආරම්භ කරමින් පැවති උත්සවය
2022.01.14 - අතිපූජ්‍ය දොඩම්පහළ චන්ද්‍රසිරි මහානායක ස්වාමීන් වහන්සේ වෙත අක්ත පත්‍ර ප්‍රදානය කිරීම.
2022.01.15 - මධ්‍යම අධිවේගී මාර්ගයේ දෙවන අදියර මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස ජනතා අයිතියට පත්කිරීම.
2022.02.17 - චීන ශ්‍රී ලංකා රබර් සහල් ගිවිසුමට අවුරුදු 75 ක් පිරීම හා චීන ශ්‍රී ලංකා තානාපති සබඳතාවලට අවුරුදු 65 ක් පිරීම නිමිත්තෙන් පැවති උත්සවය (නෙළුම් පොකුණ)
2022.02.26 - රන්බිම ඔප්පු ලක්ෂයක් ප්‍රදානය කීමේ ජාතික වැඩපිළිවෙල යටතේ ජනපදිකයන් වෙත ඔප්පු ප්‍රදානය කිරීම.
2022.03.30 - වාරි සෞභාග්‍යා දෙවන අදියර සමාරම්භක උත්සවය
2022.04.11 - ගරු අග්‍රාමාත්‍යතුමා ජාතිය අමතා කළ විශේෂ ප්‍රකාශය

අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා කළ කතා

2022.10.03 - ලෝක ජනාවාස දින උත්සවය
2022.11.10 - නාගරික සංවර්ධන අධිකාරිය මගින් ක්‍රියාත්මක කෙරෙන සංවර්ධන අයදුම්පත් පෙරසැරි කිරීමේ කඩිනම් සේවා ඒකකය ආරම්භ කිරීම.
2022.11.17 - ජාතික සාහිත්‍ය සම්මාන ප්‍රදානෝත්සවය - 2022 (BMICH)
2022.12.15 - ජාතික ඵලදායිතා සම්මාන උළෙල
2023.03.13 - සංකථන මණ්ඩපය ශ්‍රාස්ත්‍රීය වේදිකාව (අරලියගහ මන්දිරය)

කතා හා අවස්ථා ආවරණය වන පරිදි වැඩසටහන් සකසා ප්‍රචාරය කිරීමට කටයුතු කර ඇත.

සංගීත අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සංගීත අංශය මගින් 2022 ජනවාරි මස 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා නිෂ්පාදනය කර ප්‍රචාරය කළ වැඩසටහන් පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් දක්වා ඇත.

- 2022 ජනවාරි 05 දිනට යෙදුණු සංස්ථා දිනය වෙනුවෙන් **සංගීත රසෝජා - සංස්ථා දින විචිත්‍රාංගය** නිෂ්පාදනය කර ප්‍රචාරය කරන ලදී.
- 2022 ජනවාරි 05 වෙනි දින සිට ප්‍රචාරය සඳහා ජිංගල් 03 ක් නිර්මාණය
- 2022 පෙබරවාරි 04 වන දිනට යෙදුන නිදහස් දිනය වෙනුවෙන් **ස්වාභිමානී ශ්‍රී ලංකා** විශේෂ විචිත්‍රාංගයක් නිෂ්පාදනය කර ප්‍රචාරය කරන ලදී.
- 2022 අප්‍රේල් මස 13 වන දින පැයක **බක්මහ සිරිත - අවුරුදු විචිත්‍රාංගය**
- 2022 අප්‍රේල් 14 වන දින පැයක විශේෂ අවුරුදු ගීත නාටකය - **කැලෑමලී**
- අවුරුදු කෙලි ගී ආශ්‍රිත නිර්මාණ 7 ක් අවුරුදු සතිය තුළ - **අවුරුදු කෙලි ගී**
- 2022 මැයි මස 14 වන දින පැයක **බුදු ගුණ විසිතුර** විශේෂ වෙසක් විචිත්‍රාංගය
- 2022.09.08 දිනට යෙදුන පොලිස් දිනය වෙනුවෙන් විශේෂ පැයක සංගීතමය ප්‍රසංගයක් නිෂ්පාදනය සජීවීව ප්‍රචාරය කරන ලදී.
- 2022 දෙසැම්බර් 16 වන දිනට යෙදුන 97 වෙනි ගුවන්විදුලි දිනය වෙනුවෙන් පැයක විශේෂ විචිත්‍රාංගයක් නිෂ්පාදනය කිරීම.
- 2022 දෙසැම්බර් 16 දිනට යෙදුන ගුවන්විදුලි දිනය වෙනුවෙන් ගුවන්විදුලිය ආරම්භයේ පටන් ගුවන්විදුලි වැඩසටහන් සඳහා යොදාගත් තේමා වාදන ඇසුරෙන් කළ විශේෂ නිර්මාණයක් ස්වදේශීය, වෙළඳ හා සිටි.එෆ්.එම්. සේවා ඔස්සේ ප්‍රචාරය කරන ලදී. - **තේමා වාදන**
- 2022 දෙසැම්බර් 25 වන දින **දැහැමියනේ** නත්තල් දින විනාඩි 30 ක විශේෂ නත්තල් විචිත්‍රාංගය නිෂ්පාදනය කර ස්වදේශීය සේවය ඔස්සේ ප්‍රචාරය කරන ලදී.
- ගුවන්විදුලි වාදක මණ්ඩලය සහ ප්‍රවීන වාද්‍ය ශිල්පියෙකු විසින් ඉදිරිපත් කරන ගී අනුවාදන සහ නිර්මාණ ඇතුළත් ප්‍රසංගයක් නොවැම්බර් හා දෙසැම්බර් මාසවල **වැයුම් ගීත** ප.ව. 02.00 - ප.ව. 04.00 දක්වා ආනන්ද සමරකෝන් මැදිරියේදී නරඹන්නන් ඉදිරියේ පවත්වන ලදී.
- සරල ගී ශිල්පී කටහඬ පරීක්ෂණයෙන් සමත් වන ශිල්පීන්ගේ ගායනා ඇතුළත් **සුභාවිත ගීත** වැඩසටහනක් සෑම සඳුදා හා සිකුරා දිනකම 12.00 - 12.45 දක්වා වෙළඳ හා සිටි.එෆ්.එම්. සේවාවල ප්‍රචාරය සඳහා නිෂ්පාදනය කරන ලදී.
- ප්‍රවීන වාද්‍ය ශිල්පියෙකු විසින් තෝරන ලද ගීත 10 ක් ප්‍රවීන ගීත විචාරකයකු සම්බන්ධකර ගනිමින් සාකච්ඡාමය ස්වරූපයෙන් පැය 2 ක විශේෂ වැඩසටහනක් **හදවතේ ගීතය** සෑම බ්‍රහස්පතින්දා දිනකම පෙ.ව. 09.00 - පෙ.ව 11.00 දක්වා සිටි.එෆ්.එම්. සේවය ඔස්සේ ප්‍රචාරය කරන ලදී.
- සඳුදා සිට සිකුරාදා දක්වා සතියේ දිනවල ප්‍රධාන කාර්යාලයෙන් හා ප්‍රාදේශිය සේවා මගින් නිෂ්පාදනය කරන සුභාවිත ගීතය වැඩසටහන්වල ඇතුළත් ගීත අතුරින් හොඳම ගීත තෝරාගෙන **සියපත් විල** පැය 02 ක වැඩසටහනක් නිෂ්පාදනය කර පෙ.ව. 09.00 - පෙ.ව. 11.00 දක්වා සිටි එෆ්.එම්. සේවය ඔස්සේ ප්‍රචාරය කරන ලදී.
- විශ්ව සංගීතාංග ඇතුළත් කර නිෂ්පාදනය කළ - **පන්සිළු අමාව**

- සෑම මසකම 2,4 ඉරිදා දිනවල 04.00 සිට 04.30 දක්වා **රංග රාව** වැඩසටහන (නූර්ති ගී, නාඩගම් ගී හා පැරණි මෙන්ම වර්තමාන චේදිකා නාට්‍ය ගී ඇතුළත් වේ.)
- සෑම පොහොය දිනකම දහවල් 12.00 සිට 12.30 දක්වා සිංහල ස්වදේශීය සේවය ඔස්සේ **ශ්‍රද්ධාංජලී** ප්‍රචාරය කිරීම. (බුදු සිරිතේ විවිධ අවස්ථා ගෙන හැර පාමින් බැති ගී සරණියක් ඇසුරින් කරනු ලබන විග්‍රහයකි.)
- සෑම සතියකම ඉරිදා දින ස්වදේශීය සේවය ඔස්සේ - **ඉරිදා සංග්‍රහය**
- සෑම ඉරිදා දිනකම දහවල් 13.15 - 13.30 දක්වා සිංහල ස්වදේශීය සේවය ඔස්සේ **දොරට වැඩුම** වැඩසටහන (ගීත සමීක්ෂණ මණ්ඩලය වෙතින් සමත් වන නවතම ගීත ඇතුළත් වැඩසටහනකි.)
- සෑම පසළොස්වක පොහෝ දිනකම උදෑසන 10.00 සිට 10.30 දක්වා **භක්ති පූජා** වැඩසටහන (බෞද්ධාගමික පසුබිම වටා නිර්මාණය වූ නවතම ගීත ඇතුළත් වේ.)
- මිය ගිය කලාකරුවන් අනුස්මරණය කිරීම සඳහා නිෂ්පාදිත වැඩසටහනකි. - **ආවර්ජනා**

ශ්‍රවණ පර්යේෂණ අංශය

2022 වර්ෂයේ ශ්‍රවණ පර්යේෂණ අංශය මඟින් විශේෂ ක්‍රියාකාරකම් සිදුකර නොමැත. නමුත් දෛනිකව ප්‍රචාරය වන වැඩසටහන් සඳහා අවශ්‍ය තොරතුරු සපයාදීම සහ වැදගත් තොරතුරු එක්රැස් කිරීම ආදී කටයුතුවල නියැලී කටයුතු කර ඇති අතර, වර්තමානයේ එක් ශ්‍රවණ පර්යේෂණ නිලධාරීවරයෙක් සේවය කරයි.

මධ්‍යම ක්‍රියාකාරී අංශය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ අනෙකුත් අංශ අතර මධ්‍යම ක්‍රියාකාරී අංශය සුවිශේෂී ආයතනික මෙහෙවරක් ඉටුකරන ප්‍රධාන ස්ථානයකි. සැකෙවින් මෙම අංශයෙන් ඉටුවන සේවය පිළිබඳ කෙටි හැඳින්වීමක් ලෙස සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා මාධ්‍යන්ට අයත් විවිධත්වයෙන් යුතු වැඩසටහන් පටිගත කිරීමෙන්, සංස්කරණ කටයුතු කිරීමෙන්, බාහිර පටිගත කිරීම් සහ සජීවි අන්දමින් සම්බන්ධතා මැදිරි භාවිතා කරමින් අසන්නන්ගේ රුචිකත්වය මත නව්‍යතා උකහා ගනිමින් ආයතනයේ අනන්‍යතාව පවත්වා ගමින් ද ඉතා උසස් තත්ත්වයේ වැඩසටහන් ප්‍රචාරය කිරීමට සක්‍රීය දායකත්වයක් ලබාදෙයි. තවද වෙළෙඳ දැන්වීම් හා පූර්ව නිවේදන පටිගත කරමින් සහයවීමද දැන්විය හැක. ඉහත කාර්ය සඳහා දවසේ පැය 24 පුරා සේවාමුර රාජකාරි යටතේ වැඩසටහන් නිෂ්පාදන සහායක නිලධාරීන් ප්‍රධාන මෙහෙවරක් ඉටුකරන අතර, මැදිරි සහායක නිලධාරීන්ද මැදිරි පාලනය හා ඒවායේ තාක්ෂණික උපකරණවල වගකීම් හා ආරක්ෂාව භාරව රාජකාරි ඉටුකරමින් පවත්වාගෙන යාම දැක්විය හැක.

මීට සමගාමීව මැදිරි වෙන් කිරීම් අංශය විශාල කාර්යභාරයක් ඉටුකරන අංශයකි. සම්බන්ධතා මැදිරි, පටිගත කිරීම් මැදිරි, නිෂ්පාදකවරුන්ට බාධාවක් නොවන ලෙස නිසි ලෙස සම්බන්ධීකරණය කරමින් මනා කළමනාකාරීත්වයෙන් යුතුව මැදිරි වෙන් කිරීම් සිදුකිරීම ද දෛනික සටහන් පත්‍රිකාව සැකසීමෙන් දායකවීමද දැක්විය හැක.

යාල් එෆ්.එම්. සේවය

2022 වර්ෂයේ යාල් එෆ්.එම්. නාලිකාව ආගමික සංස්කෘතික, සංවර්ධන, ආර්ථික මෙන්ම සමාජීය වැඩසටහන් සඳහා ප්‍රමුඛතාවයක් ලබාදෙමින් කටයුතු කර ඇත. ඒ අතර, පෝය දින බෞද්ධ වැඩසටහන්, මහා ශීව රාත්‍රී, කාන්තා දින වැඩසටහන්, කෝවිල් ආශ්‍රිත වැඩසටහන්, ශාන්ත අන්තෝනි දේව මංගල්‍යය ආවරණය, නල්ලූර් කෝවිල ආශ්‍රිත වැඩසටහන්, ළමා දින සැමරුම් වැඩසටහන්, දීපාවලී උත්සව ආවරණය, නත්තල් උත්සවය හා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් ප්‍රචාරය කිරීමට කටයුතු කර ඇත.

වසරේ මෙහෙයුම් ක්‍රියාවලිය පිළිබඳ සංක්ෂිප්ත සටහන

සමාලෝචිත 2022 වර්ෂය ආරම්භ වන විට ගෝලීය වශයෙන් කොරෝනා වසංගතය ව්‍යාප්තිය අවසන් වෙමින් රට යම් ස්ථාවර තත්ත්වයට පත්වෙමින් යටිතල පහසුකම් ලබා දෙමින්, ගුණාත්මක ලෙස සියලුම නාලිකාවන් සුපුරුදු පරිදි පවත්වාගෙන යාමට කටයුතු කෙරිණි.

2022 වර්ෂය වන විට වසා දමා තිබූ රට කෙමෙන් යථා තත්ත්වයට පත්වූ බැවින් අතර මග නවතා දැමූ වැඩසටහන් නැවත වතාවක් ආරම්භකර ප්‍රචාරය කිරීමට කටයුතු කර ඇත. නමුත් වසර 02 ක් මුලුල්ලේ රටේ ඇති වූ ආර්ථික අවපාතය නිසා ආයතනයට අහිමි වී ගිය අනුග්‍රාහක දැන්වීම්වල ආදායම් පෙර තත්ත්වයට පත්කර ගැනීම සඳහා විවිධ උපක්‍රම උපයෝගී කරගෙන සමාජ මාධ්‍ය ජාල ඔස්සේ ප්‍රචාරක කටයුතු ආරම්භ කරමින් පුළුල් ප්‍රචාරයක් ලබාදීමට කටයුතු කර ඇත.

නමුත්, රටේ ඇති වූ ඉන්ධන අර්බුදය හමුවේ සේවකයන් ආයතනය වෙත පැමිණීමේ අඩුවක් වරින්වර දක්නට ලැබුණු අතර, කුමන ආකාරයෙන් බාධා පැමිණිය ද ආයතනය විසින් නාලිකාවල දෛනික කටයුතු යථා පරිදි පවත්වාගෙන යාමට උත්සුක වී ඇත.

විශේෂයෙන් ආයතනයේ සේවකයින් හට නේවාසික පහසුකම් සපයා දෙමින් අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමටත් සේවයට පැමිණි පසු සේවකයින්ගෙන් උපරිම සේවයක් ලබාගැනීමටත්, කටයුතු කළ අතර විශේෂයෙන් ZOOM තාක්ෂණය ඔස්සේ සියලු අංශ ප්‍රධානීන්, නාලිකා ප්‍රධානීන් සම්බන්ධ කරගෙන කටයුතු කරගෙන යාමට ආයතනය කටයුතු කර ඇත. ප්‍රාදේශීය නාලිකා ප්‍රධානීන්, අලෙවි විධායක නිලධාරීන්, නිෂ්පාදක හා නිවේදක ආදී ලෙස විවිධ කොටස් සඳහා Whats App Group නිර්මාණය කරමින් එමඟින් හුවමාරු කර ගැනීම. දුරකථන බිල් අවම කිරීමට මෙන්ම වැඩිවූ විදුලි බිල්පත් සඳහා වැයවන මුදල 25% පමණ අඩුකර ගැනීමටත් දුරකථන ගාස්තුව 50% පමණ අඩුකර ගැනීම, Paperless සංකල්පය අනුව යමින් ප්‍රවෘත්ති අංශය පරිගණක ගත කිරීම ඔස්සේ ප්‍රවෘත්ති කියවීමට ප්‍රවෘත්ති නිවේදක නිවේදිකාවන් යොමුකිරීමට කටයුතු කර ඇත. එමඟින් ආයතනයේ ලිපි ද්‍රව්‍ය (Stationeries) සඳහා වැය වන මුදල අඩුකර ගැනීමට හැකියාව ලැබී ඇත.

ගිණුම් ප්‍රකාශනය – 2022

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය
(සියලු මුදල් ශ්‍රී ලංකා රුපියල්වලින්)

	සටහන	2022 දෙසැම්බර් 31	2021 දෙසැම්බර් 31	2020 දෙසැම්බර් 31
වත්කම්				
ජංගම නොවන වත්කම්				
දේපළ, පිරියත සහ උපකරණ	9	1,479,574,592	1,698,733,364	1,940,636,746
විලම්බිත බදු වත්කම්	8	42,620,265	57,178,569	92,300,213
මෘදුකාංග	9			4,382,527
සිදුකරමින් පවතින ප්‍රාග්ධන වැඩ	10	18,723,163	15,917,019	14,877,019
ස්ථාවර තැම්පතු		166,233,768	90,478,538	84,485,018
ආයෝජන	11	1,000,000	1,000,000	1,000,000
		1,708,151,788	**1,863,307,490**	**2,137,681,521**
ජංගම වත්කම්				
ඉන්වෙන්ටරි	12	31,837,158	19,811,969	21,632,280
වෙළඳාම සහ අනෙකුත් ලැබිය යුතු දේ	13	286,781,015	315,007,400	268,768,859
මුදල් සහ මුදල්වලට සමාන දේ	14	109,097,633	159,295,490	92,678,924
		427,715,806	494,114,859	383,080,063
මුළු වත්කම්		**2,135,867,594**	**2,357,422,349**	**2,520,761,584**
ස්කන්ධ ප්‍රාග්ධන හා බැරකම්				
ප්‍රාග්ධන හා සංචිත				
ප්‍රකාශිත ප්‍රාග්ධනය		480,239,085	397,386,085	307,386,085
ප්‍රත්‍යාගණන සංචිත		11,971,999	11,971,999	11,971,999
රඳවාගත් ඉපැයීම්	15	(359,594,440)	(218,463,340)	(377,857,113)
		132,616,644	**190,894,744**	**(58,499,028)**
අවිනිශ්චිත බැරකම්				
ජංගම නොවන බැරකම්				
ණය ගැනීම්	21	166,610,048	207,642,033	282,412,178
විදේශ ප්‍රදාන	20	385,228,863	539,857,262	695,263,936
රජයේ ප්‍රදාන		567,698,791	693,352,122	750,821,314
ගෙවිය යුතු වෙනත්	19	6,301,385	7,789,635	8,539,636
කල් දැමූ බදු වගකීම්	8	166,617,579	244,915,237	326,743,821
		1,292,656,665	**1,693,556,289**	**2,063,780,885**
වත්මන් හැකියාවන්				
වෙළඳාම සහ අනෙකුත් ගෙවිය යුතු දේ	16	468,019,808	318,517,659	348,038,966
කෙටිකාලීන ණය ගැනීම්	17	61,426,136	14,523,578	54,324,046
මූල්‍යමය නොවන වගකීම්	18	181,148,341	139,930,079	113,116,714
මුළු බැරකම්		710,594,285	472,971,316	515,479,726
මුළු ස්කන්ධය සහ බැරකම්		**2,135,867,594**	**2,357,422,349**	**2,520,761,584**

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණය ප්‍රමිති 1971 අංක 38 දරන මුදල් පනතේ සහ 1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනතේ විධිවිධානවලට අනුකූල වන පරිදි මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇති බවට අධ්‍යක්ෂ (මුදල්) සහතික කරයි.

ලලිත් හෙට්ටිගේ
අධ්‍යක්ෂ (මුදල්) **දිනය :** .....

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතුය. මෙම මූල්‍ය ප්‍රකාශය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2023 පෙබරවාරි 27 වැනි දින අනුමත කරන ලදී.

හඩ්සන් සමරසිංහ,
සභාපති, **අධ්‍යක්ෂ මණ්ඩලය** **අධ්‍යක්ෂ මණ්ඩලය**

දිනය : ..... **දිනය :** ..... **දිනය :** .....

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය
සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

	සටහන	දෙසැම්බර් 31 දිනට	දෙසැම්බර් 31 දිනට	දෙසැම්බර් 31න්	දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා
		2022	ගැලපීම්	2021	2020
විකුණුම්	1	682,086,556	632,842,573	632,842,573	545,092,393
විකුණුම් පිරිවැය	2	555,511,008	555,341,319	555,341,319	537,608,568
දළ ලාභය		126,575,548	77,501,254	77,501,254	7,483,825
වෙනත් මෙහෙයුම් ආදායම්	3	364,332,698	340,018,557	340,018,557	346,439,569
බෙදාහැරීමේ පිරිවැය	4	15,311,236	14,009,237	14,009,237	6,431,070
වෙනත් මෙහෙයුම් පිරිවැය	5	350,971,983	355,045,386	355,045,386	359,456,549
පරිපාලන වියදම්	6	355,818,272	377,874,344	377,874,344	424,357,685
මෙහෙයුම් ලාභය		(231,193,244)	(329,409,156)	(329,409,156)	(436,321,911)
මූල්‍ය පිරිවැය	7	5,195,318	4,103,603	4,103,603	5,984,176
රජයේ ප්‍රදානවලට පෙර ලාභය/ (අලාභය)		(236,388,563)	(333,512,759)	(333,512,759)	(442,306,087)
රජයේ ප්‍රදාන	3.1		345,000,000	345,000,000	440,000,000
රජයේ ප්‍රදානවලට පසු ලාභය/ (අලාභය)		(236,388,563)	11,487,241	11,487,241	(2,306,087)
ආදායම් බදු	8	60,478,069	45,198,370	15,333,496	1,275,703
ආදායම් බද්දෙන් පසු ලාභය/(අලාභය).		(175,910,494)	56,685,611	26,820,737	(1,030,384)
වෙනත් විස්තීර්ණ ආදායම්	21	34,779,394	54,947,608	54,947,608	(61,720,242)
බදු ගෙවීමෙන් පසු ලාභය		(141,131,100)	111,633,219	81,768,345	(62,750,626)
මුළු විස්තීර්ණ ආදායම		(141,131,100)	111,633,219	81,768,345	(62,750,626)

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

(සියලුම අගයන් ශ්‍රී ලංකා රුපියල්වලින් දක්වා ඇත)

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	නැවත ඇගයීම		රඳවාගත් ආදායම	මුළු
ශේෂය 2020 ජනවාරි 1 ට	307,386,085	11,971,999		(475,784,467)	(156,426,383)
විස්තීරණ ආදායම					
විස්තීරණ ආදායම				(62,750,626)	(62,750,626)
ආදායම් සංචිත				160,677,980	160,677,980
ශේෂය 2020 දෙසැම්බර් 31 ට	**307,386,085**	**11,971,999**		**(377,857,113)**	**(58,499,029)**
ශේෂය 2021 ජනවාරි 1 ට	307,386,085	11,971,999		(377,857,113)	(58,499,029)
විස්තීරණ ආදායම					
විස්තීරණ ආදායම				111,633,219	111,633,219
ආදායම් සංචිතය				47,760,554	47,760,554
ප්‍රාග්ධනය	90,000,000				90,000,000
ශේෂය 2021 දෙසැම්බර් 31 ට	**397,386,085**	**11,971,999**		**(218,463,340)**	**190,894,744**
ශේෂය 2022 ජනවාරි 1 ට	397,386,085	11,971,999		(218,463,340)	190,894,744
විස්තීරණ ආදායම				(141,131,100)	(141,131,100)
ආදායම් සංචිතය					
ප්‍රාග්ධනය	82,853,000				82,853,000
ශේෂය 2022 දෙසැම්බර් 31 ට	**480,239,085**	**11,971,999**	**-**	**(359,594,440)**	**132,616,644**

2022 දෙසැම්බර් මස **31**වැනි දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	2022		2021	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහය				
බදු සහ පොලියට පෙර ශුද්ධ ලාභය		(236,388,563)		9,286,276
ගැලපීම්				
රජයේ ප්‍රදානයේ ක්‍රමක්ෂය	(82,800,331)		(100,322,193)	
ත්‍රිකුණාමල ප්‍රදානයේ ක්‍රමක්ෂය	(154,628,399)		(155,406,674)	
ක්ෂයවීම	75,053,883		88,838,538	
ක්ෂයවීම් - ත්‍රිකුණාමලය	159,851,496		160,774,772	
මෘදුකාංග ක්‍රමක්ෂය			4,382,527	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	36,341,450		36,559,005	
බොල් ණය සඳහා ප්‍රතිපාදන	13,798,736		6,245,224	
විනිමය මත ලාභ/(අලාභය)	(13,707,668)	33,909,167		
ESC				41,071,198
		(202,479,396)		50,357,475
කාරක ප්‍රාග්ධන වෙනස්කම්වලට පෙර මෙහෙයුම් ලාභ				
ඉන්වෙන්ට්‍රි හාණ්ඩ වැඩිවීම/ අඩුවීම	(12,025,189)		1,820,310	
වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම	14,678,743		(34,899,045)	
වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ වැඩිවීම/ අඩුවීම	148,013,899		(920,511)	
මූල්‍යමය නොවන බැරකම්වල වැඩිවීම/ අඩුවීම	37,956,978	188,624,430	25,304,794	(8,694,452)
ගෙවන ලද පාරිතෝෂික		(29,222,119)		(52,071,185)
මෙහෙයුම් ක්‍රියායාකාරකම්වලින් ශුද්ධ මුදල් ආයෝජන කටයුතු වලින් මුදල් ගලායාම				(10,408,163)
ස්ථාවර තැන්පතු පොලිය	(75,755,230)		(5,993,521)	
රජයේ ප්‍රදාන	40,000,000		132,853,000	
දේපළ, පිරියත හා උපකරණ මිල දී ගැනීම	(15,461,957)		(8,798,552)	
සිදු කෙරෙමින් පවතින ප්‍රාග්ධන වැඩ	(2,806,144)	(54,023,330)	(1,040,000)	
මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහය				117,020,927
ලීසිං කුලිය ගෙවීම				
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කරන ශුද්ධ මුදල් මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහය				
ශුද්ධ වැඩිවීම / මුදල් අඩුවීම සහ මුදල් සමානකම්		(97,100,415)		106,612,764
ආරම්භයේදී මුදල් සහ මුදල් සමාන මුදල් කාලය		144,771,913		38,159,149
අවසානයේ මුදල් හා සමාන මුදල්		**47,671,497**		**144,771,913**
කාල සීමාව (සටහන 14)				

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

1 සාමාන්‍ය තොරතුරු

1.1 වාර්තාකරණ අස්ථිත්වය

1966 අංක 37 දරන ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පනත යටතේ නිසි පරිදි සංස්ථාවක් බවට ස්ථාපනය කර ඇති ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ පිහිටා ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික කටයුතු සිදු කරන ස්ථානය කොළඹ 07, නිදහස් චතුරශ්‍රයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ගුවන් කාලය විකිණීමයි.

1.3 නිකුත් කිරීම සඳහා බලය පවරනු ලද දිනය

2022 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශය 2023 පෙබරවාරි 27 වෙනි දින අනුමැති සඳහා ඉදිරිපත් කරන ලදී.

1.4 සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානය වන විට ස්ථීර සේවක සංඛ්‍යාව 577 ක් වූ අතර කොන්ත්‍රාත්

පදනමින් සේවයේ යෙදී සිටි සේවක සංඛ්‍යාව 82ක් විය.

(31.12.2021 – 723)

2. සකස් කිරීමේ පදනම සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති ('SLFRS") යොදා ගැනීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මඟින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ("SLFRS") සහ 1995 අංක 19 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත ප්‍රකාරව සංස්ථාව සිය මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ("SLFRS') නව වෙළුමක් නිකුත් කර ඇති අතර 2021 ජනවාරි මස 01වැනි දින සිට හෝ ඉන් අනතුරුව ආරම්භ වන වර්ෂය සඳහා බලාත්මක වන පරිදි ව්‍යවසායකයින් විසින් මෙම මෙම ප්‍රමිති අදාළ කර ගැනීමට අවශ්‍ය වේ.

3. 1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදා ගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත විස්තර කොට ඇත. අන් ආකාරයකින් සඳහන් කොට ඇත්තේ නම් මිස, ඉදිරිපත් කර ඇති සියලුම වසර සඳහා මෙම ප්‍රතිපත්ති ඒකාකාරව භාවිතා කර ඇත.

3.1.1 සකස් කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (SLFRS for SMEs) අනුකූලවයි. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සහ මෙහි පසුව පැහැදිලි කොට ඇති අනෙකුත් නිශ්චිත මිනුම් යටතේ පිළියෙළ කර ඇත.

මූල්‍ය ප්‍රකාශන කෙරෙහි බලපාන උද්ධමන සාධක වෙනුවෙන් ගැලපීම් සිදු කොට නොමැත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අනුව සකස් කළ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කළ යුතුය. තව ද, ගුවන්විදුලි සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගත කිරීමේ ක්‍රියාවලියෙහි දී කළමනාකාරීත්වය විසින් සිය විනිශ්චය ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඇති උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර සටහන 4හි හෙළිදරව් කොට ඇත. ඊට වත්කම් සහ බැරකම් හෙළිදරව් කිරීම සහ වාර්තාකරණ කාලසීමාව තුළ ආදායම සහ වියදම් ප්‍රමාණ පිළිබඳ වාර්තාව අයත් වේ. වර්තමාන සිදුවීම් සහ ක්‍රියාමාර්ග පිළිබඳ කළමනාකාරීත්වයේ උපරිම දැනුම මත මෙම ඇස්තමේන්තු පාදක වුව ද, අවසානයේ දී තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවට වඩා වෙනස් විය හැකිය.

3.1.2 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සංස්ථාවට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමක් සිදු කර ඇති අතර ඈවර කිරීමට හෝ වෙළඳ කටයුතු නැවැත්වීමට ඔවුන් අදහස් නොකරති.

3.1.3 පශ්චාත් ශේෂපත්‍ර සිදුවීම්

ශේෂපත්‍ර දිනයට පසුව සිදු වූ සියලුම ද්‍රව්‍යමය සිදුවීම් සලකා බලා අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් සිදු කර හෝ අනාවරණය කර ඇත.

3.1.4 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව මඟින් අඛණ්ඩව යොදා ගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් ආකාරයකින් සඳහන් කර ඇත්තේ නම් ,

පෙර වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ අනුරූප වේ. සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කිරීම සමඟ අනුකූල වන පරිදි අවශ්‍ය ස්ථානයන් හි දී පෙර වර්ෂයේ සංඛ්‍යා නැවත සකස් කර ඇත.

3.1.5 විදේශීය ව්‍යවහාර මුදල්

(අ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති අයිතම මනිනු ලබන්නේ අස්ථිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය යොදා ගනිමිනි ("කෘත්‍යාත්මක මුදල් ඒකකය"). මෙම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර ඇත්තේ සංස්ථාවේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල්වලිනි.

(ආ) විදේශ මුදල් ගනුදෙනු සහ ශේෂයන්

විදේශීය මුදල් ගනුදෙනු එම ගනුදෙනුව සිදු කරන ලද දිනයන් හි පැවති විනිමය අනුපාතය හෝ අයිතම මනිනු ලබන අවස්ථාවන් හි වටිනාකම යොදා ගනිමින් කෘත්‍යාත්මක මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. එම ගනුදෙනු පියවීම නිසා විදේශ මුදලින් නම් කර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වර්ෂය අවසානයේ විනිමය අනුපාතයන්ට පරිවර්තනය කිරීමේ දී ඇති වන විදේශ විනිමය ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගනී.

පිටු 5 සිට 30 දක්වා ඇති සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල අනිවාර්ය අංගයකි.

3.2 වෙනත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිත්ති

3.2.1 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම්

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති වත්කම් වනුයේ මුදල් සහ සංස්ථාවේ ව්‍යාපාරික කටයුතුවල සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුළ හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුළ යන දෙකින් වඩා කෙටි කාල සීමාව තුළ මුදලින් උපලබ්ධිවීමට අපේක්ෂිත දේ වන්නේය. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වනුයේ ශේෂපත්‍ර දිනයේ සිට එක් වසරක කාලසීමාවක් ඉක්මවා රඳවා ගැනීමට සංස්ථාව අදහස් කරන වත්කම් වේ.

3.2.1.1 දේපළ, පිරියත සහ උපකරණ

ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රධාන වශයෙන් ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථානයෙන් සමන්විත වේ. සියලුම දේපළ, පිරියත සහ උපකරණ ඓතිහාසික පිරිවැයට ප්‍රකාශ කරනු ලැබ ඇත. දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය යනු අත්කර ගැනීමේ හෝ ඉදිකිරීම් පිරිවැය සමඟින් අපේක්ෂිත පරමාර්ථය සඳහා අදාළ වත්කම වැඩ කරන තත්ත්වයට ගෙන ඒම සඳහා දැරීමට සිදු වන ආනුෂංගික වියදම් ද වේ. වත්කම්වල ඉපැයුම් ධාරිතාව අඛණ්ඩව පවත්වා ගෙනයාම හෝ ඉහළ නැංවීම පිණිස ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරන ලද ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. පසුව දරන අනෙකුත් පිරිවැය වත්කමේ ධාරන අගයට ඇතුළත් කරනු ලබන්නේ හෝ වෙනම වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම අයිතම තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාවට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් පමණි.

3.2.1.2 ප්‍රතිස්ථාපන පිරිවැය

මුල් අවස්ථාවේදීම කාර්යසාධනය පිළිබඳ අගයන ලද ප්‍රමිතිය මඟින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මඟින් දේපළ, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ඇති වන අළුත්වැඩියා හෝ නඩත්තුව මත ඇති වන වියදම් වියදම් දරන ලද අවස්ථාවේ දී සිදු වූ වියදමක් ලෙස හඳුනා ගනු ලබයි.

3.2.1.3 ක්ෂයවීම

ඉඩම් ක්ෂය කිරීමක් සිදු නොවේ. ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ සියලුම දේපළ, පිරියත සහ උපකරණවල පිරිවැය හෝ තක්සේරුව මත සරල මාර්ග පදනම යොදා ගනිමිනි. මේ සඳහා යොදා ගත් ප්‍රධාන වාර්ෂික අනුපාත පහත දැක්වෙන පරිදි වේ:

ගොඩනැගිලි	2.5%
පිරියත සහ යන්ත්‍රසූත්‍ර	7.5%
ශ්‍රව්‍ය සංඛ්‍යාත උපකරණ	7.5%
ගෘහභාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ	10%
සම්ප්‍රේෂක	7.5%
මෝටර් රථ වාහන	25%
සංගීත භාණ්ඩ	10%
පරිගණක උපකරණ	50%
තැටි සහ පටි	33.33%
සුළු උපකරණ	50%
මෘදුකාංග	50%

සෑම වාර්තාකරණ කාලසීමවක් අවසානයේ දීම වත්කමේ අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජනවත් ආයු කාලය උචිත පරිදි සමාලෝචනයකට ලක් කොට ගැලපීම් සිදු කෙරේ.

වත්කමක ධාරන අගය එහි ඇස්තමේන්තුගත අය කර ගත හැකි මුදලට වඩා වැඩි වන්නේ නම්, වත්කමක ධාරන අගය වහාම අය කර ගත හැකි මුදලට ලියා ගනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කරනු ලබන්නේ ඒවායේ වටිනාකමට සාපේක්ෂව වන අතර මෙහෙයුම් ලාභය නිශ්චය කිරීමේ දී එය සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් අලෙවි කරන විට අනෙකුත් සංචිතවල ඇතුළත් කර ඇති වටිනාකම් රඳවාගත් ඉපැයුම්වලට මාරු කරනු ලැබේ.

3.2.1.4. විකුණුම් පිරිවැය පහත දක්වා ඇත,

වැටුප් සහ වේතන	60%
සේවක අර්ථසාධක අරමුදල	60%
සේවක භාරකාර අරමුදල	60%
සංචාරය සහ යැපුම්	50%
වැඩසටහන් වියදම්	100%
සහන කාර්ය මණ්ඩලය	90%
වාහන කුලියට ගැනීමේ ගාස්තු	40%
නඩත්තු වියදම	40%
සබැඳි ගාස්තු	100%
පිටත කුළුණේ උස	100%
විදුලිය	75%
ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්	100%
කොමිස් මුදල (දේශීය)	100%
කොමිස් මුදල (විදේශීය)	100%

3.2.2 නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ යන්නෙන් වත්කමක් ඉදිකිරීමකට සෘජුවම ආශ්‍රිත ද්‍රව්‍යමය පිරිවැය සහ අනෙකුත් පිරිවැය නිරූපණය වේ. නොනිමි වැඩ සැලකිය යුතු මට්ටමකට සම්පූර්ණ කරනු ලැබූ විට දී සහ එහි අපේක්ෂිත භාවිතය සඳහා සූදානම් විට දී අදාළ වත්කම් ගිණුම්වලට මාරු කරනු ලැබේ.

3.2.3 මූල්‍ය වත්කම්

3.2.3.1. වර්ගීකරණය

3.2.3.2 ණය සහ ලැබිය යුතු දේ

ණය සහ ලැබිය යුතු දේ සක්‍රීය වෙළඳපොළ මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තාකරණ කාලසීමාව අවසානයේ දී මාස 12කට වඩා වැඩි කල්පිරීම් සඳහා හැරුණු

විට, ඒවා ජංගම වත්කම් හි ඇතුළත් කරනු ලැබේ. මේවා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සමාගමේ ණය සහ ලැබිය යුතු දේ ශේෂ පත්‍රයේ "වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දේ සහ "මුදල් සහ මුදල් සමාන දේ"වලින් සමන්විත වේ. (සටහන් 13 සහ 14)

3.2.3.3. පිළිගැනීම සහ මැනීම

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට දැක්වෙන මූල්‍ය වත්කම් ආරම්භයේ දී සාධාරණ වටිනාකමට පිළිගනු ලබන අතර ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හිලව් කොට දක්වනු ලැබේ. ආයෝජනවලින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය අවසන් වී ඇති විට දී හෝ හිමිකාරත්වයේ සියලුම අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලැබ ඇති විට දී මූල්‍ය වත්කම් පිළිගැනීම අවසන් කරනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම් පසුව සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ. සඵල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් ණය සහ ලැබිය යුතු දේ පසුව ක්‍රමක්ෂ කරන ලද මිලට දක්වනු ලැබේ.

ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම් කාණ්ඩයේ සාධාරණ වටිනාකමේ වෙනස්වීම්වලින් මතුවන ලාභ හෝ අලාභ ඒවා මතුවන කාලසීමාව තුළ 'අනෙකුත් (අලාභ)/ ලාභ – ශුද්ධ' හි අදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ.

කර ඇති මුදල් සහ මුදල් නොවන සුරැකුම්පත්වල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති සුරැකුම්පත් විකුණනු ලබන විට දී හෝ හානි වූ විට දී, ස්කන්ධයේ පිළිගනු ලබන සමුච්චිත සාධාරණ වටිනාකමේ ගැලපීම් 'ආයෝජන සුරැකුම්පත්වලින් ලාභ හෝ අලාභ' ලෙස ආදායම් ප්‍රකාශනයේ ඇතුළත් කරනු ලැබේ. සඵල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අලෙවියට තිබෙන සුරැකුම්පත් මත පොලිය අනෙකුත් ආදායමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය ඇති මුදල් සහ මුදල් නොවන සුරැකුම්පත්වල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් වෙනත් විස්තීරණ ආදායමක් තුළ හඳුනා ගැනේ. විකිණීමට ඇති ලෙස වර්ගීකරණය කර ඇති සුරැකුම්පත් විකුණා හෝ අඩාල වූ විට, කොටස්වල හඳුනාගෙන ඇති සමුච්චිත සාධාරණ අගය ගැලපීම් 'ආයෝජන සුරැකුම්පත්වල ලාභ සහ අලාභ' ලෙස ආදායම් ප්‍රකාශයේ ඇතුළත් වේ. ඵලදායී පොලී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරන ලද විකිණීමට ඇති සුරැකුම්පත් සඳහා වන පොලිය වෙනත් ආදායම්වල කොටසක් ලෙස ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

3.2.3.4 මූල්‍ය වත්කම් හානි

(අ) ක්‍රමක්ෂිත පිරිවැයට දැක්වෙන වත්කම්

සෑම වාර්තාකරණ කාලසීමාවක් අවසානයේ දීම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානිවීමේ වාස්තවික සාක්ෂි ඇත්දැයි යන්න සංස්ථාව විසින් තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී, හානි අලාභ දැරීමට සිදු වනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදු වන තනි හෝ බොහෝ සිද්ධීන් හි (හානි සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානි සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂි ඇත් නම්

සහ එම හානි සිද්ධිය (හෝ සිද්ධි) මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි ඇස්තමේන්තුගත අනුගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මැනිය හැකි බලපෑම් ඇති කරන්නේ නම් පමණි.

ණයගැතියෝ සහ ණයගැති සමූහයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳින බවට වන ඇඟවීම්, ඔවුන් වස්තු භංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රසංවිධානයක් සඳහා එළැඹීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම හා සහ සම්බන්ධ වන හිඟ මුදල් වෙනස්කම් හෝ ආර්ථික තත්ත්වයන් වැනි ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් හි මැනිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කිරීම ආදිය හානි පිළිබඳ සාක්ෂිවලට ඇතුළත් විය හැකිය.

ණය සහ ලැබිය යුතු දෑ කාණ්ඩය සඳහා, හානියේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමේ ධාරණ මුදල සහ මූල්‍ය වත්කමේ මුල් සඵල පොලී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන් හි (දැරීමට සිදුව නොමැති අනාගත ණය අලාභ හැර) වත්මන් වටිනාකම අතර වෙනස ලෙසයි. ඒකාබද්ධ ආදායම් ප්‍රකාශනයේ වත්කමෙහි ධාරණ මුදල අඩු කර අලාභයේ ප්‍රමාණය පිළිගනු ලැබේ. යම් ණයක හෝ කල් පිරීම දක්වා රඳවා ගත් ආයෝජනයක විචල්‍ය ණය අනුපාතයක් තිබෙන්නේ නම්, කිසියම් හානි අලාභ මැනීම සඳහා වට්ටම් අනුපාතය වනුයේ ගිවිසුම යටතේ නිශ්චය කර ඇති වර්තමානය වන විට ක්‍රියාත්මක පොලී අනුපාතයයි. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, නිරීක්ෂණය කළ හැකි වෙළඳපොළ මිලක් යොදා ගනිමින් සාධනපත්‍රයක සාධාරණ වටිනාකම් පාදකව සංස්ථාව හානිය මැනීමට ඉඩ තිබේ.

පසුව එළැඹෙන කාලසීමාවක දී, හානියෙන් සිදු වූ අලාභයේ ප්‍රමාණය අඩු වී එම අඩුවීම හානි වීම පිළිගැනීමෙන් පසුව සිදු වූ සිද්ධියකට වාස්තවිකව සම්බන්ධ වන්නේ නම්, (ණයහිමියාගේ ණය ප්‍රමාණ කිරීම වැඩි දියුණුවීමක් වැනි) කලින් පිළිගත් හානි වීමේ අලාභයක් ප්‍රතිවර්තනය ආදායම් ප්‍රකාශනයෙහි පිළිගනු ලැබේ.

3.2.3.5 වෙළඳ ලැබිය යුතු දේ

වෙළඳ ලැබිය යුතු දේ අපේක්ෂිත උපලබ්ධි කළ හැකි වටිනාකමට දක්වනු ලැබේ. ලැබිය යුතු දේ පිළිබඳ මුල් නියමයන් ප්‍රකාරව අයවිය යුතු සියලු මුදල් ප්‍රමාණ සංස්ථාවට එකතු කර ගැනීමට නොහැකි විය හැකි බවට වාස්තවික සාක්ෂි ඇති විට දී වෙළඳ අයවිය යුතු දේවල්වල හානිවීම් සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපනය කෙරේ. ණයගැතියා මුහුණ දෙන සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා, ණයගැතියා බුන්වත් භාවයට පත්වීම හෝ මූල්‍ය ප්‍රතිසංවිධානය සඳහා ඇති ඉඩකඩ ආදිය වෙළඳ ලැබිය යුතු දේ දුර්වල වී ඇති බවට දර්ශකයක් වශයෙන් සලකනු ලැබේ. දීමනා ගිණුමක් භාවිතා කිරීමෙන් වත්කමේ ධාරණ වියදම අඩු කරනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ බෙදාහැරීමේ පිරිවැය තුළ පාඩු මුදල් සහ දීමනා ගිණුමෙන් එය කපා හරිනු ලැබේ. කලින් කපා හරින ලද මුදල් පසුව එකතු කර ගැනීම් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ බෙදාහැරීමේ පිරිවැයට බාර කරනු ලැබේ.

වෙළඳ ලැබිය යුතු දේ ආරම්භයේ දී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන් පසුව ඒවා හානිවීම සහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු සඵල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැයට මනිනු ලැබේ.

3.2.4 වට්ටෝරු භාණ්ඩ

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි කළ අගයට වේ. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික ඇස්තමේන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් අඩු කිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලයි.

3.2.5 මුදල් සහ මුදල්වලට සමාන දේ

මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශනයේ මුදල් සහ මුදල්වලට සමාන දේ යන්නට අතැති මුදල්, බැංකුවල ඇති ඉල්ලුම් තැන්පතු මාස තුනක් හෝ ඊට අඩු මූලික කල්පිරීමක් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවක් ඇති ආයෝජන සහ බැංකු අයිරා අයත් වේ. මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ බැංකු අයිරා පෙන්වා දෙනු ලබන්නේ ජංගම වගකීම් තුළ ණයගැනුම් ලෙසයි.

3.2.6 ණයගැනුම් පිරිවැය

අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සූදානම් කිරීම සඳහා සැලකිය යුතු කාලසීමාවක් ගන්නා වත්කම් ලෙස සුදුසුකම් ලබන වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිෂ්පාදනය වෙත සෘජුවම ආරෝපණය සාමාන්‍ය හෝ නිශ්චිත ණය ගැනුම් පිරිවැය, එකී වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතාවට හෝ විකිණීමට සාරානුකූලව සුදානම් කරන කාලය තෙක් එම වත්කම්වල පිරිවැයට එකතු කරනු ලැබේ.

නිශ්චිත ණයගැනුම්වල තාවකාලික ආයෝජන මත උපයනු ලැබූ ආයෝජන ආදායම, සුදුසුකම් ලබන වත්කම මත ඒවායේ වියදම් තීරණය කරන තෙක් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ඇති ණයගැනුම් පිරිවැයෙන් අඩු කරනු ලැබේ.

අනෙකුත් සියලුම ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාලසීමාව තුළ ලාභ හෝ අලාභයන් හි පිළිගනු ලැබේ.

3.2.7 ජංගම සහ විලම්භිත බදු

අදාළ කාලසීමාව සඳහා බදු වියදම ජංගම සහ විලම්භිත බදුවලින් සමන්විත වේ. ආදායම් ප්‍රකාශය තුළ බදු පිළිගනු ලබන්නේ අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හෝ සෘජුවම කොටස්වල ගණන් ගනු ලබන අයිතමවලට ඒවා අදාළ වන ප්‍රමාණයට හැර ඉතිරි ප්‍රමාණයටයි. උක්ත කී ආකාරයට අනෙකුත් විස්තීර්ණ ආදායම්වල හෝ සෘජුවම කොටස්වල ද බදු ගණන් ගැනේ.

අ) ජංගම බදුකරණය

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධනවල විධිවිධාන අනුව සංස්ථාවට ජංගම බදු බැරකම් ඇති වේ. සැබෑ බැරකම් පිළිබිඹු කරන්නක් වශයෙන් කළමනාකාරීත්වය විශ්වාස කරන යථෝක්ත ප්‍රතිපාදන යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශනවල මෙම බැරකම් සඳහා ප්‍රතිපාදන සපයනු ලැබේ. ගනුදෙනු පිළිබඳව සංස්ථාව විසින් ගනු ලැබූ ස්ථාවරය ආදායම් අධිකාරීන් විසින් අභියෝගයට ලක් කරන අවස්ථා තිබිය හැකිය. මෙම

කරුණු හේතුවෙන් ඇති වන කවර හෝ අතිරේක පිරිවැයක් සංස්ථාව මත බැරකම තහවුරු කරන අවස්ථාවේ බදු වියදමක් ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

සලකා බලන වර්ෂය සහ කාලසීමාවන් සඳහා ජංගම බදු වත්කම් සහ බැරකම් මනිනු ලබන්නේ ආදායම් අධිකාරියට ආපසු අය කර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණවලිනි. ප්‍රමාණය ගණනය කිරීම පිණිස භාවිතා කළ බදු අනුපාත හෝ බදු නීති

වනුයේ ශේෂපත්‍ර දිනය වන විට පනවනු ලබන හෝ සැලකිය යුතු ලෙස පනවනු ලබන ඒවා වේ. ජංගම බදු සඳහා ප්‍රතිපාදන පදනම් වනුයේ මූල්‍ය ප්‍රකාශවල වාර්තා කර ඇති පරිදි ආදායම් සහ වියදම් අංග පදනම් කර ගනිමිනි.

ආ) විලම්භිත බදු

වත්කම් සහ බැරකම්වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්භිත බදු හඳුනාගනී. ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු අය කළ හැකි ලාභයට බලනොපාන ගනුදෙනුවක දී වත්කම් සහ බැරකම් ආරම්භක පිළිගැනීමෙන් මතුවන තාවකාලික වෙනස්කම් සහ පූර්ව අපේක්ෂිත අනාගතයේ ප්‍රවර්තනය නොවීමට ඉඩ ඇති ප්‍රමාණයට ආයෝජන ආශ්‍රිත වෙනස්කම් සඳහා විලම්භිත බදු බැරකම් පිළිගනු නොලැබේ. ඊට අමතරව, කීර්ති නාමය ආරම්භක පිළිගැනීම මත මතුවන බදු අය කළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා ද විලම්භිත බදු බැරකම් පිළිගනු නොලැබේ. වාර්තාකරණ දිනය වන විට පනවා ඇති හෝ සැලකිය යුතු ලෙස පැනවීමට ඉඩ ඇති නීති මත පදනම්ව තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය වන විට දී යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයන්ට විලම්භිත බදු ගණනය කෙරේ. ජංගම බදු බැරකම් සහ වත්කම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම් සහ එම බදු අය කළ හැකි අස්ථිත්වයට එහි බදු අධිකාරීන් විසින්ම අය කරනු ලබන ආදායම් බදුවලට ඒවා අදාළ වන්නේ නම් විලම්භිත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්භිත බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් උපයෝජනය සඳහා යොදා ගත හැකි අනාගත බදු අය කළ හැකි ලාභ ඇති විය හැකි තාක් දුරට පමණි. එක් එක් වාර්තාකරණ දිනයට විලම්භිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ උපලබ්ධිවීම තවදුරටත් සිදු නොවිය හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබේ.

3.2.8 සේවක ප්‍රතිලාභ

3.2.8.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම – විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිශ්චිත දායක සැලැසුමක් හැරුණු කොට පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මට අදාළව මූල්‍ය ප්‍රකාශනයේ පිළිගනු ලබන බැරකම වාර්තාකරණ දිනයට නිශ්චිත බැඳීමේ වත්කම් වටිනාකමයි. නිශ්චිත ප්‍රතිලාභ බැඳීමේ වත්මන් වටිනාකම් නිශ්චය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලා යාම වට්ටම් කිරීම මඟිනි.

ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකයන් හි සහ ආශ්‍රිත බැරකමේ කාලසීමාවන්ට සමීප වන්නාවූ කල්පිරීමේ කාල සීමා සහිත පොලී අනුපාත භාවිතා කරමින් ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 (2006 දී සංශෝධිත) අනුකූල වන පරිදි සියලුම ස්ථිර සේවකයින් සඳහා සේවයේ පළමු වසර සම්පූර්ණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂිකය සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේවුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත සමඟ සේවකයෙකු සඳහා වන

වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේ දී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයා ගනු නොලැබේ. කළමනාකාරීත්වය විසින් සලකා බලනු ලබන ආයු ගණකයේ ප්‍රධාන උපකල්පනයන්ට පහත දේ ඇතුළත් වේ:

01. 7.79.% ක පොලී අනුපාතය

02. 1.5% ක වැටුප් වර්ධක අනුපාතය

03. සියලුම සේවකයින්ගේ විශ්‍රාම යනු ලබන වයස අවුරුදු 60 කි.

04. කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය 2% කි.

ආ) නිශ්චිත දායක සැලසුම් – "සේවක අර්ථසාධක අරමුදල" සහ "සේවානියුක්තිකයින්ගේ භාර අරමුදල"

"සේවක අර්ථසාධක අරමුදලේ" දායකත්වය සහ "සේවානියුක්තිකයින්ගේ භාර අරමුදලේ" දායකත්වයට හිමිකම් ලබන සියලුම සේවකයින් අදාළ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාළ දායක අරමුදල්වලින් ආවරණය කෙරේ. නිශ්චිත දායක සැලසුම් සඳහා මුදල් දරන ලද අවස්ථාවේ දී ආදායම්

ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

3.2.9 රජයේ ප්‍රදාන

ප්‍රදානයට අදාළ කොන්දේසිවලට සංස්ථාව අනුකූල වන බවට සහ ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් තිබෙන්නේ නම් රජයේ ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට පිළිගනු ලැබේ.

පිරිවැයට අදාළ රජයේ ප්‍රදාන විලම්භනය කරනු ලබන අතර හානි පූර්ණය කිරීමට අපේක්ෂා කරනු ලබන පිරිවැය සමඟ ඒවා ගැලපීම පිණිස අවශ්‍ය කාල සීමාව මුළුල්ලේම විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ පිළිගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණවලට අදාළ රජයේ ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස ජංගම නොවන වගකීම්වලට ඇතුළත් කරනු ලබන අතර ආශ්‍රිත වත්කම්වල අපේක්ෂිත ආයු කාලය පුරා සරල රේඛීය පදනමක් මත ආදායම් ප්‍රකාශනයට බැර කරනු ලැබේ.

ක්‍රමක්ෂ අනුපාත පහත දක්වා ඇත.

ගොඩනැගිලි	2.5%
පිරියත සහ යන්ත්‍රසූත්‍ර	7.5%
ශ්‍රව්‍ය සංඛ්‍යාත උපකරණ	7.5%
ගෘහභාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ	10%
සම්ප්‍රේෂක	7.5%
මෝටර් වාහන	25%
පරිගණක උපකරණ	50%
මෘදුකාංග	50%

3.2.10 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික හෝ සම්මුතික බැඳීමක් සංස්ථාව සතුව ඇති විට එකී බැඳීම් පියවනු වස් ආර්ථික ප්‍රතිලාභ මූර්තිමත් කරමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය වන විටක දී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදු කළ හැකි වන විට ප්‍රතිපාදන හඳුනා ගනී.

3.2.11 අසම්භාව්‍ය බැරකම් සහ අසම්භාව්‍ය වත්කම්

අසම්භාව්‍ය බැරකමක් යනු සංස්ථාවේ පාලනයෙන් බැහැර වන අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් ක්‍රියාත්මක වීම හෝ ක්‍රියාත්මක නොවීම මඟින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් හෝ එකී බැඳීම්වලින් නිදහස්වීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදුවීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදුවීමේ ශක්‍යතාවක් නොමැති බැවින් නොපිළිගැනෙන වර්තමාන බැඳීමකින් හෝ උද්ගතවීමට හැකියාවක් ඇති බැඳීමකි. විශ්වාසනීය ලෙස මැනිය නොහැකි බැරකමක් පවතින බෙහෙවින් දුරලභ අවස්ථාවන්හි දී ද බැරකමක් හඳුනා නොගන්නා නමුත් එවැන්නක පැවැත්ම මූල්‍ය ප්‍රකාශවලින් අනාවරණය කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර අවිනිශ්චිත අනාගත සිදුවීම්වලින් පැන නැඟිය හැකි වැඩි සංඛ්‍යාවක් ඇතිවීමකින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම්වලින් පැන නැගීමට ඉඩ ඇති වත්කමකි. සංස්ථාව අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා නමුත් ආර්ථික ප්‍රතිලාභ ඇතුළට ගලා ඒම් සිදුවිය හැකි වුවත් එය සැබවින්ම ස්ථීර නොවන අවස්ථාවල දී එවැනි දේවල්වල පැවැත්ම අනාවරණය කරයි.

3.2.12 වෙළඳ ගෙවිය යුතු දේ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල දී සැපයුම්කරුවන්ගෙන් ලබා ගන්නා ලද භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් ගෙවීම් කිරීමට ඇති බැඳීම් වේ. ගෙවීම් කළ යුතු වන්නේ වසරක් හෝ ඊට අඩු කාලයක් තුළ නම් (හෝ ඊට වඩා කාලය දිගු වන්නේ නම් ව්‍යාපාරයේ සාමාන්‍ය මෙහෙයුම් චක්‍ර තුළ දී) ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකමක් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

වෙළඳ ගෙවිය යුතු දේ ආරම්භයේ දී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන් අනතුරුව සඵල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂ පිරිවැයට මනිනු ලැබේ.

3.2.13 මූල්‍ය කල්බදු බැඳීම්

කල්බදු ගත් අයිතමවල හිමිකමට ආනුශංගික සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සංස්ථාවට පවරන්නා වූ මූල්‍ය කල්බදු මත ලබාගත් දේපළ, පිරියත සහ උපකරණ අදාළ කල්බදු ආරම්භයේ දී කල්බදු ගත් දේපළේ සාධාරණ වටිනාකමට හෝ වඩා අඩු නම් සමුච්චිත ක්ෂයවීම් අඩු කොට ආරම්භයේ දී අවම කල්බදු ගෙවීමේ වටිනාකමේ වර්තමාන අගයට ප්‍රාග්ධනිත (pragdhanaitha) කරනු ලැබේ.

ගෙවිය යුතු මුළු පොලිය අවිනිශ්චිත පොලියක් ලෙස ගිණුම්ගත කරනු ලැබේ. අනුරූපී ණය බදුදීමනාකරුට ගෙවිය යුතු ණය මුදලක් ලෙස වාර්තා කරනු ලැබේ. ගෙවන ලද වාරික බැරකම අඩු කිරීම සඳහා යොදා ගනු ලැබේ.

වර්ෂයට අය කරන පොලිය පොලී සඳහා වන අවිනිශ්චිත ගිණුමෙන් ආදායම් ප්‍රකාශනයට මාරු කරනු ලැබේ.

3.2.14 ආදායම් ප්‍රකාශනය

3.2.14.1 ආදායම පිළිගැනීම

ලැබුනු හෝ ලැබිය යුතු ප්‍රතිශ්ඨාවේ සාධාරණ වටිනාකමට අනුව ආදායම ගණනය කිරීම සිදු කරනු ලබන අතර සපයන ලද සේවා වෙනුවෙන් ලැබිය යුතු මුදල් ප්‍රමාණ පෙන්නුම් කරන අතර වට්ටම් සහ වටිනාකම එකතු කළ බදු අඩු කොට සඳහන් කරනු ලැබේ. ආදායම් ප්‍රමාණ විශ්වාසනීය ලෙස ගණනය කළ හැකි විට දී අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ප්‍රවාහය වීමට ප්‍රස්ථාව ඇති විට දී සහ සංස්ථාවේ එක් එක් ක්‍රියාකාරකම් සඳහා නිශ්චිත නිර්ණායක සපුරා ඇති විට දී සංස්ථාව ආදායම පිළිගනී. පහත විස්තර කර ඇති පරිදි ගනුදෙනුකරුගේ ස්වරූපය, ගනුදෙනු වර්ගය සහ එක් එක් සැකැස්මේ නිශ්චිත තොරතුරු සැලකිල්ලට ගනිමින් සංස්ථාව සිය ප්‍රතිලාභ ඇස්තමේන්තු ඓතිහාසික ප්‍රතිඵල මත පදනම් කර ගනී.

(අ) ගුවන් කාල අලෙවි කිරීම

ගුවන් කාලය අලෙවියෙන් ලැබෙන මුදලින් ආදායම සමන්විත වේ. වෙළඳ දැන්වීම් ප්‍රචාරය වන ගුවන් කාලය විකිණීමෙන් ලැබෙන ආදායම මෙසේ පිළිගනු ලැබේ.

(ආ) පොලී ආදායම

එකතු කර ගැනීමට හැකි බව පිළිබඳව සැකයක් ඇත්තේ නම් මිස කාල පදනමින් උපචිත වූ පොලිය (වත්කමේ සඵල ඵලදාව සැලකිල්ලට ගනිමින්) පොලී ආදායම ලෙස පිළිගනු ලැබේ.

(ඇ) දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලැබීම් සහ අලාභ

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කිරීම මත ශුද්ධ ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් මුදල් දේපළ, පිරියත සහ උපකරණවල ධාරණ වටිනාකම සැසඳීමෙන් වන අතර ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

(ඈ) වෙනත් ආදායම

අනෙක් සියලුම ආදායම් පිළිගනු ලබන්නේ උපචිත පදනම මත වේ.

3.2.15.1 වියදම් පිළිගැනීම

(අ) මෙහෙයුම් වියදම්

ආදායම් ප්‍රකාශනයේ වියදම් පිළිගනු ලබන්නේ දරන ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම අතර සෘජු සබඳතා පදනම මත වේ. ව්‍යාපාරය පවත්වා ගෙන යාමේ දී සහ කාර්යක්ෂම තත්ත්වයක් තුළ දේපළ, පිරියත සහ උපකරණ නඩත්තු කිරීමේ දී දරනු ලබන සියලුම වියදම් වර්ෂයේ ලාභ / (අලාභ) නිගමනය කිරීමේ දී ආදායමෙන් අඩු කරනු ලැබ ඇත. බොල් සහ අඩමාන ණය, දන්නා සියලුම බැරකම් සහ දේපළ, පිරියත සහ උපකරණ මත ක්ෂයවීම් සඳහා ද ප්‍රතිපාදන සලසා ඇත.

(ආ) මූල්‍ය වියදම්

පොලී වියදම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ. ණය ගැනීමේ පිරිවැය ඒවා දරන ලද කාලසීමාවේ දී වියදමක් ලෙස පිළිගනු ලැබේ.

3.2.16 තුලනාත්මක සංඛ්‍යා

අවශ්‍ය අවස්ථාවල දී ප්‍රවර්ථන වර්ෂය තුළ දී කරනු ලබන ඉදිරිපත් කිරීම්වලට අනුකූල වනු පිණිස තුලනාත්මක සංඛ්‍යා ගලපනු ලැබ ඇත.

4. තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම්වල වාර්තාකර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කළමනාකාරීත්වයට සිදු වේ. කෙසේවුව ද මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිතභාවය, අනාගත කාල සීමාවන් හි සිදු කරනු ලබන වත්කම් හෝ බැරකම්වල ධාරණ වටිනාකමට ද්‍රව්‍යමය වෙනස්කම් අවශ්‍ය කරන්නා වූ ප්‍රතිඵල ඇති කිරීමට හැකිය.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් පහසුවෙන් හඳුනා ගත නොහැකි වත්කම්, බැරකම් සහ අසම්භාව්‍ය බැරකම්වල ධාරණ ප්‍රමාණ සම්බන්ධයෙන් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමේ දී පදනම සකස් කරන්නා වූ අවස්ථානුකූල තත්ත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරනු ලබන අනෙකුත් විවිධ සාධකවල ප්‍රතිඵල මත පදනම් වී ඇත.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රතිශෝධන, එකී ප්‍රතිශෝධන වර්තමාන සහ අනාගත කාල සීමාවන් සඳහා බලපාන්නේ නම් එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන කාලසීමාවේ දී පිළිගනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති භාවිතා කිරීමේ දී කළමනාකාරීත්වය විසින් සිදු කරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශන කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය.

(අ) විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම බැඳීම්වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ආයු ගණක පදනමක් මත නිර්ණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. විශ්‍රාම වැටුප් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) නිශ්චය කිරීමේ දී යොදා ගනු ලබන උපකල්පනවලට වට්ටම් අනුපාතය ඇතුළත් වේ. මෙම උපකල්පනවල කවර හෝ වෙනසක් විශ්‍රාම වැටුප් බැඳීම්වල ධාරණ මුදල් ප්‍රමාණය කෙරෙහි බලපානු ඇත.

යෝග්‍ය වට්ටම් අනුපාතය සෑම වසරක් අවසානයේ දීම සංස්ථාව මඟින් නිශ්චය කරනු ලැබේ. විශ්‍රාම වැටුප් බැඳීම් පියවීමට අවශ්‍ය යැයි අපේක්ෂා කරනු ලබන අනාගත මුදල් ගලායාම්වල වර්තමාන වටිනාකම නිශ්චය කිරීම සඳහා භාවිතා කළ යුතු පොලී අනුපාතය වන්නේ මෙයයි. යෝග්‍ය වට්ටම් අනුපාතය නිශ්චය කිරීමේ දී සංස්ථාව ආයතනික බැරකම්වල පොලී අනුපාත සැලකිල්ලට ගනී. විශ්‍රාම වැටුප් බැඳීම් අනෙකුත් ප්‍රධාන උපකල්පන වත්මන් වෙළඳපොළ තත්ත්වයන් මත ද අර්ධ වශයෙන් පාදක වේ.

(ආ) ආදායම් බදු

සංස්ථාව ආදායම් බදුවලට යටත් වේ. ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය නිශ්චය කිරීමේ දී සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය වේ. බොහෝ ගනුදෙනු සහ ගණනය කිරීම් ඇති අතර ඒ සඳහා අවසාන බදු නිශ්චය කිරීම අවිනිශ්චිතය. අතිරේක බදු ලැබීමට නියමිත ද යන්න පිළිබඳ ඇස්තමේන්තු මත පාදකව අපේක්ෂිත බදු විගණන ගැටළු සඳහා සංස්ථාව බැරකම් පිළිගනු ලැබේ. මෙම කරුණුවල අවසාන බදු ප්‍රතිඵලය ආරම්භයේ

දී වාර්තා කළ ප්‍රමාණයන්ට වඩා වෙනස්වන විට දී එම වෙනස්කම් එවැනි නිශ්චය කිරීම් සිදු කරනු ලැබූ කාල සීමාව තුළ ජංගම සහ විලම්භිත ආදායම් බදු වත්කම් සහ බැරකම් කෙරෙහි බලපානු ඇත.

5. මූල්‍ය අවදානම් කළමනාකරණය

5.1 මූල්‍ය අවදානම් සාධක

සංස්ථාවේ ක්‍රියාකාරකම් එම ආයතනය විවිධ මූල්‍ය අවදානම්වලට නිරාවරණය කරයි: (ව්‍යවහාර මුදල් අවදානම, සාධාරණ වටිනාකම පොලී අනුපාත අවදානම, මුදල් ප්‍රවාහ පොලී අනුපාත අවදානම සහ මිල අවදානම ඇතුළු) වෙළඳපොළ අවදානම, ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම මෙම අවදානම් වේ. සංස්ථාවේ සමස්ත ණය කළමනාකරණ වැඩසටහන් සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය මත අහිතකර බලපෑම් ඇති කළ හැකි අහිතකර ප්‍රතිඵල අවම කිරීමට ඉලක්කගත වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති යටතේ මූල්‍ය අංශය විසින් අවදානම් කළමනාකරණය සිදු කරනු ලබයි.

අ) වෙළඳපොළ අවදානම්

(i) විදේශ විනිමය අවදානම

සංස්ථාව තමන්ට අවශ්‍ය උපකරණ ජාත්‍යන්තරව ආනයනය කරන අතර මූලිකව ඇමෙරිකානු ඩොලරයේ වටිනාකමට අදාළව ව්‍යවහාර මුදල් නිරාවරණය මඟින් මතුවන විදේශ විනිමය අවදානම්වලට නිරාවරණය වේ. අනාගත වාණිජ ගනුදෙනුවලින් සහ පිළිගත් වත්කම් සහ බැරකම්වලින් මතු වන සිය විදේශ විනිමය අවදානම් කළමනාකරණය කිරීම පිණිස සමාගම දේශීය නියෝජිතයින් සමඟ ගිවිසුම්වලට එළැඹේ.

(ii) මිල අවදානම

වෙළඳ භාණ්ඩ මිල අවදානමට සංස්ථාව නිරාවරණය වේ. ප්‍රධාන සැපයුම්කරුවන් සමඟ ගිවිසුම්වලට එළැඹීම මඟින් සංස්ථාව අවදානම් අවම කරයි.

iii) ණය අවදානම්

ණය අවදානමට නිරාවරණය වනුයේ මූලිකවම වෙළඳ ලැබිය යුතු දේ වලින් වන අතර සේවා සැපයීමට පෙර සිය නව ගනුදෙනුකරුවන් සෑම කෙනෙක් සඳහාම ණය අවදානම කළමනාකරණය කිරීමේ සහ විශ්ලේෂණය කිරීමේ වගකීම සංස්ථාව සතුය.

ණය අවදානම මතු වනුයේ මුදල් සහ මුදල්වලට සමාන දේ, බැංකු සහ මූල්‍ය ආයතනවල ඇති තැන්පතු මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ලැබිය යුතු දේ සහ වාණිජ ගනුදෙනු වෙත නිරාවරණය විමි මඟිනි. බැංකු සහ මූල්‍ය ආයතන සඳහා ස්වාධීනව ශ්‍රේණිගත කරනු ලැබූ අවම වශයෙන් 'ඒ' ශ්‍රේණිගත කිරීම සහිත පාර්ශ්ව පමණක් පිළිගනු ලැබේ. අවදානම් පාලනය ගනුදෙනුකරුගේ මූල්‍ය තත්ත්වය, අතීත අත්දැකීම් සහ අනෙකුත් සාධක සැලකිල්ලට ගනිමින් ණය ගුණාත්මය තක්සේරු කරනු ලැබේ. අභ්‍යන්තර හෝ බාහිර ශ්‍රේණිගත කිරීම් මත පාදකකව කේවල ණය සීමා පනවනු ලැබේ. ණය සීමා උපයෝජනය නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ.

iv) ද්‍රවශීලතා අවදානම්

සංස්ථාව විසින් මූල්‍ය ප්‍රවාහ පූරෝකථනය සිදු කරනු ලබන අතර සංස්ථාවේ ද්‍රවශීලතා අවශ්‍යතා සහතික කිරීම පිණිස නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ. එබඳු පුරෝකථනවල දී සංස්ථාවේ ණය මූල්‍යකරණ සැලසුම්, ප්‍රඥප්ති අනුකූලතාව සැලකිල්ලට ගනු ලැබේ. කාරක ප්‍රාග්ධන කළමනාකරණය සඳහා අවශ්‍ය කරනු ලබන ශේෂයට වඩා සහ ඉහළින් සංස්ථාව විසින් රඳවා ගෙන ඇති අතිරික්ත මුදල්, බැඳීම් සපුරාලීම සඳහා යෝග්‍ය කල් පිරීම් සහිත පොලී ආදායම් උපයනු පිණිස කාල තැන්පතුවලට මාරු කරනු ලැබේ.

6. ආශ්‍රිත පාර්ශ්ව ගනුදෙනු

සම්බන්ධතාවයේ නම	තනතුර	ගනුදෙනු ස්වභාවය	කාලසීමාව
හඩිසන් සමරසිංහ මහතා	සභාපති	නැත	2021.06.25 – 2022.12.31
මහාචාර්ය. සුනන්ද මද්දුම බණ්ඩාර	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත	2022.01.07 – 2022.05.05
කේ.සී.ඒ . සිල්වාමහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත	2022.02.07 – 2022.05.05
ඩබ්ලිව්.පී.සෙව්වන්දි මහත්මිය	අමාත්‍යාංශ සාමාජික	නැත	2021.01.22 – 2022.05.05
ප්‍රියන්ත කේ රත්නායක මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත	2022.06.13 – 2022.12.31
එම්.ඒ.සී.සිසිර කුමාර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත	2022.01.29 – 2022.12.31
ජේ.යෝගරාජ් මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත	2022.06.13 – 2022.12.31
මාගම්මන පද්මනන්ද හිමි	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත	2022.06.13 – 2022.06.23
දුනිල් හෙයියන්තුඩුව මහතා	අමාත්‍යාංශ සාමාජික	නැත	2022.06.28 – 2022.12.31
ජී.එම්.ජේ.කේ.ගුණවර්ධන මහතා	භාණ්ඩාගාර සාමාජික	නැත	2020.01.17 – 2022.02.24
ගීතා විමලවීර මහත්මිය	භාණ්ඩාගාර සාමාජික	නැත	2022.03.02 – 2022.05.05
ඩී.සී.ඩබ්ලිව්.හපුගොඩ මිය	භාණ්ඩාගාර සාමාජික	නැත	2022.11.22 – 2022.12.31

1 සටහන

ආදායම

විස්තරය	2022	2021ගලපන ලද	ගැලපුම්	2021	2020
ආසියානු සේවයේ ගුවන් කාලය අලෙවිය	11,812,630	7,437,060		7,437,060	8,070,458
ගුවන් කාලය අලෙවිය T.W.R.	96,910,536	99,044,845		99,044,845	97,178,959
ගුවන් කාලය අලෙවිය ප්‍රාදේශීය සේවය	417,789,393	440,631,760	2,074,425	438,557,335	325,396,142
නිෂ්පාදන ගාස්තු- ප්‍රාදේශීය සේවය	8,231,494	6,951,071		6,951,071	5,503,824
ආදායම ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය	145,742,997	77,886,600		77,886,600	102,146,029
මරණ දැන්වීම්	1,599,505	891,237		891,237	1,522,215
ගුවන් කාලය අලෙවිය FEBA					5,274,763
	682,086,556	**632,842,573**	**2,074,425**	**630,768,148**	**545,092,393**

2 වැනි සටහන

විකුණුම් පිරිවැය

විස්තරය	2022	2021	2020
වැටුප්, වේතන සහ දීමනා	270,796,111	269,168,814	273,815,167
සේවක අථර්සාධක අරමුදල	38,812,998	41,588,028	35,844,738
සේවක භාරකාර අරමුදල	8,453,305	8,367,114	6,698,158
ප්‍රවාහනය හා යැපුම් දීමනා	807,977	1,421,163	1,434,142
වැඩසටහන් ගාස්තු	4,932,619	4,058,451	3,961,000
සහන පදනම් මත සේවය කළ කාර්ය මණ්ඩලය	30,689,358	31,977,685	5,874,748
වාහන කුලී ගාස්තු	5,120,108	4,595,302	6,870,037
නඩත්තු පිරිවැය	10,534,789	4,674,739	4,339,134
සම්බන්ධ කිරීමේ ගාස්තු	4,166,404	4,086,702	3,678,032
පිටත කුළුණු සඳහා කුලිය	9,026,614	7,662,685	6,762,828
විදුලිය	114,638,879	114,865,425	149,259,683
ව්‍යාපාර ප්‍රවර්ධන වියදම	572,845	1,960,850	1,212,878
ගුවන් කාලය විකිණීමේ කොමිස් මුදල (දේශීය)	55,165,315	59,823,804	36,824,755
ගුවන් කාලය විකිණීමේ කොමිස් මුදල (විදේශීය)	1,793,686	1,090,557	1,033,268
	555,511,008	**555,341,319**	**537,608,568**

3 සටහන

වෙනත් මෙහෙයුම් ආදායම

විස්තරය	2022	2021ගලපන ලද	ගැලපුම්	2021	2020
ණය මත පොලිය	13,588,685	6,285,714		6,285,714	9,379,335
විවිධ ආදායම (වෙනත්)	88,874,676	69,286,746	(765,600)	70,052,346	51,157,051
ආපසු හරවා එවූ චෙක්පත් සඳහා ප්‍රතිචාරණ නියෝජිතයින්ගෙන් අය	30,555	13,643		13,643	2,053
නිවාස කුලී	39,726	39,713		39,713	194,426
සංචාරක බංගලාවලින් ආදායම	355,465	66,941		66,941	236,636
විශේෂ පටිගත කිරීම්	923,231	285,037		285,037	281,204
හුවමාරුවේදී ලාභ/අලාභ	15,160,751	-			
ආනයනකරුවන්ට, අලෙවිකරුවන්ට බලපත්‍ර ලබා දීම	6,620,000	7,345,000		7,345,000	6,044,630
කැසට් පට විකිණීම්	1,097,025	742,711		742,711	1,473,624
Fine Account	73,551	25,250		25,250	94,076
සංචාරක බංගලාවලින් ආදායම්-අඹේවෙල	55,000	120,402		120,402	136,465
ප්‍රකාශන අලෙවිය	85,303	78,533		78,533	46,018
උප-එකතුව	**126,903,968**	**84,289,690**	**(765,600)**	**85,055,290**	**69,045,519**
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය	82,800,331	100,322,193		100,322,193	121,987,376
ත්‍රිකුණාමලය ප්‍රදානය ක්‍රමක්ෂය	154,628,399	155,406,674		155,406,674	155,406,674
උප-එකතුව	**237,428,730**	**255,728,867**	**-**	**255,728,867**	**277,394,050**
මුළු එකතුව	**364,332,698**	**340,018,557**	**(765,600)**	**340,784,157**	**346,439,569**

3.1 සටහන

රජයේ ප්‍රදාන

විස්තරය	2022	2021	2020
බලපත්‍ර ගාස්තු සඳහා රජයේ ප්‍රදාන		345,000,000	440,000,000
	-	**345,000,000**	**440,000,000**

04 සටහන

බෙදාහැරීමේ පිරිවැය

විස්තරය	2022	2021	2020
බොල් ණය හා අඩමාන ණය සඳහා වෙන්කිරීම	13,798,736	6,245,224	5,027,070
වැඩසටහන් වියදම් (**ක්‍රි**කට් හා කලාකරුවන්)	1,512,500	7,764,013	1,404,000
	15,311,236	**14,009,237**	**6,431,070**

05 සටහන

වෙනත් මෙහෙයුම් වියදම්

විස්තරය	2022	2021ගලපන ලද	ගැලපුම්	2021	2020
බාහිර විකාශන ආයතන වෙත දායකත්වය	1,835,422	1,680,898		1,680,898	985,265
ප්‍රවෘත්ති සේවාව හා **ප්‍ර**වෘත්ති සාරාංශ	262,610	351,858		351,858	215,225
වෙළඳ දැන්වීම් හා **ප්‍ර**චාරණය	7,946,340	380,439		380,439	114,698
විදුලිය හා බලශක්තිය	32,153,914	38,433,767	145,292	38,288,475	15,677,381
තැපැල් ගාස්තු හා දුරකථන ගාස්තු	10,693,881	11,719,576		11,719,576	12,905,230
මුද්‍ර**ණ** කටයුතු හා ලිපි **ද්‍රව්‍ය**ය	4,596,794	3,415,856		3,415,856	3,834,716
මුද්‍ර**ණ** **ප්‍ර**කාශනයේ පිරිවැය	2,525	-			
මෝටර් රථ ධාවන වියදම්	9,901,160	11,742,671		11,742,671	11,948,043
විකාශන උපකරණ අළුත්වැඩියා හා නඩත්තු	12,606,191	7,012,110		7,012,110	17,804,304
සංගීත උපකරණ අළුත්වැඩියාව හා නඩත්තු		-			35,000
ගෘහභාණ්ඩ තිරවුරු හා සවිකිරීම් අළුත්වැඩියාව හා නඩත්තුව	5,179,032	5,434,134		5,434,134	4,145,812
ගොඩනැගිල්ල හා ගෙවත්ත අළුත්වැඩියාව හා නඩත්තුව	6,252,240	5,968,262		5,968,262	6,961,806
ක්ෂයවීම්	75,053,883	88,849,849	11,311	88,838,538	104,888,121
ක්ෂයවීම් **ක්‍රි**කුණාමලය	159,851,496	160,774,772		160,774,772	161,174,772
මෘදුකාංග **ක්‍ර**මක්ෂය		4,382,527		4,382,527	5,476,477
කැසට්පට වියදම	196,667	912,700		912,700	1,575,001
බදුකරණය (ESC)		-			
සමාජ ආරක්ෂණ දායක බද්ද	3,181,464	-			
මෝටර් රථ කුලී ගාස්තු	7,724,512	6,892,952		6,892,952	4,768,067
මුද්දර ගාස්තු	5,120,677	41,325		41,325	23,644
පාඨමාලා ගාස්තු වියදම්	2,259,514	2,077,389		2,077,389	1,360,088
ඉවත්විදුලි සං**ඛ්‍යා**න ගාස්තු	6,153,660	4,974,300		4,974,300	5,562,900
	350,971,983	**355,045,386**	**156,604**	**354,888,782**	**359,456,549**

06 සටහන

පරිපාලන වියදම්

විස්තරය	2022	2021ගලපන ලද	ගැලපුම්	2021	2020
දීමනාව - සංස්ථාවේ සභාපති සහ සංස්ථා සාමාජිකයින්	1,116,000	1,322,335		1,322,335	1,525,610
වැටුප් චේතන හා දීමනා	180,530,741	179,445,877		179,445,877	203,136,695
විශේෂ දිරිදීමනා		-			
සේවක අථර්සාධක අරමුදල	25,647,391	27,725,352		27,725,352	36,766,071
සේවක භාරකාර අරමුදල	4,526,299	5,578,075		5,578,075	7,903,460
කාර්ය මණ්ඩලය සඳහා අතිකාල දීමනා	16,465,740	29,375,582		29,375,582	39,268,908
සහන පදනම මත සේවයෙහි නියුතු කාර්ය මණ්ඩලය	3,156,268	3,553,076		3,553,076	16,229,545
කොන්**ත්‍රා**ත් කාර්ය මණ්ඩලය සඳහා චේතන	55,276,335	54,421,871	525,792	53,896,079	49,070,315
කාර්ය මණ්ඩල පුහුණු ගාස්තු (දේශීය)		-			
ප්‍රවාහන හා යැපුම් දීමනා -(විදේශීය හා දේශීය)	965,173	1,421,163		1,421,163	556,145
නිවාඩු දින වැටුප්	2,680,643	3,440,160		3,440,160	3,009,004
පාරිතෝෂිකය	36,341,450	35,606,070	(952,935)	36,559,005	29,670,376
සභාපතිවරයා කළ සං**ග්‍ර**හ දීමනා	238,569	402,019		402,019	322,057
අ**ධ්‍යක්ෂ** ජනරාල්වරයා කළ සං**ග්‍ර**හ දීමනා	133,368	81,752		81,752	65,076
සුභසාධනය	2,983,549	5,442,818		5,442,818	4,107,953
වෛ**ද්‍ය** සේවාව		226,055		226,055	45,060
පොදු වියදම්	1,235,297	2,256,016		2,256,016	1,122,960
පුද්ගලික ආරක්ෂක සේවාව	7,096,400	13,365,700		13,365,700	8,300,000
කුලී වරිපනම් හා බදු	8,795,919	6,362,907		6,362,907	16,154,052
රක්ෂණය	4,703,575	4,838,239		4,838,239	4,651,321
විගණන ගාස්තු	1,680,000	1,428,000		1,428,000	1,428,000
නෛතික ගාස්තු	2,042,065	1,336,487	(181,000)	1,517,487	615,487
ප්‍රකාශන හා වාර සඟරා	180,988	244,790		244,790	408,090
පාරිතෝෂිකය, නඩු හා වෙනත් කටයුතු සඳහා දඩ	22,502	-			1,500
	355,818,272	**377,874,344**	**(608,143)**	**378,482,487**	**424,357,685**

6.6.1) 2022 වර්ෂය සඳහා ඥාති කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ විකාශන මරණ දැන්වීම සම්බන්ධයෙන් සංස්ථාව රුපියල් 165,400.00 ක් දරන ලදී. මෙය සංස්ථාව විසින් සෑම වසරකම අනුගමනය කරන ලද පිළිවෙත විය.

පොරොත්තු නීතිමය නඩු – 2022

ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු දෙකක් විභාග වෙමින් පවතී. මෙම නඩු වල තත්වය පහත පරිදි වේ:
23089/MR නඩුවේ ඩී.සී. නඩුවේ තීන්දුව ප්‍රතික්ෂේප කරන ලෙසට සංස්ථාව විසින් ගොනු කරන ලද අභියාචනයකි. 10,000,000/- ඩී.සී නඩුවේ පැමිණිලිකරු සඳහා නීතිමය පොලී සමග. අභියාචනාධිකරණයේ නඩු තුනක් විභාග වෙමින් පවතී. එකක් නාවලපිටිය මහ නගර සභාවේ තීන්දුව නිෂ්ප්‍රභ කරන ලෙසට සංස්ථාව ගොනු කළ අභියාචනයකි. නඩු අංක 64296/-.

මහාධිකරණයේ නඩු දෙකක් විභාග වෙමින් පවතී. දිසා අධිකරණයේ නඩු පහක් විභාග වෙමින් පවතින අතර නඩු දෙකක තත්ත්වය පහත පරිදි වේ.

එක නඩුවකට රු. මිලියන 8 + පොලිය සහ අනෙකුත් ඉල්ලීම් රු. 5,917,275/- + පොලිය සහ 10% කොමිස් මුදල US$ 26,775 සිට. කම්කරු විනිශ්චය සභාවේ එක් නඩුවක් විභාග වෙමින් පවතී. මහේස්ත්‍රාත් අධිකරණයේ නඩු හයක් සහ කම්කරු දෙපාර්තමේන්තුවේ බෙරුම්කරණයේ නඩු දෙකක් විභාග වෙමින් පවතී.

මූල්‍ය ප්‍රකාශනවල රු.11,783,507.20 (10,000,000 + 1,783,507.20) ලෙස ප්‍රතිපාදන සලසා ඇත.

07 සටහන

මූල්‍ය පිරිවැය

විස්තරය	2022	2021	2020
බැංකු ගාස්තු	987,386	466,423	447,513
අයිරා පොලිය	4,160,881	3,585,758	5,265,923
විනිමය ලාභය/(පාඩු)			213,424
ණයවරපත් සඳහා කොමිස් මුදල	47,051	51,422	57,317
	5,195,318	**4,103,603**	**5,984,176**

08 සටහන

8 (i) ආදායම් බදු

	2022			2021			2020		
ගිණුම් අනුව ශුද්ධ ලාභය/ අලාභය			(236,388,563)			(335,713,724)			(442,306,087)
අඩු									
පොලී ආදායම		(13,588,685)	(13,588,685)		(6,285,714)	(6,285,714)		(9,379,335)	(9,379,335)
			(249,977,247)			(341,999,438)			(451,685,422)
එකතු කරන්න: අනුමත කළ නොහැකි වියදම්									
ක්ෂයවීම		75,053,883			88,838,538			104,888,121	
ක්ෂයවීම ත්‍රිකුණාමලය		159,851,496			160,774,772			161,174,772	
බොල් ණය සඳහා ප්‍රතිපාදන		13,798,736			6,245,224			5,027,070	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		36,341,450			36,559,005			29,670,376	
සත්කාරක සේවා		371,937			483,771			387,133	
නීති ගාස්තු		2,042,065			1,517,487			615,487	
දඩය		22,502			-			1,500	
මුද්දර ගාස්තු		5,120,677	292,602,745		41,325	294,460,122		23,644	301,788,103
									(149,897,319)
			42,625,498			(47,539,316)			
අඩු කිරීම									
ඉඩදිය හැකි වියදම්									
ප්‍රාග්ධන දීමනාව		(104,425,232)			(107,651,180)			(107,847,791)	
පාරිතෝෂික ගෙවීම		(29,222,219)	(133,647,451)		(52,071,185)	(159,722,365)		(41,206,888)	(149,054,679)
ව්‍යාපාර පාඩු			(91,021,953)			(207,261,681)			(298,951,998)
ආයෝජන ආදායම් ගණනය කිරීම									
පොලී ආදායම		13,588,685	13,588,685		6,285,714	6,285,714		9,379,335	9,379,335
නක්සේරු කළ හැකි ආදායම් ගණනය කිරීම									
ව්‍යාපාර ආදායම්/(අලාභය)			(91,021,953)			(207,261,681)			(298,951,998)
ආයෝජන ආදායම			13,588,685			6,285,714			9,379,335
ඒ මත බදු									
ව්‍යාපාර ආදායම්/(අලාභය)			-					-	
ආයෝජන ආදායම	13,588,685	0.24	3,261,284	6,285,714	24%	1,508,571	9,379,335	28%	2,626,214
ගෙවිය යුතු බදු			(3,261,284)			(1,508,571)			(2,626,214)
විලම්බිත බදු			63,739,353			46,706,941			3,901,917
බදු වගකීම			60,478,069			45,198,370			1,275,703

ආදායම් බදු සඳහා ප්‍රතිපාදන

ආදායම් තුළින් ලබා ගන්නා ලාභය මත 24%ක අනුපාතිකයකින් ආදායම් බදු ගෙවීමට සංස්ථාව බැඳී සිටී.
සංස්ථාවේ ගලපන ලද බදු පැනවිය හැකි ලාභය මත පදනම්ව ආදායම් බදු පිළිබඳ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශ තුළින් සලසා ඇත.

ii. විලම්භිත බදු පැනවීම ගණනය කිරීම සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 අනුව විලම්භිත බදු පැනවීම හඳුනා ගැනීම සලකා බැලීම

විලම්භිත බදු වත්කම් සහ වගකීම්

	2022	**2021**ගලපන ලද	ගැලපුම්	2021	2020
මූල්‍ය ස්ථාවරය					
විලම්භිත බදු වගකීම්	166,617,579	244,915,237	(40,819,206)	285,734,443	326,743,821
විලම්භිත බදු වත්කම්	(42,620,266)	(57,178,569)	9,445,762	(66,624,331)	(92,300,231)
ශුද්ධ විලම්භිත බදු වගකීම්	123,997,314	187,736,667	(31,373,445)	219,110,112	234,443,590
විස්තීරණ ආදායම් ප්‍රකාශය					
විලම්භිත බදු වගකීම්	78,297,657	81,828,584	40,819,206	41,009,378	(15,467,879)
විලම්භිත බදු වත්කම්	(14,558,304)	(35,121,644)	(9,445,762)	(25,675,882)	(16,367,850)
ශුද්ධ විලම්භිත ආදායම් බදු ආදායම් (වියදම්)	63,739,353	46,706,940	31,373,444	15,333,496	(31,835,729)

සටහන 09

දේපළ, පිරියත සහ උපකරණ (SLBC)

ඉදිරියට ගෙනයන ලද ගිණුම් පිරිවැයට	01.01.2022 දිනට ශේෂ රු.	එකතු කිරීම්/ මාරු කිරීම් රු.	ඉවත් කිරීම්/ මාරු කිරීම් රු.	ශේෂ 01.01.2022 දිනට රු.	2022.01.01 දිනට ක්ෂය සඳහා වෙන් කිරීම් රු.	කාලය සඳහා අයකිරීම රු.	Previous year adjustment	පෙර වර්ෂයේ ගැලපුම් 31.12.2022 Rs.	NBW 31.12.2022
ඉඩම්	7,574,763			7,574,763					7,574,763
ගොඩනැගිලි	431,223,877	2,000,000		433,223,877	175,867,342	10,407,747		186,275,088	246,948,789
පිරියත හා යන්ත්‍රෝපකරණ	535,285,118	695,204		535,980,322	374,265,574	10,807,286		385,072,860	150,907,462
සංගීත උපකරණ	7,772,149			7,772,149	7,258,970	91,271		7,350,240	421,909
මෝටර් රථ	53,863,675			53,863,675	52,786,363			53,863,676	0
ගෘහභාණ්ඩ, සවිකිරීම් සහ	131,586,266	1,256,219		132,842,485	108,656,703	2,184,830		110,560,122	22,282,363
තැටි සහ පටි	25,007,999			25,007,999	24,981,501	6,583		24,988,084	19,916
ශ්‍රව්‍ය සංඛ්‍යානය	740,476,686	605,000		741,081,686	533,477,867	16,733,313		550,211,180	190,870,506
සම්ප්‍රේෂක	1,289,295,947	9,506,054		1,298,802,001	802,775,983	33,452,616		836,228,599	462,573,402
පරිගණක උපකරණ	122,328,163	1,399,480		123,727,643	120,222,703	1,370,239		121,592,942	2,134,701
පුස්තකාල පොත්	450,340			453,580		-			453,580
ලුහු මෙවලම්	163,679			163,679	152,368			163,679	0
	3,345,028,662	**15,461,957**	**-**	**3,360,493,860**	**2,200,445,374**	**75,053,884**	**-**	**2,276,306,470**	**1,084,187,390**

දේපළ පිරියත සහ උපකරණ

ඉදිරියට ගෙනයන ලද ගිණුම් පිරිවැයට	01.01.2022 දිනට ශේෂය රු.	එකතු කිරීම්/ මාරු කිරීම රු.	ඉවත් කිරීම්/ මාරු කිරීම රු.	01.01.2022 දිනට ශේෂය රු.	ක්ෂය සඳහා වෙන් කිරීම් 01.01.2022 රු.	කාලය සඳහා අයකිරීම රු.	පෙර වර්ෂයේ ගැලපුම	31.12.2022 දිනට ක්ෂය සඳහා වෙන් කිරීම් රු.	NBW 31.12.2022
පිරියත සහ උපකරණ	179,582,058			179,582,058	134,231,799	13,468,654		147,700,453	31,881,605
මෝටරර්ථ	7,544,000			7,544,000	7,144,000			7,544,000	-
ගෘහභාණ්ඩ සහ සවි කිරීම්	2,839,794			2,839,794	2,129,846	212,985		2,342,831	496,963
කායර්ාලීය උපකරණ	7,782,753			7,782,753	7,782,754			7,782,754	
උත්පාදක	206,429,150			206,429,150	154,820,799	15,482,186		170,302,985	36,126,165
ශ්‍රව්‍ය සංඛ්‍යාත	53,354,383			53,354,383	39,254,241	4,001,578		43,255,820	10,098,563
සම්ප්‍රේෂක	1,521,908,873			1,521,908,873	1,119,681,951	114,398,167		1,234,080,116	287,828,756
පරිගණක උපකරණ	52,624,075			52,624,075	52,624,075	-		52,624,075	-
ලුහු මෙවලම්	4,632,471			4,632,471	3,474,352	347,435		3,821,787	810,684
උපකරණ	159,206,556			159,206,556	119,121,599	11,940,492		131,062,091	28,144,465
	2,195,904,113	**-**	**-**	**2,195,904,112**	**1,640,265,416**	**159,851,496**	**-**	**1,800,516,911**	**395,387,202**

අස්පෘෂ්‍ය වත්කම්

විස්තරය	01.01.2022 දිනට ශේෂය රු.	එකතු කිරීම්/ මාරු කිරීම් රු.	ඉවත් කිරීම්/ මාරු කිරීම් රු.	31.12.2022 දිනට ශේ රු.	2022.01.01 දිනට ක්ෂය සඳහා වෙන් කිරීම් රු.	කාලය සඳහා අයකිරීම රු.	පෙර වර්ෂයේ ගැලපුම	31.12.2021 දිනට ක්ෂය සඳහා වෙන් කිරීම්	NBW As at 31.12.2022
ත්‍රිකුණාමලය ව්‍යාපෘතියේ පරිගණක මෘදුකාංග	12,124,157			12,124,157	12,124,157			12,124,157	
මෘදුකාංග	14,488,448			14,488,448	14,488,448			26,612,605	

සටහන **10**

නොනිමි ප්‍රාග්ධන වැඩ

ක්ෂයවීම	2022	2021	2020
නොනිමි ප්‍රාග්ධන වැඩ	18,723,163	15,917,019	14,877,019
	18,723,163	**15,917,019**	**14,877,019**
	2,806,144		

සටහන 11

සංස්ථාව සී/ස ලංකා පුවත් සමාගමේ රු. මිලියනයක් ආයෝජනය කර ඇත.

ආයෝජන			
ක්ෂයවීම	**2022**	**2021**	**2020**
සී/ස ලංකා පුවත් සමාගමේ ආයෝජනය	1,000,000	1,000,000	1,000,000

12 සටහන

බඩු ලේඛණ

විස්තරය	**2022**	**2021**ගලපන ලද	ගැලපුම්	**2021**	**2020**
පරිභෝජන භාණ්ඩ	31,400,885	19,361,978		19,361,978	19,380,268
හානි වූ භාණ්ඩ	436,273	436,273		436,273	436,273
හුවමාරු භාණ්ඩ	-	13,718		13,718	1,815,739
	31,837,158	**19,811,969**		**19,811,969**	**21,632,280**

13 සටහන

වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

විස්තරය	**2022**	**2021**ගලපන ලද	ගැලපුම්	**2021**	**2020**
ණයගැතියන්ගේ ගුවන් කාලය	281,690,050	309,328,518	18,205,027	291,123,491	269,280,684
අඩු කළා: මූල්‍ය වත්කම් පිළිබඳ දෝෂ	(137,435,663)	(123,636,927)		(123,636,927)	(117,391,703)
කාර්ය මණ්ඩලය සඳහා ණය	2,097,162	2,000,301		2,000,301	2,809,498
කාර්ය මණ්ඩලය සඳහා වෙනත් අත්තිකාරම්	241,084	329,840		329,840	1,418,327
කාර්ය මණ්ඩල ණයගැතියෝ E.P.F.	238,952	238,952		238,952	238,952
සැපයුම්කරුවන් වෙත අත්තිකාරම් ගෙවීම්	115,022	1,909,069		1,909,069	97,855
විවිධ ණයගැතියෝ	13,187,917	16,900,595	145,292	16,755,303	22,500,477
අගරු චෙක්පත්	17,000	-			258,305
ලක්හඬ සමඟ ශාඛා ගිණුම්	12,807,862	12,807,862		12,807,862	12,807,862
මුදල් අඕමය	73,481	150,088		150,088	229,583
G.S.T.Control ගිණුම	237,267	237,267		237,267	237,267
ලැබිය යුතු ආදායම් (වෙනත්)	64,055,395	44,821,349	(765,600)	45,586,949	26,305,886
රදවාගත් බදු (ඉපයීම්)	40,213,024	40,213,024		40,213,024	40,213,024
වෙනත් තැන්පතු	9,242,462	9,707,462		9,707,462	9,762,842
	286,781,015	**315,007,400**		**297,422,681**	**268,768,859**

සටහන **14**

මුදල් සහ මුදල් හා සමාන දෑ

විස්තරය	**2022**	**2021**ගලපන ලද	ගැලපුම්	**2021**	**2020**
ලංකා බැංකුව - මාතර	35,000	455,586	(195,748)	651,334	15,000
අතේ ඇති මුදල් (පිළිගැනීම්)	25,000	-			
මහජන බැංකුව - අන්තර්ජාතික අංශය	32,745	699,959		699,959	154,230
ලංකා බැංකුව - ටොරින්ටන් - ප්‍රධාන ගිණුම.		-			
ඉන්දියානු රාජ්‍ය බැංකුව	770,358	449,874		449,874	449,874
ලංකා බැංකුව - අනුරාධපුර	24,087	23,001	19.09	22,982	15,002
ලංකා බැංකුව - මහනුවර		210,000		210,000	
Nations' Trust bank	17,761,759	4,812,437		4,812,437	9,133,983
ලංකා බැංකුව - ටොරින්ටන් - ගුවන්විදුලි බලපත්‍ර	2,811,482	39,930,164		39,930,164	4,493,413
ලංකා බැංකුව - ටොරින්ටන් - කැසට් අලෙවිය	22,950,785	43,270,767		43,270,767	114,243
ලංකා බැංකුව - මදුරාසිය	2,972,288	1,842,540		1,842,540	1,768,243
ලංකා බැංකුව ශ්‍රීකුණාමලය වාහපෘතිය	5,317,524	11,919,593		11,919,593	24,924,372
ලංකා බැංකුව - යාපනය ශාඛාව		-			4,200
ලංකා බැංකුව - ඉතුරුම්	114,586	111,204		111,204	107,921
ඉතුරුම් ගිණුම් (මහජන බැංකුව)	56,282,019	55,570,366		55,570,366	51,498,443
එකතුව	**109,097,633**	**159,295,491**	**(195,729)**	**159,491,220**	**92,678,924**
බැංකු අයිරා ශේෂය (ගිණුම් අංක . 265 & යාපනය)	(61,426,136)	(14,523,578)		(14,523,578)	(54,324,046)
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සඳහා ශේෂය	**47,671,497**	**144,771,913**		**144,967,642**	**38,354,878**

15 සටහන,

රඳවාගත් ඉපැයීම්

විස්තරය	2022	2021	2020
ආරම්භක ශේෂය	**(218,463,340)**	**(377,857,113)**	**(475,784,467)**
(+) ගැලපුම්		47,760,554	160,677,980
(-) ගැලපුම්			
විස්තිරණ ආදායම	(141,131,100)	111,633,219	(62,750,626)
එකතුව	**(359,594,440)**	**(218,463,340)**	**(377,857,113)**

සටහන **16**

වෙළඳ සහ අනිකුත් ගෙවිය යුතු දෑ

විස්තරය	2022	2021ගලපන ලද	ගැලපුම්	2021	2020 approved
ණයහිමියන්ගේ ගුවන් කාල අලෙවිය	37,402,395	13,179,619		13,179,619	14,652,739
වෙනත් ආපසු ලෙවිය හැකි තැන්පතු	6,821,713	3,435,012		3,435,012	6,102,068
උපචිත වියදම්	322,659,847	277,683,648	(32,740,617)	310,424,265	301,987,185
E.P.F.	326,765	4,137,833		4,137,833	4,610,966
විවිධ ණයහිමියෝ	99,280,088	19,214,107	32,400	19,181,707	19,521,305
ජංගම ගිණුම් ප්‍රාදේශිය සේවා	-	294,000		294,000	473,325
අලෙවි විධායකයින්ගේ ආරක්ෂණ තැන්පතු	1,317,116	558,387		558,387	496,010
සැනසුම් -Tsunami	15,053	15,053		15,053	15,053
රජරට සංචාරක නිකේතනය	196,829	-			180,315
	468,019,808	**318,517,659**	**(32,708,217)**	**351,225,876**	**348,038,966**

17 සටහන

කෙටිකාලීන ණය ගැනීම්

විස්තරය	2022	2021	2020
ලංකා බැංකුව - ටොරින්ටන් - ප්‍රධාන ශාඛාව	61,312,936	14,522,378	54,272,046
ලංකා බැංකුව - යාපනය	1,200	1,200	
ලංකා බැංකුව - මහනුවර	112,000		52,000
	61,426,136	**14,523,578**	**54,324,046**

18 සටහන

මූල්‍ය නොවන වගකීම්

විස්තරය	2022	2021ගලපන ලද	ගැලපුම්	2021	2020
N S L	15,007,806	15,007,806		15,007,806	15,007,806
ජාතිය සුරකිමු අරමුදල	(12,418)	(12,418)		(12,418)	(12,418)
උපයනවිට ගෙවීම් බද්ද	62,241	47,472		47,472	43,098
රඳවා ගැනීමේ බද්ද	923,051	923,051		923,051	923,051
අගය එකතු කළ බදු පාලන ගිණුම	106,939,973	68,345,374		68,345,374	39,974,854
ESC	52,619,337	52,619,337		52,619,337	52,619,337
ජාතිය ගොඩනැගීමේ බද්ද		761,242		761,242	3,761,242
ජාතික ආරක්ෂක අරමුදල	2,835	2,835		2,835	2,835
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන	5,462,614	2,201,330	1,508,571	692,759	692,759
දේශීය ආදායම් දෙපාතර්මේන්තුවට ගෙවිය යුතු මුද්දර ගාස්තු	142,900	34,050		34,050	104,150
	181,148,341	**139,930,079**	**1,508,571**	**138,421,508**	**113,116,714**

සටහන 19,

අනිකුත් ගෙවිය යුතු දෑ

විස්තරය	2022	2021	2020
සේවක අථර්ඝාධක අරමුදලේ අධිභාරය	6,301,385	7,789,635	8,539,635
	6,301,385	**7,789,635**	**8,539,635**

20 සටහන,

විදේශීය ප්‍රදානය

විස්තරය	2022	2021	2020
විදේශීය ප්‍රදාන - ජපානය සහ කොරියාව	24,429,267	24,429,267	24,429,267
ඩොයිෂ් වෙල	360,799,596	515,427,995	670,834,669
	385,228,863	**539,857,262**	**695,263,936**

21 සටහන

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්

2022 දෙසැම්බර් මස 31වැනි දිනට

විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්වල වත්මාන වටිනාකමේ වෙනස්වීම්

	2022	2021	2020
	208,594,966	282,412,177	232,428,447
වෂර්ය ආරම්භයේ දී විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්			
ආරම්භක ශේෂය ගැලපුම්	952,935		
	207,642,032	**282,412,177**	**232,428,447**
ආදායම් ප්‍රකාශනයේ හඳුනා ගත් වියදම			
ජංගම සේවා පිරිවැය	7,012,771	8,454,418	11,879,884
ගැලපුම්			
පොලී පිරිවැය	28,381,418	27,229,479	15,385,742
	35,394,189	**35,683,897**	**27,265,626**
වෙනත් විස්තීරණ ආදායමේ හඳුනාගත් ආදායම			
ජීවගණක (ලාභය)/පාඩුව	(34,779,394)	(54,947,608)	61,720,242
ගැලපුම් (ලාභය)/පාඩුව			
මුළු ගෙවීම			
ගෙවූ ඒ රතිලාභ			
සැලසුම් අනුව ගෙවූ ප්‍රතිලාභ	(41,446,779)	(54,553,500)	(39,002,138)
ගැලපුම්			
	(41,446,779)	**(54,553,500)**	**(39,002,138)**
වගකීම්වල වත්මාන වටිනාකම	**166,810,047**	**208,594,966**	**282,412,177**

උපකල්පන මූලධර්ය

වට්ටම් අනුපාතිකය	26.08%	11.78%	7.79%
අනාගත වැටුප් වැඩිවීම්	1.50%	1.50%	1.50%
විශ්‍රාම වයස	60 yrs	60 yrs	60 yrs
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය	2.00%	2.00%	2%

2022 දෙසැම්බර් 31 දිනෙන්
අවසන් වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - 2022

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්‍යා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරවිකිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංස්ථාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත ඒතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සංස්ථාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිර්ණායකවලට අනුකූලව ප්‍රසම්පාදනය කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 16 හි 61 වන ඡේදය හා ප්‍රමිත අංක 08 ප්‍රකාරව මුළුමනින්ම අගය ශූන්‍ය වූ එහෙත් තවදුරටත් භාවිතා කරන එකතුව රු.148,590,605 ක් වටිනා දේපල පිරියත උපකරණ අයිතමවල ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගිණුම්ගත කර නොතිබුණි.	2023 වර්ෂයේදී ස්වාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර වත්කම් ප්‍රත්‍යාගණනයක් කර ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 07හි 31 ඡේදය ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ පොදී ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ අනාවරණය කර නොතිබුණි.	2023 වර්ෂයේදී ලාභාංශ වලින් ලැබෙන මුදල් ප්‍රවාහය වෙනම අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ.	ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	2021 හා 2022වර්ෂ වෙනුවෙන් පිළිවෙලින් ලද රු.42,853,000ක් හා රු.40,000,000ක් ලෙස ලද රජයේ ප්‍රාග්ධන ප්‍රදාන පිළිබඳව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 20 හි 28 ඡේදය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.එමෙන්ම 2022 වර්ෂයේ ලද ප්‍රදාන අයහාර රියදම් සඳහා යොදාගෙන තිබුණි.	විගණන නිරීක්ෂණය නිවැරදිය.	ප්‍රමිතියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන නොපියවූ අත්තිකාරම් ශේෂය රු .241,084 වූවද අත්තිකාරම් ලේඛනය අනුව එම වටිනාකම රු.491,825 ක් ලෙස දැක්වීමෙන් රු.250,741ක වෙනසක් නිරීක්ෂණ විය.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. අත්තිකාරම් ලෙජරයේ දෙසැම්බර් 31 දිනට ලබාගත් ශේෂ වැරදීමකින් අත්තිකාරම් ලේඛනයේ ජනවාරි මසට ගිණුම්ගතවීම නිසා මෙම වරද සිදුවී ඇත	උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන අතර ශේෂයන් සමාන විය යුතුය.
(ආ)	2022 සැප්තැම්බර් 01 වන දින බදු ඔප්පුවක් මගින් අවුරුදු 20 ක කාලසීමාවක් දක්වා සුපිරි වෙළඳසැල් සංකීර්ණයක් සඳහා රු.1,014,090,300 ක් වටිනාකමට ගොඩනැගිල්ලක් බදු දී තිබූ අතර මෙම බදු දීමට අදාළව විගණනයේ ගණනය කිරීම් අනුව අත්තිකාරම් මුදල හා කුලී ආදායම පිළිවෙලින් රු.69,600,000ක් හා රු.7,500,000 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එම වටිනාකම පිළිවෙලින් රු.61,043,478 හා රු.6,521,739 ක් ලෙස දැක්වීම නිසා රු.9,534,783 ක වෙනසක් නිරීක්ෂණය විය.	**අත්තිකාරම් මුදල** අත්තිකාරම් මුදල් ගණනයේදී දෙසැම්බර් මස රු.600,000 අත්තිකාරම් ගිණුමෙන් ආදායමට ලබා ගෙන නොමැත. එම වරද 2023 පෙබරවාරි මස නිවැරදි කර ඇත. ඉතිරි වෙනස සඳහා බලපා ඇත්තේ වැටි බදු මුදලය. **කුලී ආදායම** කුලී ආදායමෙන් 15%ක බදු මුදලක් වෙන් කර ඇති බැවින් රු.978,261 වෙනසක් ඇත. බදු කුලී සමග බදු මුදලක් ගිවිසුමේ ගණනය කර නොමැති නිසා මෙලෙස ගැලපීම් කිරීමට සිදු විය.	උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන අතර ශේෂයන් සමාන විය යුතුය.
(ඇ)	විකාශනාගාරයක් පවත්වාගෙන යාම සඳහා 2009 වර්ෂයේදී දීර්ඝකාලීන බදු පදනම මත ලබා ගත් ත්‍රිකුණාමලය කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් හෙක්ටයාර් 119.5309 ක් පමණ වූ ඉඩම සඳහා 2021 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු බදු මුදල රු.153,860,000 ක්වූ අතර ඉන් රු.127,795,000 ක් කපා හැරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට රු.26,065,000 ක් ගෙවිය යුතු අතර 2022 වර්ෂය සඳහා වූ ගෙවිය යුතු රු.9,420,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.	අමාත්‍ය මණ්ඩල සංදේශ අනුව ත්‍රිකුණාමල, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉඩම සඳහා ගෙවිය යුතු බදුකුලිය ගිණුම්ගත කර නොමැත. එය, ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කර තිබේ.	වියදම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පැහැර හරිනු ලබන බදු අයකිරීමේ ඒකකයේ වාර්ෂික සහ සංස්ථාවේ බදු	විගණන නිරීක්ෂණය නිවැරදිය 2023 වර්ෂයේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	නිවැරදි වටිනාකම් දැක්විය යුතුය.

	ගෙවීම් සම්බන්ධ බදු ගිණුම් අනුව 2022 දෙසැම්බර් 31දිනට මුළු බදු වගකීම රු.213,349,232 ක් (දඩ මුදල් රහිතව) විය යුතු වුවද මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වගකීම් යටතේ එය රු.180,091,971 ක් ලෙස දැක්වීමෙන් ගෙවිය යුතු හිඟ බදු වටිනාකම් රු.33,257,261 ක් අඩුවෙන් දක්වා තිබුණි.		
(ඉ)	2022 ජනවාරි 01දිනට ගුවන් කාල ණයගැතියන්ගේ ආරම්භක ශේෂය වූ රු.21,108,283 ක් හා 2021 දෙසැම්බර් 31 දිනට වූ රු.18,039,450 ක ශේෂය අතර රු. 3,068,825ක වෙනසට හේතු අනාවරණය කර ගැනීමට සංස්ථාව අපොහොසත් විය.	2021 වර්ෂයේ ණය ගැනි උපලේඛනයේ සිදු වූ වරදකි. 2022 වර්ෂයේදී ඉදිරිපත් කළ ණයගැනි උපලේඛනය නිවැරදිය.	උපලේඛන හා මූල්‍ය ප්‍රකාශන අතර ශේෂයන් සමාන විය යුතුය.
(ඊ)	මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ගුවන් කාල ණයගැනි එකතු වටිනාකම රු.281,690,050 ක් සඳහා රු.137,435,663 ක් අඩමාණ ණය වෙන් කර තිබුණද ,වෙනත් ණයගැතියන් හා වෙනත් ලැබිය යුතු ආදායම් වලට අදාළ රු.13,485,732 ක් සඳහා බොල් හා අඩමාණ ණය වෙන් කර නොතිබුණි.	විගණන නිරීක්ෂණය නිවැරදිය. 2023 වර්ෂයේ සිට සියලු ණය ගැතියන් සඳහා අඩමාණ ණය වෙන් කරනු ලැබේ	සියලු ණය ගැතියන් සඳහා බොල් හා අඩමාණ ණය වෙන් කිරීම පිළිබඳව අවධානය යොමු කිරීම උචිත වේ.
(උ)	විකාශනාගාරයක් පවත්වාගෙන යාම සඳහා බදු පදනම මත ලබාගෙන තිබුණු ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයත් හෙක්ටයාර 0.3194 කට අදාළව නීතිපති විසින් අනුමතකර ඇබෙන ක්‍රමවේදයට අනුව 1995 සිට 2017 දෙසැම්බර් 31 දක්වා ගෙවිය යුතු බදු කුලිය රු.10,969,208 ක් සමාලෝචිත වර්ෂය දක්වා ගිණුම්ගත කර නොතිබුණි. 2018, 2019, 2020, 2021 හා 2022 වර්ෂවලට අදාළ ගිණුම්ගත කර තිබුණු ගෙවියයුතු බදුකුලී රු. 6,075,060 ක් 2023 මැයි 31 වන විටද පියවා නොතිබුණි.	විගණන නිරීක්ෂණය නිවැරදිය. මූල්‍ය තත්ත්වය අයහපත් නිසා ගෙවීමට නොහැකි විය.	වත්කම් වගකීම් නිවැරදිව ගිණුම් ගත කර නිරවුල් කිරීමට කටයුතු කල යුතුය.
(ඌ)	මූල්‍ය ප්‍රකාශන අනුව 2022 වර්ෂයට අදාළ උපචිත වියදම් රු.2,738,026 ක් ගිණුම්ගත කර නොතිබුණි .	2022 ගිණුම් වර්ෂයට අදාළව 2023-01-10 වන විට ලැබී තිබූ ගෙවිය යුතු සියලු වියදම් උපචිත	උපචිත වියදම් නිවැරදිව ගිණුම් ගත කිරීමට කටයුතු කළ

		වියදම් ලෙස ගිණුම් ගත කොට ඇත. ඒ අනුව රුපියල් 322,659,847 මුදලක් 2022-12-31 වන දිනට උපචිත වියදම් ලෙස ගිණුමෙහි දක්වා ඇත. විගණනයෙහි පෙන්වා දී ඇති ගෙවීම් වවුචර් මුදල් අංශයට ලැබී ඇත්තේ ඉහත කාලපරිච්ඡේදයට පසුව වේ.	යුතුය.
(එ)	දේපල පිරියත හා උපකරණ සඳහා වූ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ මෝටර් රථ සමුච්චිත ක්ෂය වෙන්කිරීම රු.53,863,675 ක් වූ අතර 2022 ජනවාරි 01 දිනට පැවැති ශේෂය රු.52,786,363ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුල ක්ෂය ප්‍රමාණය රු .1,077,313ක් වෙන් කළ යුතු වුවත් එම වටිනාකම ගිණුම් ගත කර නොතිබුණි.	විගණනය පෙන්වා දී ඇති කරුණු පිළිබඳව පරීක්ෂා කර 2023 වර්ෂයේ දී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.	ක්ෂය වෙන් කිරීම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය
(ඒ)	තෙන්මරාච්චි නාවටිකුලි යන ස්ථානයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් විකුණුම් මධ්‍යස්ථාන ගොඩනැගිල්ල යාල් එෆ්.එම් සේවය සඳහා මිලදී ගැනීමට වාරික 03කින් එනම් රු.මි 2 ක් 2022 අප්‍රේල් 15 දින ද ,රු.මි 1.5 ක් 2022 මැයි 15 දිනද සහ රු.මි 1.5 ක් 2022 ජූනි 15 දිනද ලෙස රු.මි. 5ක් ගෙවීමට 2022 පෙබරවාරි 25 දින ගිවිසුම්ගත වී තිබුණි. ඉන් 2022 නොවැම්බර් 03 දින රු.මි 2 ක් ගෙවා තිබූ අතර ඉතිරි මුදල් ගෙවා නොතිබුණි .ඒ අනුව ගොඩනැගිලි ශේෂය රු.මි 3ක්, ණයහිමි ශේෂය රු.මි.3ක් හා ප්‍රමාදවීම් නිසා අයකරන පොලිය රු.630,000 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි .	විගණන නිරීක්ෂණය නිවැරදිය.	ගොඩනැගිලි ශේෂය ණයහිමි ශේෂය හා පොලී මුදල නිවැරදිව ගිණුම්ගත කළ යුතුය
(ඔ)	සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායකය පිළිබඳව නිසි අවධානය යොමු නොකිරීම හේතුවෙන් ත්‍රිකුණාමල විකාශනාගාරයේ සේවයේ නියුක්තිකයන් වෙනුවෙන් සේවක අර්ථසාධක අරමුදලට යැවිය යුතු රු.12,714,678ක් නොයැවීම නිසා	විගණන නිරීක්ෂණය නිවැරදිය. සංස්ථාව විසින් අභියාචනයක් ඉදිරිපත් කර ඇති බැවින් වෙන් කිරීම් සිදුකරන නොලැබේ.	සේවක අර්ථසාධක අරමුදලට ගෙවිය යුතු දායක මුදල් ගෙවීමට කටයුතු කළ යුතුය.

	සංස්ථාවට එරෙහිව නඩු පවරා තිබුණි. එම මුදල ගෙවීමට 2021 ජනවාරි 17 දින මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝග කර තිබුණද එම වගකීමට අදාළව ඇගයීමක් කර සුදුසු පරිදි කටයුතු කර නොතිබුණි.			
(ඕ)	2023 වර්ෂයට අදාළ රු.1,565,604 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස දක්වා තිබුණි.	වවුවර අංක pay -1388-12 සහ අංක pay-1274-12 යටතේ විගණනයේ පෙන්වා දී ඇති කරුණු නිවැරදිය. රු. 658, 350 ක වරිපනම් සඳහා ගෙවූ වියදම 2023 වර්ෂයේ පළමු කාර්තුවට අදාළව වියදමකි. එම වියදම 2022 වර්ෂයට අදාළ නොවේ. ඒ අනුව මෙම ගිණුම් ගත කිරීම් සියල්ල නිවැරදිව ගිණුම් ගත කර ඇත.	වියදම් අදාළ වර්ෂයට නිවැරදිව ගිණුම්ගත කළ යුතුය	

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

	විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංවර්ධන ලොතරැයි මණ්ඩලය					
	ණයගැති ශේෂය	18,192,625	13,758,998	4,433,627	මෙම ණයගැති හා ණයහිමි ශේෂ පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට ලැබේ	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම අනුරූපී වාර්තා අනුව වටිනාකම සමාන විය යුතුය
	ණයහිමි ශේෂය	1,939,040	ශේෂයක් නොමැත	1,939,040		
	ජාතික ලොතරැයි මණ්ඩලය					
	ණයගැති ශේෂය	6,514,210	ශේෂයක් නොමැත	6,514,210		
	ණයහිමි ශේෂය	565,573	ශේෂයක් නොමැත	565,573		
(ආ)	තොගය	31,400,885	29,405,407	1,995,478	විගණන නිරීක්ෂණය නිවැරදිය. 2023 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන් අනුරූපී වාර්තා සමග

					ලැබේ.	සැසඳිය යුතුය.
(ඇ)	ලැබිය යුතු තැන්පතු ශේෂය	9,242,462	9,287,782	419,680	විගණන නිරීක්ෂණය නිවැරදිය විගණන හා කළමනාකරණ තීරණ වලට අනුව කමිටුවක් පත්කොට මෙම ශේෂ සම්බන්ධ වාර්තාවක් කැඳවා ඇත. එහි තීරණය අනුව මෙම ශේෂය 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කිරීමට යොදා ඇත.	තැන්පතු ශේෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විෂය	මූදල රු.	නොසැපයූ විගණන සාක්ෂි	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉඩම්	7,574,763	හිමිකම් ඔප්පු, වටිනාකම සනාථ කෙරෙන ලියවිලි, ස්ථාවර වත්කම් ලේඛනය හා භෞතික සත්‍යාපන වාර්තා	විගණන නිරීක්ෂණය නිවැරදිය.	වත්කම් වල හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය.
(ආ)	ගොඩනැගිලි	433,223,877	ස්ථාවර වත්කම් ලේඛනය, වටිනාකම සනාථ කෙරෙන ලියවිලි සහ භෞතික සත්‍යාපන වාර්තා	විගණන නිරීක්ෂණය නිවැරදිය.	වත්කම් වල හිමිකාරිත්වය හා පැවැත්ම තහවුරු කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	ලංකා පුවත් ආයතනයේ කොටස් සඳහා ආයෝජනය .	1,000,000	කොටස් සහතික	විගණන නිරීක්ෂණය නිවැරදිය.	ශේෂ තහවුරු කිරීම සඳහා අදාළ සාක්ෂි ඉදිරිපත් කළයුතුය.

(ඇ)	රැඳවුම් බඳු	23,232,695	රැඳවුම් බඳු සහතික	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	පැවැත්ම සහවුරු කෙරෙන ලියකියවිලි සහ ලේඛන ඉදිරිපත් කළ යුතුය

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2022 දෙසැම්බර් 31 දිනට ගුවන් කාල ණයගැති ශේෂය රු. 281,690,050 ක් වූ අතර ඉන් වර්ෂ 10 ඉක්ම වූ දේශීය ණයගැතියන් රු.31,873,561 ක් හා විදේශීය ණයගැතියන් රු.63,114,642 ක් විය. එය මුළු ගුවන් කාල ණයගැති ශේෂයෙන් සියයට 34 කි. තවද එම විදේශ ණයගැති ශේෂය තුල හඳුනාගත නොහැකි රු.35,301,041 ක් වූ ශේෂයක් ඇතුලත්ව තිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.1974 වර්ෂයට පෙර සිට පැවත එන ණයගැති ශේෂයන් අයකර ගත නොහැක. ශේෂ කපා හැරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ව්‍යාපාරය පොදු කාරක සභාවෙන් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව පරිදි මුදල් අංශය, අලෙවි අංශය හා අභ්‍යන්තර විගණක අංශය කමිටුවක් පත් කර කපා හැරියේ ලේඛනය සමබන්ධයෙන් පරීක්ෂා කර සංස්ථා මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.	අයකර ගත යුතු ශේෂය අයකර ගැනීමට කටයුතු කිරීම.
(ආ)	වැඩ තහනමයාට ලැබිව පසුව උසාවියෙන් ධරදකරුවකු වූ නිලධාරියකුට ගෙවූ රු.954,664 ක අඩ වැටුප් සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන නිබුණද එම මුදල සංස්ථාව වෙත ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. මුදල් අයකරගැනීම සඳහ කටයුතු කරන ලෙස සංස්ථා මණ්ඩල තීරණයක් ලබාදී ඇත.	වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අදාල මුදල අයකර ගැනීමට සංස්ථාව විසින් කටයුතු කළ යුතුය
(ඇ)	සමාලෝචිත වර්ෂයේ අවසානයට වටිනාකම රු.64,055,395 ක් වූ ලැබිය යුතු අනෙකුත් ආදායම් ශේෂ තුළ ඇතුළත් වර්ෂ 2 ත් 11 ත් දක්වා පැරණි එසැතු වටිනාකම රු.10,106,956 ක් වූ ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය තුළදීද සංස්ථාව කටයුතු කර නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	පැරණි ණයගැති ශේෂ අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතුය.

(ඇ)	වසර 35 කට වඩා වැඩි කාලයක සිට ඉදිරියට එමින් පවතින රු.238,952 ක් වූ වැඩිපුර ගෙවන ලද සේවක අර්ථසාධක අරමුදල් ශේෂයක් 2023 මැයි 31 වන විටත් සංස්ථාව වෙත නැවත පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය	අර්ථසාධක අරමුදල් ශේෂය පියවා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය අවසානයට රු.13,187,918 ක් වූ විවිධ ණයගැති වටිනාකම් තුළ ඇතුළත් වර්ෂ 2ත් 21ත් අතර කාලයක් ගත වී තිබූ රු 4,829,121 ක් වූ විවිධ ණයගැති ශේෂය නිරවුල් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද සංස්ථාව විසින් කටයුතු කර නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය	විවිධ ණයගැති ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	2022 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය වූ රු.281,690,050 ක් තුළ වසර 3 කට වඩා වැඩි අය කර ගත යුතු ශේෂය රු.115,771,219 ක් විය.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළයුතුය.
(උ)	2022 දෙසැම්බර් 31 දින රු.1,005,482 වූ අගරු චෙක්පත් වලින් අප්‍රේල් 30 වන විට අයවී තිබුණේ රු.85,000 ක මුදල් පමණි. මෙම ඉතිරි මුදල් වූ රු.920,482 ක මුදල අය කර ගැනීමට සංස්ථාව කටයුතු කර නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	අගරු චෙක්පත් මුදල අය කර ගැනීමට සංස්ථාව කටයුතු කළයුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු 1981 සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළ එකතුව රු.149,420,035 ක් වර්ෂ 40 ක කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පැවතුණු අතර විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු.145,614,269 ක් විය. ගෙවිය යුතු එම ශේෂය 2023 මැයි	විගණන නිරීක්ෂණය නිවැරදිය	දිගු කලක් පවතින උපචිත වියදම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

31 වන විටද පියවා නොතිබුණි.

1.6.3 අත්තිකාරම්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 මඟින් සංශෝධනය කරන ලද මු.රෙ.371(2) (ආ) සහ 371(5) අනුව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 155කදි ලබා දී තිබූ වටිනාකම රු.6,031,660 ක් වූ අත්තිකාරම් පියවීම කාර්යය නිමකර දින 10 ඉක්මවා දින 11 ත් දින 714ත් අතර ප්‍රමාදයකින් යුක්තව සිදුකර තිබුණි.	රු 5300 ක අත්තිකාරම් මුදල 2023 මුල් කාර්තුවේ පියවීමට කටයුතු කොට ඇත.අත්තිකාරම් පියවීමේදී චක්‍රලේඛ අංක ප්‍රකාරව අදාළ කාලපරිච්ඡේදය තුළ පියවීමටනොහැකි වනුයේ එම කාර්යයේ ස්වභාවය හා ලංකාව පුරා විසිරී ඇති ප්‍රාදේශීය සේවා හා විකාශනාගාර සඳහා නියුක්ත් කරන අත්තිකාරම් ප්‍රධාන කාර්යයාලය තුළින් පමණක් සිදු කිරීම නිසාය.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය.
(ආ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 9.1 මඟින් සංශෝධනය කරන ලද මු.රෙ.371(2) (ආ) සහ 371(5) අනුව මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්යය අතුරු අග්‍රිම ලබා දිය හැකි වුවද අවස්ථා අවස්ථා 21 කදී එම සීමාව ඉක්මවා එකතුව රු.4,643,500 ක අත්තිකාරම් ලබාදීමට කටයුතු කර තිබුණි.	කාර්යයේ ස්වභාවය අනුව සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදීමට සිදුවන අවස්ථා පැනනැගින අතර ඒ සඳහා සභාපති හා අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ මාණ්ඩලික නිවේදන අංක : එස්.එල්.බී.සී/3142 හි 04 වන වගන්තිය අනුව යම් නිලධාරියෙකු ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීමට පෙර නැවත අත්තිකාරම් නොදිය යුතු වුවද ඊට පටහැනිව සංස්ථාව විසින් සමලෝචිත වර්ෂයේදී නිලධාරීන් 26 දෙනෙකුට අවස්ථා 126 කදී ක් ලබාගත් අත්තිකාරම් රු.5,082,646 ක් පියවීමට පෙර නැවත ලබාදී තිබුණි.	ගුවන් විදුලි නාලිකා 13 ක් පැවතීම, ප්‍රාදේශීය විකාශනාගාර ක් 11 පැවතීම, ප්‍රාදේශීය සේවා 07 ක් පැවතීම මත අත්තිකාරම් නිකුත් කිරීමට හැක්කේ විධායකශ්‍රේණියේ නිලධාරීන්ට පමණක් වීම ආදිය සහ කාර්යයන්හි ස්වභාවය අනුව අත්තිකාරම් නිකුත් කළ හැකි නිලධාරීන් සීමිත බව නිසා මෙලස අත්තිකාරම් නිකුත් කිරීමට සිදුවී ඇත.මෙලෙස අත්තිකාරම් සිදු කිරීම සිදු නොකලහොත් ආයතනයේ මෙහෙයුම් කාර්යයන්ට බලපෑමක් සිදුවේ. නිකුත් කළ සියලු අත්තිකාරම් පියවා ගැනීමට නිවැරදි ගිණුම්කරණ	ලිඛිත උපදෙස් අනුව කටයුතු කර රජයේ මුදල් නිසි කළමනාකරණයකින් පරිහරණය කළයුතුය.

		පාලන ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු යොදා ඇත.		
(ඇ)	අත්තිකාරම් ලබා දීමේදී අවශ්‍යතාවය හඳුනාගෙන ඊට අදාළ අත්තිකාරම් ලබාදිය යුතු වුවද අවස්ථා 8 ක දී රු.182,900 ක් වූ ලබාගත් අත්තිකාරම් වැය නොකර නැවත පියවා නිබූ බව නිරීක්ෂණය විය.	විගණනයේ නිවැරදිය.	නිරීක්ෂණය	අත්තිකාරම් ලබා දීමේදී අවශ්‍යතාවය හඳුනාගෙන ලබාදිය යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම රු.	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			
	(i) මුදල් රෙගුලාසි 396(ඇ) (i) හා (iii)	2022 දෙසැම්බර් 31 දින වන විට වලංගු කාලය මාස 06 ඉක්ම වූ රු.604,539 ක් වටිනා වෙක්පත් 13 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොනිබුණි.	මේ වන විට මෙය නිවැරදි කෙර ඇත	මාස 06 ඉක්මවූ වෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ)(i) හා (iii) ප්‍රකාරව කටයුතු කළයුතුය.
	(ii) මුදල් රෙගුලාසි 395(ඇ)	එක් එක් මාසය අවසානයේදී ඇති ගනුදෙනු තත්ත්වය සම්බන්ධයෙන් ඊළඟ මාසයේ 15 වැනි දිනට පෙර බැංකු සැසඳුම් ප්‍රකාශයක් පිළියෙල කර, මුදල් රෙගුලාසි 395(ආ) ප්‍රකාරව එම බැංකු සැසඳුම විගණනය කිරීමට සූදානම්ව තිබිය යුතු වුවද සංස්ථාවේ බැංකු ගිණුම් 08 ක ජනවාරි සිට සැප්තැම්බර් දක්වා බැංකු සැසඳුම් ප්‍රකාශ නියමිත දින විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	සියලුම බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විද්‍යුත් සැපැල මඟින් ඉදිරිපත් කරන ලදි. මෘදු පිටපත් මේ සමඟ ඉදිරිපත් කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළයුතුය.
(ආ)	2021 නොවැම්බර් 16 දිනැති මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය	ඉදිරිපත් කර නිබූ ක්‍රියාකාරී සැලැස්ම එක් එක් ක්‍රියාකාරකම සඳහා	විගණන නිවැරදිය.	නිරීක්ෂණ මාර්ගෝපදේශයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය.

	ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මාර්ගෝපදේශය	නිශ්චිත කාල ඉලක්කයන් දක්වා නොතිබුණි.		
(ඇ)	2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක : 01/2020,හි "රාජ්‍ය මුදල් සහ භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛ පරිශීලනයට පහසු ආකාරයට සංගැහීම කිරීම" යන චක්‍රලේඛයේ II කොටසේ 6.2	සංස්ථාව විසින් අවස්ථා 10 කදී දින 90 ඉක්මවූ කාලයකට බඳවා ගැනීම් සිදුකර තිබුණි. බඳවා ගැනීමට අදාළ ගෙවීම් සිදුකළ යුත්තේ අදාළ කාර්යය ඉටු කළ පසුව අමාත්‍යාංශ ලේකම්ගේ ශාඛාද්ගලික අනුමැතිය මත වුවද සංස්ථාව විසින් පැවරුම් පදනම මත බඳවාගෙන තිබූ නිලධාරීන් 07 දෙනෙකුට 2022 වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා පමණක් රු.2,424,937 ක මුදලක් කාර්යය ඉටු කිරීමට පෙර මාස් පතා ගෙවීම් සිදුකර තිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය.
(ඈ)	1978දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මූදල් රෙගුලාසි (2)502 ප්‍රකාර එහි II වැනි පරිශිෂ්ටය	සංස්ථාව සතු ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගොනොතිබුණි.	විගණන නිරීක්ෂණය නිවැරදි වේ. 2023 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත.	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය.
(ඉ)	2021නොවැම්බර් 16 දින මූදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන් සඳහා වූ මෙහෙයුම් අත්පොතෙහි 6.7 අනුව	ස්ථාවර වත්කම් සහ ගබඩා සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදුකළ යුතු වුවත්, ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ ස්ථාවර වත්කම් සහ ගබඩා සම්බන්ධයෙන් 2022 වර්ෂය සඳහා එවැනි පරීක්ෂණයක් විගණිත දිනය දක්වා සිදුකර නොතිබුණි.	ගබඩා සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදු කර විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2022 වාර්ෂික සත්‍යාපනය 60% ක පමණ ප්‍රමාණයක් අවසන් කර ඇත. ප්‍රමාණාත්මක වශයෙන් බාහිර සේවාවන් හා විකාශනාගාර 17ක් සහ	මෙහෙයුම් අත්පොතෙහි 6.7 විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය.

			ප්‍රධාන කාර්යාලයෙන් උප ඒකකයන් 58ක ස්ථාවර වත්කම් පරීක්ෂාව සිදු කල යුතුව ඇත. මේ සඳහා වෙනත් අංශවල රාජකාරී කරන නිලධාරීන් යොදා ගනු ලබන අතර සමීක්ෂණ කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් ගතවීම මෙහි සීමාකාරී සාධකයක් ලෙස හඳුනා ගෙන ඇත.	
(ඊ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.3 ඡේදය	ගිණුම් වර්ෂය ආරම්භයට දින 15කට පෙර උපායමාර්ගික සැලසුම් පිළියෙල කර රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා භාණ්ඩාගාර ලේකම්ට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් හෝ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සංස්ථාව විසින් ඒ පරිදි කටයුතු කර නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය.
(උ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ (1) (ඉ) ප්‍රකාරව	විගණකාධිපතිවරයාට අවශ්‍ය වන පරිදි නිශ්චිත කාල සීමාවක් තුල සියලු විගණන විමසුම්වලට පිලිතුරු සැපයීමට ගණන්දීමේ නිලධාරී වගබලා ගතයුතු වුවත් සංස්ථාවේ විගණන විමසුම් 2 ක් සඳහා 2023 ජූනි 30 වනවිටත් පිලිතුරු ලබා දී නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය	විගණන විමසුම්වලට පිලිතුරු ලබා දිය යුතුය.

1.8 මුදල් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2014 වර්ෂයට පෙර සිට පැවත එන මහජන බැංකුව ඉතිරි කිරීම් ගිණුමෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.56,282,019 ක මුදලක් පැවති අතර, ඒ සඳහා සියයට 2.5ට වඩා අඩු පොළී අනුපාතයක් යටතේ රු.2,133,619ක පොලියක් ලැබී තිබුණි. තවද සංස්ථාවේ ප්‍රධාන ජංගම ගිණුමෙහි (2323265) 2022 දෙසැම්බර් 31 දිනට බැංකු ප්‍රකාශය අනුව අයිරා ශේෂය රු.51,726,039ක් වූ අතර ඒ සඳහා අය කළ පොලිය රු.4,679,352 ක් විය. සංස්ථාවේ මුදල් 2.5 අනුපාතයකට වඩා වැඩි පොළී අනුපාතයක් යටතේ ආයෝජනය කිරීමට අවධානය යොමු නොකිරීම හෝ බැංකු අයිරාව පියවීමට කටයුතු නොකිරීමෙන් ලැබෙන පොළී ආදායමට වඩා රු.2,545,733 ක් අයිරා පොලිය වැඩි වීමෙන් මූල්‍යමය පාඩුවක් සිදු වී තිබුණි. තවද 2012 වර්ෂයට පෙර සිට පැවත එන නේෂන්ට්‍රස්ට් බැංකුවේ ජංගම ගිණුමද උපරිම ඵලදායී ලෙස යොදා නොගෙන 2022 දෙසැම්බර් 31 දිනට රු.17,761,729 ක් නිශ්ක්‍රීයව මුදල් තබා ගෙන තිබුණි.	මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමෙහි පවතින මුදල් සංස්ථාවට හදිසි මිලදී ගැනීම් සඳහා මෙම මුදල් අවශ්‍ය වන බැවින් මෙම මුදල ස්ථාවර තැන්පතුවක් නොදමන ලදි. විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. ප්‍රධාන ජංගම ගිණුමෙහි (2323265) හි බැංකු අයිරා පොලිය ගෙවීමට සිදු වීම නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ජංගම ගිණුමේ මුදල 2023 අප්‍රේල් මස මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමට මාරු කරන ලදී.	මූල්‍ය පාලනය කිරීම සඳහා නිසි පරිදි කටයුතු කළයුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශන අනුව උපචිත වියදම රු.322,659,847 ක් වූ අතර එයින් රු 223,507,075 ක් වූ උපචිත වියදම් සඳහා උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි. තවද මෙම උපචිත වියදම් තුළ වර්ෂ ගණනාවක සිට පැවතෙන රු.228,606,286 ක් වූ ශේෂද ඇතුළත්ව තිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. රු. 841,819.00 කොන්ත්‍රාත් සේවක වැටුප් ලේඛනය ලබාදිය හැක.	උපචිත වියදම්වලට හේතු සොයා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. රු.222,665,256 සඳහා උපලේඛන ඉදිරිපත් කළයුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය (බදු පෙර) රු.236,388,563 ක අලාභයක් වූ අතර ඊට අනුරූප වර්ෂයේ ලාභය රු.11,487,241 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.247,875,804 ක පසුබැස්මක් නිරීක්ෂණය විය. මෙම පසුබැස්මට රජයේ ප්‍රදාන නොලැබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු.49,243,983 කින් වැඩිවී තිබූ අතර පරිපාලන, බෙදාහැරීම සහ අනෙකුත් මෙහෙයුම් වියදම් රු.22,056,072 කින් අඩුවී තිබුණි.එම තත්ත්වය තුලද සමාලෝචිත වර්ෂයේදී බදු පසු ලාභය රු. 119,224,883 කින් පසුබැස්මක් වී තිබීමෙන් (රාජ්‍ය ප්‍රදාන රහිතව) භාණ්ඩාගාරයේ හෝ රජයේ වෙනත් මූල්‍ය සහයක් නොමැතිව සංස්ථාව පවත්වාගෙන යාමේ අවිනිශ්චිතතාවක් පවතින බව නිරීක්ෂණය විය.

2.3 අනුපාත විශ්ලේෂණය

(අ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ජංගම අනුපාතය 1.04 සිට 0.6 දක්වාද ක්ෂණික අනුපාතය 1 සිට 0.56 දක්වා විශාල පසුබැස්මක් පෙන්නුම් කෙරුණි. ජංගම වත්කම්හි ඇතුළත් ණයගැතියන් තුළ වර්ෂ 10 ඉක්ම වූ පැරණි දේශීය ණයගැතියන් රු.31,873,561ක් විදේශීය ණයගැතියන් රු. 63,114,642 ක් ද , ජංගම වගකීම්හි උපචිත වියදම් තුළ වර්ෂ ගණනාවක සිට පැවත එන රු.228,606,286 ක් ඇතුළත්ව තිබුණි. තවද ශුද්ධ කාරක ප්‍රාග්ධනය රු. 21,143,543 ක ධන වටිනාකමක සිට රු. 282,878,479 ක ඍණ වටිනාකමකට අඩුවීම නිසා සංස්ථාව කෙටිකාලීන ද්‍රවශීලත්වභාවය පිළිබඳ ගැටළුවට මුහුණු දී තිබුණි.

(ආ) ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මෙහෙයුම් ලාභ අනුපාතය ඍණ 52.05 සිට ඍණ 33.89 දක්වා ප්‍රතිශතයකින් වර්ධනය වී තිබූ අතර විකුණුම් ආදායම 7.78 ප්‍රතිශතයකින් ඉහළ යාමත්, පරිපාලන වියදම් 6.19 ප්‍රතිශතයකින් හා වෙනත් මෙහෙයුම් වියදම් 1.16 ප්‍රතිශතයකින් ඉහළ යාම මීට හේතුවී තිබුණි. තවද සංස්ථාව දිගින් දිගටම මෙහෙයුම් අලාභ ලබා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 හඳුනාගත් පාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)(i)	සංස්ථාවේ ඉදිරිපස නව ගොඩනැගිල්ල 2022 සැප්තැම්බර් 01වන දින බදු ඔප්පුවකින් සුපිරි වෙළඳසැල් සංකීර්ණයක් සඳහා වසර 20ක කාලසීමාවක් සඳහා රු. 1,014,090,300 වටිනාකමට බදු දී තිබුණි. මේ සඳහා එක් පුවත්පතක පමණක් දැන්වීම් පලකර තිබුණි. දැනටමත් රු.මි.3 ක	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. සංස්ථාවේ පැවති මුදල් තත්ත්වය පදනම් කර ගනිමින් රාජ්‍ය ආයතනයක් වන ලේක්හවුස් ආයතනයේ Sunday observe මගින් ඉරිදි පුවත්පතේ මෙම දැන්වීම් වලට කිරීමට කටයුතු කරන ලදි. මෙම කටයුත්තක් ද සිදු කරනු ලැබුවේ ණය පදනම් මතය. මීට අමතරව සංස්ථා	නිවැරදි තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර සංථාවට පාඩු නොවන පරිදි කටයුතු කලයුතුය.

	ආරම්භක කුලියකට ලබාදී තිබූ මෙම ගොඩනැගිල්ල හා රථගාල සඳහා ලබාගෙන තිබූ තක්සේරු වාර්තාවේ ගොඩනැගිල්ලේ හා රථගාලේ වර්ග ප්‍රමාණය කොපමණද යන්න නොදක්වා මාසිකව රු.මී.2 කට දියහැකි බව පමණක් දක්වා තිබුණි. නමුත් පුවත්පත් දැන්වීමේ දක්වා තිබුනේ පර්චස් 10 ක් ලෙසය. විගණනය හා ආයතනයේ නිලධාරීන් විසින් 2023 ජූනි 02 දින කළ ස්ථානීය නිරීක්ෂණය අනුව මෙම ප්‍රමාණය පර්චස් 123.06 ක් පමණ වූ බව තහවුරු වූයෙන් පුවත්පත් දැන්වීමේ අඩු වර්ග ප්‍රමාණයක් දක්වා තිබීමත්, නිවැරදි තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු නොකිරීමත් නිසා සංස්ථාවට නිවැරදි වර්ග ප්‍රමාණය අනුව ලබා ගැනීමට නියමිතව තිබූ බදුකුලී අගයන් උපයාගැනීමේ අවස්ථාව අහිමි වී තිබුණි.	වෙබ් අඩවිය තුල මෙම දැන්වීම් එල කරන ලදි.	
(ii)	උක්ත බදු ගිවිසුමෙහි සංස්ථාවට දායිසි සහගත ලෙස වූ 6 (g) වගන්තිය අනුව ලැබෙන මාසික කුලී ආදායමෙන් දශකාටසක් එකතු කළ අගය මත බදු සඳහා වෙන් කිරීමට සිදුවී තිබීම නිසා (එකතු කළ අගය මත බදු 15% ක් ලෙස ඉදිරි වර්ෂ වලදී ද වෙනස් නොවන ලෙස සැලකුවහොත්) ගිවිසුම් ගත කාලය අවසන් වන 2042 වර්ෂය වන විට සංස්ථා බදු ආදායමෙන් රු.132,272,648 ක් එකතු කළ අගය මත බදු ගෙවීමට සිදුවීමෙන් එම කුලී ආදායම සංස්ථාවට අහිමිවීමේ අවධානමක් පවතී.	විගණනයේ නිවැරදිය	නිරීක්ෂණය	බදු ගිවිසුම සංශෝධනය කරගැනීමට කටයුතු කළයුතුය.

(iii)	මෙම ගිවිසුම අනුව ලැබුණු අත්තිකාරම් මුදල රු.මිලියන 72 වුවද 6 (g) වගන්තිය නිසා රු.9,391,304 ක මුදලක් එකතු කළ අගය මත බදු ලෙස වෙන්කර තිබුණි. ගිවිසුමේ 3(ii) a වගන්තිය පරිදි මෙම අත්තිකාරම මාසිකව රු.600,000 ක් බැගින් මාස 120 කින් බදු කුලී මුදලින් හිලව් කිරීමට එකඟ වී තිබුණ ද, ගිණුම්ගත කළ මුළු අත්තිකාරම රු.62,608,696 ක මුදලක් වන බැවින් රු.600,000 බැගින් වාරික 120 වෙන් කිරීම ගැටලු සහගතය.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.		බදු ගිවිසුම සංශෝධනය කරගැනීමට කටයුතු කළයුතුය.
(ආ)	ඉක්මනින් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පවතින ප්‍රධාන කාර්යාලයේ ප්‍රධාන සම්ප්‍රේෂණ කුලුන සහ ක්ෂුද්‍ර තරංග කුලුන රු.4,605,256 කට අලුත්වැඩියා කිරීමට 2019 නොවැම්බර් 06 දින ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලැබී තිබුණද 2023 අප්‍රේල් 30 දින වනවිටත් අලුත්වැඩියා කර නොතිබුණි. එම හේතුවෙන් ආයතනය මඟින් විකාශන වැඩසටහන් මෙහෙයවීම අවදානම් තත්ත්වයට පත් වී තිබුණි.	විගණනයේ නිවැරදිය.	නිරීක්ෂණය	ඉක්මනින් අලුත්වැඩියා කළ යුතුය.
(ඇ)	2004 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සංස්ථාව සතුව පැවති රු 16,980,329ක් වටිනා රැඳවුම් බදු සහතික වටිනාකම ආදායම් බදු වෙනුවෙන් කාලාවරෝදයට පෙර හිලව් කර ගැනීමට සංස්ථාව කටයුතුකර නොතිබුණි.	විගණනයේ නිවැරදිය.	නිරීක්ෂණය	රැඳවුම් බදු ආදායම හිලව් කර ගැනීමට සංස්ථාව කටයුතු කළයුතුය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සංස්ථාව 2012 වර්ෂයෙන් පසු භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීමට පෙර දිගින් දිගටම අලාභ ලබා තිබූ අතර පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීම නිසා එම අලාභ අවම කර ගැනීමට අවස්ථාව ලැබී තිබුණි. 2021 වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන ලැබීමට පෙර රු.මි. 333.5 ක් වූ අලාභය රු.මි. 345 හා ප්‍රතිපාදන ලැබීම නිසා රු.මි. 11.5 ක ලාභයක් බවට පත් වූ අතර 2022 වර්ෂයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් එම අලාභය රු.මි. 236.4 ක් විය. මේ සඳහා වෙනත් ආදායම් මාර්ග මඟින් ආදායම් වර්ධනය කර ගැනීමේ අභිලාෂයෙන් සංස්ථාවේ ගොඩනැගිලි හා ඉඩම් බදු දීමට සංස්ථාව කටයුතු කර තිබුණි. නමුත් සංස්ථාවේ ප්‍රධාන කාර්යය වන ගුවන් කාලය විකිණීම ඉහළ නැංවීම මඟින් මූලික තත්ත්වය ඉහළ නැංවීමත්,ආයතන හා පරිපාලන වියදම් පාලනය කිරීමෙන් නැවත ලාභ ලබන තත්ත්වයකට පත් කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග පිළිබඳව සංස්ථාව විසින් අවධානය යොමුකර නොතිබුණි.	ඌණ උපයෝගී ධාරිතාව උපයෝගී කරගෙන රජරට වැය බරක් නොමැති ලාභාංශ ලබාදෙන ආයතනයක් ලෙස නැගී සිටීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරමින් 2022 වර්ෂයේ නව ගොඩනැගිල්ලේ කොටසක් බදු පදනම් මත ලබාදීමට කටයුතු කර ඇත. ත්‍රිකුණාමලය, කුච්චවේලි ඉඩම් සූර්ය බල ව්‍යාපෘතියක් සඳහා යොගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. නුවරඑළිය නිවහන ඒකාබද්ධව පවත්වාගෙනයාමට කටයුතු ආරම්භ කර ඇත. වසර ගණනාවක් මුදල්ලේ ආයතනයට නොලැබී ගිය මොරටුව විශ්වවිද්‍යාලයෙන් අයවිය යුතු රුපියල් මිලියන 125ක මුදලක් ලබාගැනීමට කැබිනට් පත්‍රිකාවක් යොමු කර ඇත.	වෙනත් ආදායම් මාර්ග මඟින් ආදායම් වර්ධනය කර ගැනීමට කටයුතු කළයුතුය.
(ආ)	සංස්ථාව විසින් ලංකා පුවත් ආයතනයෙහි කොටස් මිලදී ගැනීම සඳහා ජනාධිපති අමාත්‍යාංශයේ ඉල්ලීමකට අනුව 1993 වර්ෂයේදී රු.1,000,000 ක් ආයෝජනය කර තිබුණු නමුත් 1993 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වාම කිසිදු ලාභාංශ ආදායමක් ලැබී නොතිබුණි.	විගණන විමසුම සමග එකඟ වේ.	ආයෝජන සම්බන්ධයෙන් සොයා බලා ප්‍රතිලාභ ලබාගැනීමට ක්‍රියාකළ යුතුය.
(ඇ)	2007 මැයි 11 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2007/09අනුව වයස අවුරුදු 67 සම්පූර්ණ කළ කිසිවෙකු නැවත රාජ්‍ය සේවයේ අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරකට පත්	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය.

	නොකළ යුතු වුවද සංස්ථාව විසින් දැනට වයස අවුරුදු 68 ක් හා 81ක් සම්පූර්ණ කරන ලද පුද්ගලයින් දෙදෙනෙකු පත්වීම් ලිපියක්ද නිකුත් නොකර 2010 වර්ෂයේ සිට මේ වන තෙක් සැවරුම් පදනම මත සේවයේ යොදවා තිබුණි.		
(ඇ)	2020 ජුනි 29 දින පැවති සංස්ථා මණ්ඩල රැස්වීම් අංක 03/2020 (ii) තීරණ අංක 04.03පරිදි සියලුම අලෙවි විධායකයින්ගේ මාසික ඉලක්කගත ආදායම රුපියල් මිලියන 03 දක්වා වර්ධනය විය යුතු බව සංස්ථා මණ්ඩලය තීරණය කර තිබුණ ද 2022 ඔක්තෝබර් , නොවැම්බර් මාසවල අලෙවි නිලධරයන්ගේ අලෙවි ඉලක්කය මිලියන03 ක් වී නොතිබුණි . එමෙන්ම 2022 ඔක්තෝබර් මාසයේ ලබාදුන් ඉලක්ක සම්පූර්ණ කිරීමට නිලධාරීන් 15 දෙනෙකුගෙන් 12දෙනෙකුම සමත්වී නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	සංස්ථා මණ්ඩල රැස්වීම් අංක 03/2020 (ii) තීරණ අංක 04.03පරිදි කටයුතු කළ යුතුය.
(ඉ)	2022 වර්ෂය සඳහා අයවැයගත විකුණුම් ආදායම රු.1,040,210,000 ක් වූ අතර, 2022 වර්ෂයේ තත්‍ය විකුණුම් ආදායම රු. 682,086,556 ක් විය .ඒ අනුව අයවැයගත ආදායමෙන් රු.358,123,444 ක් ළඟාකර ගැනීමට සංස්ථාවේ අලෙවි අංශය අසමත් වී තිබුණි. එම ප්‍රමාණය අයවැයගත විකුණුම් ආදායමෙන් 34 %ක් විය.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	අයවැය ගත ආදායම සපුරා ගැනීමට කටයුතු කළ යුතුය.
(ඊ)	මූල්‍ය ප්‍රකාශන අනුව 2022 වර්ෂයට පෙර ලැබිය යුතු ශේෂය රු. 163,164,250 ක් වුවද නීතිමය පියවර ගෙන තිබුණේ රු. 12,890,287 ක ශේෂය අය කර ගැනීමට පමණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	ලැබිය යුතු ශේෂ අය කර ගැනීමට කටයුතු කළයුතුය.
(උ)	ගුවන් විදුලි සංස්ථාවට නීත්‍යානුකූල අයිතියක් නොමැති භූමියක 2018 වර්ෂයේ රු. 5,830,890 ක් පිරිවැයක් දරා කපුරට සේවයට අදාළ ගොඩනැගිලි ඉදිකර තිබූ	වසර 30කට අධික කාලයක් මුදල්ලේ ගුවන්විදුලි සංස්ථාව වෙත ලබාදී තිබෙන භූමියේ මෙම ගොඩනැගිල්ල	භූමිය නීත්‍යානුකූලව පවරාගැනීමට හෝ විධිමත්ව නිරාකරණය කර ගැනීමට කටයුතු කළයුතුය.

	අතර එම භූමිය නීත්‍යානුකූලව පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිකිරීමට කටයුතු කර ඇත. පසුව පුෂ්පදාන විද්‍යාලය මගින් එම ගොඩනැගිල්ල සාදා තිබෙන ඉඩම ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අදාලව ජනමාධ්‍ය අමාත්‍යාංශය, පුෂ්පාදන විද්‍යාලය, මහනුවර ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග රැස්වීමක් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පැවැත්වූ අතර මේ පිළිබඳව තීරණයක් නොමැකිට මාස 6ක කාලයකට කල් තබන ලදී.	
(උ)	2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි II කොටසෙහි 5.1 ඡේදය ප්‍රකාරව සියලුම රජයේ ආයතන, තම ආයතනය විසින් සේවාවන් සඳහා අයකරන ගාස්තු සමාලෝචනය කර වසර තුනකට වරක් සියයට 15 ක උපරිමයකට යටත්ව සංශෝධනය කළයුතු වුවද සංස්ථා විසින් ඊට අනුකූලව කටයුතු නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළද රු.102,312,583 ක් දක්වා ගාස්තු ආදායම් ලබාගැනීමට සංස්ථාව අවධානය යොමුකර නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. 2020, 2021, 2022 වර්ෂවල ගාස්තු වැඩිකිරීමක් සිදුකර නොමැත. 2020 ආරම්භයේ ලෝකයේ ඇති වූ කොරෝනා වංසගතය හේතුවෙන් ආයතනය පවත්වාගෙන යාම විනා වාර්ෂික ගාස්තු වැඩිවීමක් හෝ විශේෂ ක්‍රියාකාරකමක් සිදුවී නොමැත. 2023 මාර්තු 31 දින දක්වාම ගාස්තු සියයට 20කින් ඉහළට ඇමීමට කටයුතු කර නොමැත.	චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය.
(එ)	ගනුදෙනුකරුවන් වැඩසටහන් වෙනුවෙන් තලින් මුදල් ගෙවූ අවස්ථාවල අදාල වැඩසටහන් නියමිත දිනට කිරීමට අපහසු වූ විට ඒ වෙනුවෙන් 2015 වර්ෂයේ සිට ලද මුදල් රු.37,402,395 ක් ගුවන් කාල ණයහිමියන් ලෙස පැවති අතර එම මුදල් සුදුසු පරිදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2022 වර්ෂයේ ඉදිරි ලැබීම් සියල්ල සඳහා ගුවන්කාල ආදායම ලබා දී ඇත.ඉතිරි මුදල් සඳහා 2023 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ.	වැඩසටහන් නොපවැත්වූ අවස්ථාවලට අදාළව ලැබී තිබූ මුදල් ආදායම බැර කිරීමට හෝ ආපසු ගෙවීමට කටයුතු කළයුතුය.
(ඒ)	හෝමාගම ප්‍රාදේශීය ලේකම්ගේ අනුමැතියෙන් ගුවන් විදුලි සම්ප්‍රේෂණාගාරයක් සැදීම සඳහා ලද අක්කර 149 රූඩ් 02 පර්චස් 22	2007 වර්ෂයෙන් පසු ගිණුම් පරීක්ෂා කර බලා වැරදි ලෙස ගිණුම් ගත කර ඇත්නම් පරීක්ෂා කර බලා	නියමිත කාර්යයෙන් බැහැරව යොදා නොගත යුතුය.

ක ඉඩම සංස්ථාවට පවරාදීම් සහතිකයේ ii උපලේඛනය ප්‍රකාරව "ඉඩම ගුවන් විදුලි සම්ප්‍රේෂණාගාරයක් සෑදීම සඳහා පමණක් පවරා දෙනු ලැබේ" යනුවෙන් සඳහන් වීම හා එම කාර්යයෙන් බැහැරව ඉඩම යොදා ගත නොහැකි බවත්, නියමිත කාර්යයෙන් බැහැරව යොදා ගතහොත් ඉඩම ආපසු භාරදිය යුතු බවට දන්වා තිබුණි. නමුත් ගුවන් විදුලි සංස්ථාව විසින් එම අරමුණෙන් බැහැරවී 2007 දෙසැම්බර් 17 දින මොරටුව විශ්ව විද්‍යාලයේ කාක්ෂණ විද්‍යා පීඨය ඉදිකිරීම සඳහා රු.25,000,000ක අත්තිකාරමක් ලබාගෙන තිබුණි.		ඒ පිළිබඳව 2023 වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

3.3 වෙනත් සංවිධානවලට මුදාහළ සම්පත්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2009 ත් 2019 ත් අතර කාලය තුලදී සංස්ථා සේවයෙන් වෙනත් ආයතන වෙත මුදාහළ නිලධාරීන්ගෙන් සංස්ථාවට ලැබිය යුතු රු.2,236,895 ක් අයකර ගැනීමට 2023 මැයි 31 දින විටත් කටයුතු කර නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	වෙනත් ආයතන වෙත මුදාහළ නිලධාරීන්ගෙන් සංස්ථාවට ලැබිය යුතු මුදල අයකර ගැනීමට කටයුතු කළයුතුය.

3.4 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) සංස්ථාවේ වැඩ පාලක තනතුරේ සේවයේ යෙදී සිට 2021 දෙසැම්බර් 10 දින වයස අවුරුදු 60සම්පූර්ණ වීම හේතුවෙන් විශ්‍රාම ගිය නිලධාරියකු 2021 දෙසැම්බර් 13 සිට නැවතත් ඔහුට පැවරුම් පදනම් මත සේවයට බඳවා ගැනීමට සංස්ථාව කටයුතු කර තිබුණි 2022 මාර්තු 14 දින පැවති සංස්ථා මණ්ඩල රැස්වීමේදී මෙම නිලධාරියාගේ සේවය පැවරුම් පදනම් මත ලබා ගැනීමට	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	සේවය පැවරුම් පදනම් මත ලබා ගැනීම නීතිමය විධිවිධාන අනුව කළ යුතුය.

	භාණ්ඩාගාර නියෝජිතවරිය ප්‍රතිපත්තිමය වශයෙන් එකඟ නොවී තිබූ අතර, ජනමාධ්‍ය අමාත්‍යාංශයේ නිරීක්ෂකවරියද ඒ සඳහා එකඟ වී නොතිබුණි. එසේ වුවද සංස්ථා මණ්ඩලය විසින් මෙම නිලධාරියාගේ සේවය පැවරුම් පදනම් මත ලබා ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි.			
(ආ)	සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය තුළ අධ්‍යක්ෂ (අලෙවි) තනතුරු 01 ක් පමණක් ඇතුළත්ව තිබුණ ද 2021 , ජුනි 01 දින සිට 2022 මැයි 31 දක්වා කාලය තුල අධ්‍යක්ෂ (අලෙවි) තනතුරෙහි ස්ථිර පදනම් මත හා කොන්ත්‍රාත් පදනම් මත නිලධාරීන් දෙදෙනෙකු අනුමත කාර්ය මණ්ඩලයට පටහැනිව සංස්ථාව විසින් සේවයේ යොදවා තිබුණි .ඒ අනුව සංස්ථාව විසින් අනුමත එක් තනතුරක් වෙනුවෙන් නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් එම කාලය තුළදී ගෙවා තිබූ මුදල රු.3,872,920 ක් විය. තවද අධ්‍යක්ෂ (අලෙවි) ලෙස කටයුතු කළ නිලධාරියා අලෙවි අංශයේ රාජකාරි වලින් 2021 ජූනි 01 දින සිට 2021 ජුනි 27 දක්වා නිදහස් කර තිබුණු කාලය සඳහා වෙනත් රාජකාරි පැවරීමක් ද නිකුත් කිරීමට සංස්ථාව කටයුතු කර නොතිබුණද ඔහුගේ ජූනි මස වැටුප ලෙස රු.187 505ක් ගෙවා තිබුණි.	විගණනයේ නිවැරදිය.	නිරීක්ෂණය	අනුමත තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය.
(ඇ)	සංස්ථාවේ කාර්ය මණ්ඩලය තුල තෘතීය මට්ටම, ද්විතීය මට්ටම සහ ප්‍රාථමික මට්ටම් තනතුරු සඳහා පිළිවෙලින් සේවකයින් 57 ක්, 95 ක් සහ 61 ක් ලෙස අතිරික්ත සේවකයින් සංඛ්‍යාවක් සේවයේ යොදවා ගෙන තිබුණි.	විගණනයේ නිවැරදිය.	නිරීක්ෂණය	අනුමත තනතුරු සඳහා පමණක් බඳවා ගැනීම් සිදු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික වාර්තාව

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන දින 10 ක ප්‍රමාදයක් සහිතව 2023 මාර්තු 10 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු අතර කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව මුද්‍රණයේ පවතින අතර, මැය මස 31 දිනට ඉදිරිපත් කිරීමට හැකියාවක් පවතී.	මෙහෙයුම් අත්පොතෙහි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතුය.

4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2022 නොවැම්බර් 25 දින විගණනය වෙත ඉදිරිපත් කළ ක්‍රියාකාරී සැලැස්මේ 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය සැලකීමේදී ක්‍රියාකාරී සැලැස්ම තුළ අංශ 22 ක් ඇතුළත් වී තිබුණු අතර අංශ 14 ක ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබුණි. තවද අනෙකුත් අංශයේ ආදායම් වර්ධනය කර ගැනීමේ අරමුණින් හඳුන්වා දුන් වැඩසටහන් 17 ක් පවත්වා නොතිබුණි.	විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.	ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඉදිරිපත් කළ යුතුය.

විගණකාධිපති චාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

(අ) 2023 වර්ෂයේදී ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර වත්කම් ප්‍රත්‍යාගණනයක් කර ඵලදායී ජීවිත කාලය නැවත සමාලෝචනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) 2023 වර්ෂයේදී පොලී වලින් ලැබෙන මුදල් ප්‍රවාහය වෙනම අනාවරණය කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) විගණන නිරීක්ෂණය නිවැරදිය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. අත්තිකාරම් ලෙජරයේ දෙසැම්බර් 31 දිනට ලබාගත් ශේෂ වැරදීමකින් අත්තිකාරම් ලේඛනයේ ජනවාරි මසට ගිණුම්ගතවීම නිසා මෙම වරද සිදුවී ඇත.

(ආ) අත්තිකාරම් මුදල් ගණනයේදී දෙසැම්බර් මස රු. 600,000 ක් අත්තිකාරම් ගිණුමෙන් ආදායමට ලබා ගෙන නොමැත. එම වරද 2023 පෙබරවාරි මස නිවැරදි කර ඇත. ඉතිරි වෙනස සඳහා බලපා ඇත්තේ වැට් බදු මුදලය.

කුලී ආදායමෙන් 15%ක බදු මුදලක් වෙන් කර ඇති බැවින් රු. 978,261 වෙනසක් ඇත. බදු කුලී සමග බදු මුදලක් ගිවිසුමේ ගණනය කර නොමැති නිසා මෙලෙස ගැලපීම් කිරීමට සිදු විය.

(ඇ) අමාත්‍ය මණ්ඩල සංදේශ අනුව ත්‍රිකුණාමල, කුච්චවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ඉඩම සඳහා ගෙවිය යුතු බදුකුලිය ගිණුම් ගත කර නොමැත. එය ගිණුම්වලින් කපා හැරීමට කටයුතු කර තිබේ.

(ඈ) විගණන නිරීක්ෂණය නිවැරදිය. 2023 වර්ෂයේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඉ) 2021 වර්ෂයේ ණය ගැනි උපලේඛනයේ සිදු වූ වරදකි. 2022 වර්ෂයේදී ඉදිරිපත් කළ ණයගැනි උපලේඛනය නිවැරදිය.

(ඊ) විගණන නිරීක්ෂණය නිවැරදිය. 2023 වර්ෂයේ සිට සියලු ණය ගැනියන් සඳහා අඩමාණ ණය වෙන් කරනු ලැබේ.

(උ) විගණන නිරීක්ෂණය නිවැරදිය. මූල්‍ය තත්ත්වය අයහපත් නිසා ගෙවීමට නොහැකි විය.

(ඌ) 2022 ගිණුම් වර්ෂයට අදාළව 2023-01-10 වන විට ලැබී තිබූ ගෙවිය යුතු සියලු වියදම් උපචිත වියදම් ලෙස ගිණුම් ගත කොට ඇත. ඒ අනුව රුපියල් 322,659,847 මුදලක් 2022-12-31 වන දිනට උපචිත වියදම් ලෙස ගිණුමෙහි දක්වා ඇත. විගණනයෙහි පෙන්වා දී ඇති ගෙවීම් වවුචර් මුදල් අංශයට ලැබී ඇත්තේ ඉහත කාලපරිච්ඡේදයට පසුව වේ.

(එ) විගණනය පෙන්වා දී ඇති කරුණු පිළිබඳව පරීක්ෂා කර 2023 වර්ෂයේ දී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඒ) විගණන නිරීක්ෂණය නිවැරදිය.

(ඔ) විගණන නිරීක්ෂණය නිවැරදිය. සංස්ථාව විසින් අභියාවනයක් ඉදිරිපත් කර ඇති බැවින් වෙන් කිරීම් සිදුකර නොමැත.

(ඕ) වවුචර අංක pay -1388-12 සහ අංක pay-1274-12 යටතේ විගණනයේ පෙන්වා දී ඇති කරුණු නිවැරදිය. රු. 658, 350 ක වරිපනම් සඳහා ගෙවූ වියදම 2023 වර්ෂයේ පළමු කාර්තුවට අදාළව වියදමකි. එම වියදම 2022 වර්ෂයට අදාළ නොවේ. ඒ අනුව මෙම ගිණුම් ගත කිරීම් සියල්ල නිවැරදිව ගිණුම් ගත කර ඇත.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

(අ) මෙම ණයගැති හා ණයහිමි ශේෂ පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ආ) විගණන නිරීක්ෂණය නිවැරදිය. 2023 වර්ෂයේ ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

(ඇ) විගණන නිරීක්ෂණය නිවැරදිය විගණන හා කළමනාකරණ තීරණ වලට අනුව කමිටුවක් පත්කොට මෙම ශේෂ සම්බන්ධ වාර්තාවක් කැඳවා ඇත. එහි තීරණය අනුව මෙම ශේෂය 2023 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු කිරීමට යොදා ඇත.

1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

(අ) විගණන නිරීක්ෂණය නිවැරදිය.

(ආ) විගණන නිරීක්ෂණය නිවැරදිය.

(ඇ) විගණන නිරීක්ෂණය නිවැරදිය.

(ඈ) විගණන නිරීක්ෂණය නිවැරදිය.

1.6.1 ලැබිය යුතු මුදල්

(අ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. 1974 වර්ෂයට පෙර සිට පැවත එන ණයගැති ශේෂයන් අයකර ගත නොහැක. ශේෂ කපා හැරීමට කටයුතු කරන ලෙස රාජ්‍ය ව්‍යාපාර පොදු කාරක සභාවෙන් උපදෙස් ලබා දී ඇත. ඒ අනුව පරිදි මුදල් අංශය, අලෙවි අංශය හා අභ්‍යන්තර විගණක අංශය කමිටුවක් පත් කර කපා හැරියේ ලේඛනය සමබන්ධයෙන් පරීක්ෂා කර සංස්ථා මණ්ඩලයට ඉදිරිපත් කිරීමට කටයුතු යොදා ඇත.

(ආ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. මුදල් අයකරගැනීම සඳහා කටයුතු කරන ලෙස සංස්ථා මණ්ඩල තීරණයක් ලබාදී ඇත.

(ඇ) (ඉ) (ඊ) (උ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය

1.6.2 විගණනයේ නිරීක්ෂණය නිවැරදිය

1.6.3 (අ) රු. 5300 ක අත්තිකාරම් මුදල 2023 මුල් කාර්තුවේ පියවීමට කටයුතු කොට ඇත. අත්තිකාරම් පියවීමේදී වක්‍රෙල්ඛ අංක ප්‍රකාරව අදාළ කාලපරිච්ඡේදය තුළ පියවීමට නොහැකි වනුයේ එම කාර්යයේ ස්වභාවය හා ලංකාව පුරා විසිරී ඇති ප්‍රාදේශීය සේවා හා විකාශනාගාර සඳහා නිකුත් කරන අත්තිකාරම් ප්‍රධාන කාර්යයාලය තුළින් පමණක් සිදු කිරීම නිසාය.

(ආ) කාර්යයේ ස්වභාවය අනුව සීමාව ඉක්මවා අත්තිකාරම් ලබාදීමට සිදුවන අවස්ථා පැනනගින අතර ඒ සඳහා සභාපති හා අධ්‍යක්ෂ ජනරාල්ගේ විශේෂ අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත.

(ඇ) ගුවන් විදුලි නාලිකා 13 ක් පැවතීම, ප්‍රාදේශීය විකාශනාගාර ක් 11 පැවතීම, ප්‍රාදේශීය සේවා 07 ක් පැවතීම මත අත්තිකාරම් නිකුත් කිරීමට හැක්කේ විධායක ශ්‍රේණියේ නිලධාරීන්ට පමණක් වීම නිසා සහ කාර්යයන්හි ස්වභාවය අනුව අත්තිකාරම් නිකුත් කළ හැකි නිලධාරීන් සීමිත බව නිසා මෙලස අත්තිකාරම් නිකුත් කිරීමට සිදුවී ඇත. මෙලෙස අත්තිකාරම් සිදු කිරීම සිදු නොකලහොත් ආයතනයේ මෙහෙයුම් කාර්යයන්ට බලපෑමක් සිදුවේ. නිකුත් කළ සියලු අත්තිකාරම් පියවා ගැනීමට නිවැරදි ගිණුම්කරණ පාලන ක්‍රමවේදයක් අනුගමනය කිරීමට කටයුතු යොදා ඇත.

(ඈ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය

1.7 නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව

(අ) නිවැරදි කිරීමට කටයුතු යොදා ඇත.

(ii) සියලුම බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර විද්‍යුත් තැපෑල මගින් ඉදිරිපත් කරන ලදි. මෘදු පිටපත් සමග ඉදිරිපත් කරමි.

(ආ) විගණන නිරීක්ෂණ නිවැරදිය.

(ඇ) විගණන නිරීක්ෂණ නිවැරදිය.

(ඈ) විගණන නිරීක්ෂණ නිවැරදිය. 2023 වර්ෂයේ සිට ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන යාමට සැලසුම් කර ඇත.

(ඉ) ගබඩා සඳහා වාර්ෂික වත්කම් සත්‍යාපනයක් සිදු කර විගණනය සඳහා ඉදිරිපත් කර ඇත. ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2022 වාර්ෂික සත්‍යාපනය 60% ක පමණ ප්‍රමාණයක් අවසන් කර ඇත. ප්‍රමාණාත්මක වශයෙන් බාහිර සේවාවන් හා විකාශනාගාර 17 සහ ප්‍රධාන කාර්යාලයෙන් උප ඒකකයන් 58ක ස්ථාවර වත්කම් පරීක්ෂාව සිදු කල යුතුව ඇත. මේ සඳහා වෙනත් අංශවල රාජකාරී කරන නිලධාරීන් යොදා ගනු ලබන අතර සමීක්ෂණ කටයුතු සඳහා සැලකිය යුතු කාලයක් ගතවීම මෙහි සීමාකාරී සාධකයක් ලෙස හඳුනාගෙන ඇත.

(ඊ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

(උ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

1.8 මුදල් කළමනාකරණය

(අ) මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමෙහි පවතින මුදල් සංස්ථාවට හදිසි මිලදී ගැනීම් සඳහා මෙම මුදල් අවශ්‍ය වන බැවින් මෙම මුදල ස්ථාවර තැන්පතුවක නොදමන ලදි. විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. ප්‍රධාන ජංගම ගිණුමෙහි (2323265) හි බැංකු අයිරා පොලිය ගෙවීමට සිදුවීම නේෂන්ස් ට්‍රස්ට් බැංකුවේ ජංගම ගිණුමේ මුදල 2023 අප්‍රේල් මස මහජන බැංකුවේ ඉතිරි කිරීමේ ගිණුමට මාරු කරන ලදී.

(ආ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. රු. 841,819.00 කොන්ත්‍රාත් සේවක වැටුප් ලේඛනය ලබාදිය හැක.

3.1 හඳුනාගත් පාඩු

(අ) (i) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. සංස්ථාවේ පැවති මුදල් තත්ත්වය පදනම් කර ගනිමින් රාජ්‍ය ආයතනයක් වන ලේක්හවුස් ආයතනයේ Sunday observe මගින් ඉරිදි පුවත්පතේ මෙම දැන්වීම් වලට කිරීමට කටයුතු කරන ලදි. මෙම කටයුත්තක් ද සිදු කරනු ලැබුවේ ණය පදනම් මතය. මීට අමතරව සංස්ථා වෙබ් අඩවිය තුල මෙම දැන්වීම් එල කරන ලදි.

(ii) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

(iii) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

(ආ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

(ඇ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

3.2 (අ) ඌණ උපයෝගී වත්කම් උපයෝගී කරගෙන රජරට වැය බරක් නොමැති ලාභාංශ ලබාදෙන ආයතනයක් ලෙස නැගී සිටීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරමින් 2022 වර්ෂයේ නව ගොඩනැගිල්ලේ කොටසක් බදු පදනම මත ලබාදීමට කටයුත්ත කර ඇත. ත්‍රිකුණාමලය, කුච්චවේලි ඉඩම සූර්ය බල ව්‍යාපෘතියක් සඳහා යොගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කර ඇත. නුවරඑළිය නිවහන ඒකාබද්ධව පවත්වාගෙන යාමට කටයුතු ආරම්භ කර ඇත. වසර ගණනාවක් මුලුල්ලේ ආයතනයට නොලැබී ගිය මොරටුව විශ්වවිද්‍යාලයෙන් අයවිය යුතු රුපියල් මිලියන 125ක මුදලක් ලබාගැනීමට කැබිනට් පත්‍රිකාවක් යොමු කර ඇත.

(ආ) විගණන විමසුම සමග එකඟ වේ.

(ඇ), (ඈ), (ඉ), (ඊ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

(උ) වසර 30කට අධික කාලයක් මුළුල්ලේ ගුවන්විදුලි සංස්ථාව වෙත ලබාදී තිබෙන භූමියේ මෙම ගොඩනැගිල්ල ඉදිකිරීමට කටයුතු කර ඇත. පසුව පුෂ්පදාන විද්‍යාලය මගින් එම ගොඩනැගිල්ල සාදා තිබෙන ඉඩම ලබාදෙන ලෙස කරන ලද ඉල්ලීමට අදාලව ජනමාධ්‍ය අමාත්‍යාංශය, පුෂ්පදාන විද්‍යාලය, මහනුවර ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සමග රැස්වීමක් ජනමාධ්‍ය අමාත්‍යාංශයේ පැවැත්වූ අතර මේ පිළිබඳව තීරණයක් නොමැතිව මාස 6ක කාලයකට කල් තබන ලදී.

(ඌ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. 2020, 2021, 2022 වර්ෂවල ගාස්තු වැඩිකිරීමක් සිදුකර නොමැත. 2020 ආරම්භයේ ලෝකයේ ඇති වූ කොරෝනා වංසගතය හේතුවෙන් ආයතනය පවත්වාගෙන යාම විනා වාර්ෂික ගාස්තු වැඩිවීමක් හෝ විශේෂ ක්‍රියාකාරකමක් සිදුවී නොමැත. 2023 මාර්තු 31 දින දක්වාම ගාස්තු සියයට 20කින් ඉහළට දැමීමට කටයුතු කර නොමැත.

(එ) 2022 වර්ෂයේ ඉදිරි ලැබීම් සියල්ල සඳහා ගුවන්කාල ආදායම ලබා දී ඇත. ඉතිරි මුදල් සඳහා 2023 වර්ෂයේදී කටයුතු කරනු ලැබේ.

(ඒ) 2007 වර්ෂයෙන් පසු ගිණුම් පරීක්ෂා කර බලා වැරදි ලෙස ගිණුම් ගත කර ඇත්නම් පරීක්ෂා කර බලා ඒ පිළිබඳව 2023 වර්ෂයේදී ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ.

3.3 විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

3.4 (අ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

(ආ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

(ඇ) විගණනයේ නිරීක්ෂණය නිවැරදිය.

4.1 විගණනයේ නිරීක්ෂණය නිවැරදිය. 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව මුද්‍රණයේ පවතින අතර, මැයි මස 31 දිනට ඉදිරිපත් කිරීමට හැකියාවක් පවතී.

4.2 විගණනයේ නිරීක්ෂණය නිවැරදිය